


# වැලිගම නගර සංවර්ධන සැලැස්ම

[2019 - 2030]



නාගරික සංවර්ධන අධිකාරිය

# වැලිගම නගර සංවර්ධන සැලැස්ම
# 2019 - 2030

## වෙළුම I

නාගරික සංවර්ධන අධිකාරිය
සෙත්සිරිපාය
බත්තරමුල්ල
2019

# ලේඛන තොරතුරු

**වාර්තාවේ මාතෘකාව** : **වැලිගම නගර සංවර්ධන සැලැස්ම**

**සැලසුම් කළාප මායිම් (ප්‍රකාශයට පත් කරන ලද)** : **වැලිගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය**

**ගැසට් අංකය** : **......................................**

**පාර්ශවකරුවන්** **වැලිගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව, වැලිගම නගරය වෙත පැමිණෙන ජනතාව හා අදාල ආයතන**

**ඉදිරිපත් කරන ලද දිනය** : **2017.12.19**

**ලේඛනයේ තත්ත්වය** : **අවසාන සැලැස්ම**

**ලේඛන ඉදිරිපත් කිරීමේ තොරතුරු**

| **පිටපත් අංකය** | **විස්තර** | **ඉදිරිපත් කල දිනය** | **නිකුත් කිරීම සඳහා අනුමැතිය** |
|---|---|---|---|
| **1** | කෙටුම්පත | 2018.09.25 | |
| **2** | අවසාන | 2019.03.30 | |

මෙම වාර්තාව, බලයලත් පාර්ශවයන් විසින් නිකුත් කරනු ලබන අතර වාර්තාවේ සඳහන් අරමුණු සඳහා පමණක් භාවිතා කල යුතුය. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයන් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයක් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් යොදාගෙන ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් අධිකාරිය වගකියනු නොලැබේ. එමෙන්ම මෙම වාර්තාවේ සඳහන් දත්ත හෝ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබා ගැනීම හෝ වෙනත් අරමුණක් සඳහා යොදා ගැනීම මඟින් ඇතිවන බලපෑම් සම්බන්ධයෙන්ද අධිකාරිය වගකියනු නොලැබේ. මෙම වාර්තාව තුළ රහසිගත තොරතුරු ඇතුළත් වන අතර එය බුද්ධිමය දේපලක් වේ. බලයලත් පාර්ශවයේ අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම සපුරා තහනම් වේ.

**වැලිගම නගර සංවර්ධන සැලැස්ම (2019 – 2030) - පළමු වෙළුම**

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව (2019)

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ප්‍රකාශනය මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

නාගරික සංවර්ධන අධිකාරිය
06 වන, 07 වන හා 09 වන මහල්, "සෙත්සිරිපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
**වෙබ් අඩවිය** - www.uda.gov.lk
**ඊ මේල්** - info@uda.gov.lk
**දුරකථන අංකය** - +94112873637/ 0412230413
**ප්‍රකාශනය** - 2019

වැලිගම නගර සංවර්ධන සැලැස්ම (2019 - 2030), ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, එය පළමු වෙළුම හා දෙවන වෙළුම වශයෙන් ප්‍රකාශනයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර, එහි පළමු වෙළුමේ පළමුවන කොටස මගින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම් අධ්‍යනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර, එහි දෙවන කොටස මගින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපාය මාර්ග සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත.

සංවර්ධන සැලැස්මෙහි දෙවන වෙළුම වෙනත් ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර, එහි 2019 -2030 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන කලාපීකරණ රෙගුලාසි සහ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

වැලිගම නගර සංවර්ධන සැලැස්ම (2019 - 2030) නාගරික සංවර්ධන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය මගින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟපෙන්වීම පෙරදැරි කරගෙන සිදු කර ඇත.

***අධීක්ෂණ කටයුතු***

ආචාර්ය ජගත් මුණසිංහ ***සභාපති - නා.සං.අ.***, ඉංජිනේරු එස්.එස්.පී.රත්නායක ***අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී. චන්ද්‍රදාස ***අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මයා **අධ්‍යක්ෂ** ***(දකුණු පළාත) - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න ***අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය) - නා.සං.අ.***

# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් දකුණු කලාපයේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලැස්ම මනා දැක්මක් ඔස්සේ සකස් කර ඇති අතර, ප්‍රදේශයේ ජනතාවට පමණක් නොව සමස්ථ ශ්‍රී ලාංකිකයින්ටම ප්‍රයෝජනවත් වන පරිදි පවතින සම්පත් විවිධ උපාය මාර්ග ඔස්සේ භෞතික ආර්ථික, සමාජයීය, හා පාරිසරික ප්‍රතිලාභ උපරිම අයුරින් ළඟාකර ගැනීමට හැකිවන සේ සකස් කිරීමට විශේෂ අවධානය යොමුකර තිබේ.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් වැලිගම සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

**පාඨලී චම්පික රණවක**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

"සුහුරුපාය"
බත්තරමුල්ල.
2019............. දින

# ගරු සභාපතිතුමාගේ පෙරවදන



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. වැලිගම නගර සභාව සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. වැලිගම නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වැලිගම නගර සභා බල ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන වැලිගම නගර සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් වැලිගම නගර සභා බල ප්‍රදේශය, "දකුණු ලක පිබිදෙන සමුද්‍රවංකීය සංචාරක පාරාදීසය" බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ................ දින

# වැලිගම නගර සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය



නාගරික සංවර්ධන අධිකාරිය මගින් වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම පිළිබඳව මාගේ කෘතඥතාවය ප්‍රථමයෙන් ප්‍රකාශ කර සිටින අතර, එම සැලැස්ම තුලින් වැලිගම නගරයට අනන්‍ය වූ ලක්ෂණ ආරක්ෂා වන පරිදි, විශේෂයෙන් පාරිසරික සම්පත් රැකගැනීමට ගෙන ඇති උත්සාහයට සහ එතුලින් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි කටයුතු කර තිබීම ප්‍රශංසනීය වේ.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පොදු මහජනතාව නියෝජනය කරමින් අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස් පිළිබඳවද අවධානය යොමුකර තිබීම මා අගය කරන අතර, සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් 2030 වර්ෂය වනවිට වැලිගම නගරය *දකුණු ලක පිබිදෙන සංචාරක පාරාදීසය* බවට පත් වේවායි මා ප්‍රාර්ථනා කරමි.

**රෙහාන් විජේරත්න ජයවික්‍රම**
සභාපති
නගර සභාව
වැලිගම.

2019.03.30 දින

# ස්තුතිය

වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය මගින් සිදුකරන ලද ව්‍යාපෘතියකි. මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී උපරිම සහයෝගය ලබාදුන් ගරු මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාටත්, එම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියළුම කාර්ය මණ්ඩලයටත් මෙම සැලැස්ම සාර්ථක කර ගැනීමට විවිධාකාරයෙන් දක්වන ලද සහයෝගය වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

වැලිගම නගර සභාවේ ගරු සභාපති රෙහාන් ජයවික්‍රම මහතා ඇතුළු නගර සභාවේ කාර්ය මණ්ඩලය, වැලිගම ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල සියළුම නිලධාරීන් විසින් ද මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී ලබාදුන් සහයෝගය ස්තුති පූර්වකව සිහිකරමි.

තවද, මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා තම කාලය හා විශේෂඥ දැනුම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතාට හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර, *අධ්‍යක්ෂ ජනරාල්* ඉංජිනේරු එස්.එස්.පී.රත්නායක මහතාට, *අතිරේක අධ්‍යක්ෂ ජනරාල්* නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී. චන්ද්‍රදාස මහතාට, *නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්* නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග මහතාට, අධ්‍යක්ෂ (භූගෝලීය තොරතුරු පද්ධතිය) සේනානි සෝමසේකර මහත්මියට, අධ්‍යක්ෂ (භූ දර්ශන හා කළමනාකරණ) චාන්දනා කලුපහන මහත්මියට, *සංවර්ධන සැලසුම් අංශයේ අධ්‍යක්ෂ* නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න මහතාට සහ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර මහතාටද, සංවර්ධන සැලැස්ම සම්පූර්ණ වන තුරු ඒ සඳහා නිරන්තර සහයෝගය ලබාදුන් මෙම අධිකාරියේ අධ්‍යක්ෂ (දකුණු පළාත) නගර නිර්මාණ ශිල්පී කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මහතාට ද ලබාදුන් නොමඳ සහයෝගය වෙනුවෙන් මාගේ විශේෂ කෘතඥතාවය පිරිනැමේ.

එසේම, මෙම සංවර්ධන සැලැස්ම සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය ලබාදුන් සංවර්ධන සැලසුම් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය, භූ දර්ශන හා කළමනාකරණ අංශය ඇතුළු අප වෙත සහාය දැක්වූ සියළුම නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන්ට ද, මෙම සැලැස්ම සකස් කිරීම සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් මාතර දිස්ත්‍රික් කාර්යාලයේ සියළුම නිලධාරීන්හට ද මාගේ විශේෂ ස්තුතිය පිරිනැමේ.

කේ.ජී. කළ්‍යානි ඉන්දිකා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්),
නාගරික සංවර්ධන අධිකාරිය,
මාතර දිස්ත්‍රික් කාර්යාලය.

**පිදුම...**

**වර්තමාන හා අනාගත ගැටළු වලට විසඳුම් සෙවීම හා විධිමත් නිර්මිත පරිසරයක් නිර්මාණය කිරිම උදෙසා නන් අයුරින් දායකත්වය දුන් ඔබ සැමට**

# සංවර්ධන සැලැස්ම

## පරිච්ඡේද


| | | |
|---|---|---|
| ලේඛන තොරතුරු | | i |
| ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය | | iii |
| ගරු සභාපතිතුමාගේ පෙරවදන | | iv |
| වැලිගම නගර සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය | | v |
| ස්තුතිය | | vi |
| පිදුම | | vii |
| සිතියම් ලේඛණය | | x |
| ඡායාරූප ලේඛණය | | xi |
| රූප සටහන් ලේඛණය | | xii |
| ප්‍රස්ථාර ලේඛණය | | xii |
| වගු ලේඛනය | | xiii |
| | **පළමු කොටස** | |
| 1.0 | හැඳින්වීම | 1 |
| 1.1 | සංවර්ධන සැලස්ම සැකසීමේ පසුබිම | 1 |
| 1.2 | සැලසුම් කණ්ඩායම | 2 |
| 1.3 | විෂය පථය | 3 |
| 1.4 | සැලසුම් ක්‍රියාවලිය | 5 |
| 2.0 | මූලික අධ්‍යයනය | 7 |
| 2.1 | අධ්‍යයන කලාපය | 7 |
| 2.2 | සැලසුම් සන්දර්භය හා වර්තමාන තත්ත්වය | 7 |
| 2.3 | සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම | 22 |
| 3.0 | සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය | 24 |
| | **දෙවන කොටස** | |
| ඇමතිතුමාගේ අනුමැතිය | | 33 |
| ආණ්ඩුවේ නිවේදනය | | 34 |
| 4.0 | සංවර්ධන සැලසුම් රාමුව | 35 |
| 4.1 | දැක්ම | 35 |
| 4.2 | දැක්මේ ප්‍රකාශය | 35 |
| 4.3 | අරමුණු | 37 |
| 4.4 | පරමාර්ථ | 37 |
| 5.0 | ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය | 38 |

6.0 සංවර්ධන සැලැස්ම 72
6.1 සංකල්පිත සැලැස්ම 72
6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 76
6.3 භෞතීය හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්ම 81
6.3.1. යෝජිත සේවා සැපයුම් සැලසුම් 81
6.3.2 සෞඛ්‍ය පහසුකම් සැලැස්ම 84
6.3.3 අධ්‍යාපන පහසුකම් සැලැස්ම 85
6.3.4 යෝජිත ප්‍රවාහන සැලසුම 87
6.3.5 යෝජිත ජල සැපයුම් සැලසුම 94
6.3.6 යෝජිත විදුලි සහ දත්ත රැහැන් සැලසුම 96
6.3.7 කාණු හා මලාපවාහන සැලසුම 98
6.3.8 අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම 101
6.4 ආර්ථික සංවර්ධන උපක්‍රම 103
6.4.1 ආර්ථික සැලැස්ම. 104
6.4.2 සංචාරක සැලැස්ම. 108
6.5 තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම. 111
6.5.1 සංරක්ෂණ ප්‍රදේශ සැලස්ම - තෙත්බිම් 111
6.5.1.1 වැලිගම නගර සභා බල ප්‍රදේශයෙහි තෙත් බිම් වර්ගීකරණය 111
6.5.1.2 තෙත් බිම් කලාපීකරණය 111
6.5.1.3 තෙත් බිම් කලාප සඳහා අනුමත භාවිතයන් 112
6.5.2 භූ දර්ශණ කළමනාකරණ සැලැස්ම 2019 - 2030 114
6.5.3 ආපදා අවම කිරීමේ සැලැස්ම 2019 – 2030 114
6.5.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 2019 - 2030 117
6.6 සංස්කෘතිය හා උරුමයන් කළමනාකරණය කිරිමේ උපක්‍රම 122
6.7 ක්‍රියාත්මක කිරිමේ උපක්‍රම 122
6.7.1. උපාය මාර්ගික ව්‍යාපෘති 125
6.7.2 වගකිව යුතු ආයතනික රාමුව 161

ඇමුණුම්

ඇමුණුම 01 163
ඇමුණුම 02 164
ඇමුණුම 03 168
ඇමුණුම 04 171
ඇමුණුම 05 172

**සිතියම් ලේඛනය**


සිතියම් අංක 01 : වැලිගම නගර සභා බල ප්‍රදේශය 4

සිතියම් අංක 02 : දක්ෂිණ කලාපීය භෞතික සැලැස්ම : යෝජිත ජනාවාස ව්‍යුහ සැලැස්ම මාතර දිස්ත්‍රික්කය 9

සිතියම් අංක 03 : දක්ෂිණ කලාපීය භෞතික සැලැස්ම : පවත්නා නාගරික ධූරාවලිය - දක්ෂිණ කලාපය 10

සිතියම් අංක 04 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පාරිසරික සංවේදී ප්‍රදේශ 2018 21

සිතියම් අංක 05 : පරිපාලන මායිම් 23

සිතියම් අංක 06 : වැලිගම නගරයේ ස්වාභාවික පිහිටීම 39

සිතියම් අංක 07 : සංචාරක ගමන් මාර්ග 41

සිතියම් අංක 08 : සංවර්ධනයට යොදාගත හැකි රජයේ ඉඩම්වල පිහිටීම 44

සිතියම් අංක 09 : ජාතික භෞතික ව්‍යුහසැලැස්ම 2050 49

සිතියම් අංක 10 : නවාතැන් පහසුකම් වල පිහිටීම 2017 50

සිතියම් අංක 11 : පවත්නා මාර්ග ජාලය 64

සිතියම් අංක 12 : ගංවතුරට ලක්වන ප්‍රදේශ 67

සිතියම් අංක 13 : කප්පරතොට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 69

සිතියම් අංක 14 : කර්මාන්තපුරවල පිහිටීම 71

සිතියම් අංක 15 : සංකල්පිත සැලැස්ම 75

සිතියම් අංක 16 : යෝජිත භූමි පරිහරන රටාව 78

සිතියම් අංක 17 : යෝජිත නිවාස ඝනත්වය 83

සිතියම් අංක 18 : අධ්‍යාපන සේවා පහසුකම් ව්‍යාප්තිය 86

සිතියම් අංක 19 : යෝජිත මාර්ග හා ගමනාගමන සැලැස්ම 88

සිතියම් අංක 20 : යෝජිත ජල සැපයුම 95

සිතියම් අංක 21 : විදුලි ජාල උපපොල පිහිටීම 97

සිතියම් අංක 22 : යෝජිත ජලාපවාහන පද්ධතිය 99

සිතියම් අංක 23 : තෙත් බිම් කලාපීකරණ සැලැස්ම - 2030 113

සිතියම් අංක 24 : ආපදාවට ලක්වූ ප්‍රදේශ - 2018 116

සිතියම් අංක 25 : යෝජිත පොදු එලිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 121

සිතියම් අංක 26 : කළමනාකරණය කිරිමට යෝජිත පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි 123

සිතියම් අංක 27 : යෝජිත සංවර්ධන ව්‍යාපෘති 124

**ඡායාරූප ලේඛණය**


ඡායාරූප 01 : අග්‍රබෝධි විහාරය 11

ඡායාරූප 02 : කුෂ්ඨරාජගල 11

ඡායාරූප 03 : මෙතෝදිස්ත දේවස්ථානය 12

ඡායාරූප 04 : තිරුවැල කෝවිල 12

ඡායාරූප 05 : යාංඕඩය ඇළ 25

ඡායාරූප 06 : අග්‍රබෝධි ඇළ 25

ඡායාරූප 07 : සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් භූමිය 26

ඡායාරූප 08. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමිය 26

ඡායාරූප 09. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය 27

ඡායාරූප 10. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය 27

ඡායාරූප 11. කප්පරතොට කලපුව 28

ඡායාරූප 12. ඝන අපද්‍රව්‍ය බැහැර කල භූමිය 29

ඡායාරූප 13. හෙට්ටිවීදිය 29

ඡායාරූප 14 : පැළැන මුහුදු තීරය 40

ඡායාරූප 15 : ප්‍රධාන සංචාරක හෝටල් 43

ඡායාරූප 16 : වැලිගම වෙරළ තීරය 46

ඡායාරූප 17 : පැළැන වෙරළ තීරය 47

ඡායාරූප 18 : ස්වභාවික ආකර්ශනයක් සහිත ජෛව විවිධත්වයෙන් යුත් ස්ථාන 51

ඡායාරූප 19 : නිල් තල්මසුන් නැරඹීම 52

ඡායාරූප 20 : වැලිගම නගරයට ආසන්න වෙරළ තීර 53

ඡායාරූප 21 : මිරිස්ස ධීවර වරාය 56

ඡායාරූප 22 : කප්පරතොට ධීවර නැංගුරම් පොල 57

ඡායාරූප 23 : වැලිගම වෙරළ තීරයේ ඉදිකර ඇති මාළු වෙළඳසැල් 58

ඡායාරූප 24 : රිටිපන්න ධීවර කර්මාන්තය 59

ඡායාරූප 25 : මිරිස්ස ධීවර වරාය 61

ඡායාරූප 26 : ජලය බැස නොයාම 66

ඡායාරූප 27 : රථවාහන තදබදය 67

ඡායාරූප 28 : යාංඕඩය ඇළ 70

ඡායාරූප 29 : මලාපවාහන පිරිපහදු ඒකකය සඳහා යෝජිත භූමිය 100

ඡායාරූප 30 : යෝජිත බිම් පිරවුම් ව්‍යාපෘති භූමිය 102

ඡායාරූප 31 : වෙරළ සංවර්ධනය ව්‍යාපෘතියේ අදියර I යටතේ ඉදිකර ඇති මාළු වෙළඳ සැල් 105

**රූප සටහන් ලේඛණය**


| | |
|---|---|
| රූප සටහන් අංක 01 : වැලිගම බොක්ක සහ ජල මාර්ග පද්ධතියේ පිහිටීම | 36 |
| රූප සටහන් අංක 02 : වෙරළ තීරයේ සිට පොල්අතුමෝදරගහ දක්වා ප්‍රදේශය : අ-ආ හරස්කඩ | 79 |
| රූප සටහන් අංක 03 : කප්පරතොට සිට පැලෑන දක්වා ප්‍රදේශය : ඇ-ඈ දික්කඩ | 79 |
| රූප සටහන් අංක 04 : දර්ශීය සංකල්පිත සැලැස්ම | 80 |
| රූප සටහන් අංක 05 : මාර්ග හරස්කඩ - මංතීරු දෙක | 89 |
| රූප සටහන් අංක 06 : මාර්ග හරස්කඩ - මංතීරු හතර | 90 |
| රූප සටහන් අංක 07 : මීටර් 7 පළල මාර්ග හරස්කඩ | 91 |
| රූප සටහන් අංක 08 : මීටර් 9 පළල මාර්ග හරස්කඩ | 91 |
| රූප සටහන් අංක 09 : වැලිගම නගර මධ්‍ය ප්‍රදේශය - යෝජිත සැලැස්ම | 93 |
| රූප සටහන් අංක 10 : වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතියේ III අදියර යටතේ ඉදිකිරීමට යෝජිත ආපනශාලාවල ඉදිරි පෙනුම | 106 |
| රූප සටහන් අංක 11 : වැලිගම වෙරළ උද්‍යානය | 107 |
| රූප සටහන් අංක 12 : කප්පරතොට කලපුව සංවර්ධන ව්‍යාපෘතිය | 108 |
| රූප සටහන් අංක 13 : කප්පරතොට නාරා ආයතනය සතු භූමිය (සංකල්පිත සැලැස්ම) | 109 |


**ප්‍රස්ථාර ලේඛණය**


| | |
|---|---|
| ප්‍රස්ථාර අංක 01 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - ජාතීන් අනුව ජන සංඛ්‍යා සංයුතිය (2011) | 14 |
| ප්‍රස්ථාර අංක 02 : සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය 2012 - 2017 | 42 |
| ප්‍රස්ථාර අංක 03 : ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව (2010 – 2017) | 48 |
| ප්‍රස්ථාර අංක 04 : මාළු නිෂ්පාදනය -2017 | 56 |
| ප්‍රස්ථාර අංක 05 : වැලිගම නගරය ආසන්න ප්‍රදේශවල මත්ස්‍ය නිෂ්පාදනය | 61 |

**වගු ලේඛණය**


වගු අංක 01 : වැලිගම නගර සභා බල ප්‍රදේශය : භූමි පරිභෝග රටාව (2017) 15

වගු අංක 02 : වැලිගම නගර සභා බල ප්‍රදේශය : මාර්ග පද්ධතිය - 2017 16

වගු අංක 03 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පාසල් පිළිබඳ තොරතුරු - 2017 17

වගු අංක 04 : වැලිගම නගර සභා බල ප්‍රදේශය : ඝණ අපද්‍රව්‍ය සංයුතිය - 2016 19

වගු අංක 05 : ඇස්තමේන්තුගත ජනගහනය 2030 81

වගු අංක 06 : ඇස්තමේන්තුගත නිවාස අවශ්‍යතාවය 2030 82

වගු අංක 07 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - යෝජිත මාර්ග හා ගමනාගමන සැලැස්ම - 2030 89

වගු අංක 08 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - දෛනික ජල අවශ්‍යතාවය 94

වගු අංක 09 : ඝණ අපද්‍රව්‍ය සංයුතිය - 2017 101

වගු අංක 10 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ සංචාරක ආයතනවල රැකියා නියුක්තිය 103

වගු අංක 11 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි උද්‍යාන වර්ග 117

වගු අංක 12 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (2019 – 2030) 118

වගු අංක 13 : උපාය මාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති 125

# පළමු කොටස

# 1.0 හැඳින්වීම

## 1.1 සංවර්ධන සැලැස්ම සැකසීමේ පසුබිම

නගරයක අනාගත සංවර්ධනය සඳහා සකස් කෙරෙන සංවර්ධන සැලසුම් සඳහා එම ප්‍රදේශයේ, භෞතික, ආර්ථික, සමාජ, පාරිසරික හා දේශපාලන සාධක වල නැඹුරුතාවය පාදක කරගනු ලැබේ. එම සාධකයන්හි ශක්තීන් හා දුර්වලතා අඩු වැඩි වශයෙන්ද ප්‍රතිලෝම හා අනුලෝම සබඳතාවයන් ද සංවර්ධන සැලැස්මට බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ ප්‍රධාන ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත වැදගත් වන අතර, එහි 1982 අංක 04 දරණ සංශෝධිත පනත මඟින් අදාල බලතල පවරා ඇත.

එම නීතිමය පසුබිම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යය වන්නේ නාගරික සංවර්ධන බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කොට ඇති ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම වේ. සංවර්ධන සැලැස්මක් සැකසීම තුලින් එම ප්‍රදේශයේ නිවැසියන්ට යහපැවැත්ම උදාකර දීම සහ නව සංවර්ධන ව්‍යාපෘති සඳහා අවස්ථාව සලසා දීමත්, එමගින් නාගරික සංවර්ධන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවස්ථාව සැලසීමත් අරමුණු කෙරේ.

ඒ අනුව, වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නාගරික සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ගැනීම අරමුණ වේ. මෙම ප්‍රදේශය 1933 දී දිස්ත්‍රික් සභාවක් බවටත්, 1940 දී නගර සභාවක් බවටත් පත්කර ඇත. 1980.08.04 දිනැති අංක 100/4 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, නැවත 2005.09.07 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1409/8 අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශය මහා මාතර සංවර්ධන ප්‍රදේශයටද ඇතුලත් වී ඇත.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයේ සිට ආරම්භ කරන ලද භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික සාධක පදනම් කරගනිමින් නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

මෙම නගර සංවර්ධන සැලැස්ම 2017 දී සකස් කිරීමට පියවර ගත් අතර, සීමිත කාල පරිච්ඡේදයක් තුල නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.2 සැලසුම් කණ්ඩායම

**ප්‍රධාන පාර්ශව ආයතනය**

1. නගර සභාව - වැලිගම

**ප්‍රධාන පාර්ශවකරුවන් :-**

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය - වැලිගම.
3. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව - දෙවිනුවර
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
5. මධ්‍යම පරිසර අධිකාරිය - මාතර.
6. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය -මාතර
7. සමුද්‍රීය පරිසර අධිකාරිය
8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිගම
9. කලාප අධ්‍යාපන කාර්යාලය - වැලිගම
10. වාණිජ මණ්ඩලය - වැලිගම
11. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
12. ධීවර පරීක්ෂක කාර්යාලය.
13. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - වැලිගම
14. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - වැලිගම
15. වාණිජ මණ්ඩලය - වැලිගම
16. ධීවර සමිති
17. සර්ෆින් ක්‍රීඩා පුහුණු කරන්නන්ගේ සමිතිය
18. හෝටල් හිමියන්ගේ සංගමය.

**අනෙකුත් පාර්ශවකරුවන් :-**

**සැලසුම් කණ්ඩායම - නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන කාර්යාලය.**

1. සංවර්ධන සැලසුම් අංශය
2. පාරිසරික හා භූ දර්ශන අංශය
3. භූගෝලීය තොරතුරු පද්ධති අංශය
4. පර්යේෂණ හා සංවර්ධන අංශය

**නාගරික සංවර්ධන අධිකාරිය - මාතර දිස්ත්‍රික් කාර්යාලය.**


| | |
|---|---|
| කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මයා | අධ්‍යක්ෂ (දකුණු පළාත) |
| කේ.ජී.කළ්‍යානි ඉන්දිකා මිය | නි.අධ්‍යක්ෂ (සැලසුම්) |
| ජේ.සී. වික්‍රමරත්න මයා | ස.අධ්‍යක්ෂ (ගෘහ නිර්මාණ ශිල්පී) |
| ජී.එල්.සුමනසේකර මිය | ස.අධ්‍යක්ෂ (සැලසුම්) |
| කේ.එස්.රෙජී මයා | සැලසුම් නිලධාරී |
| ඕ.ජී.නිල්මිණි මිය | සැලසුම් නිලධාරී |
| එච්.සී.ඩබ්. අනෝමා ප්‍රියන්ති මෙය | සැලසුම් නිලධාරී |
| කේ.එච්.සී. නිශාන්ති මිය | සැලසුම් නිලධාරී |
| ඒ.පී.එම්. සමරසිංහ මිය | සැලසුම් නිලධාරී |
| නිලන්ති ආරියරත්න මිය | සැලසුම් නිලධාරී |
| නිමාලි ධම්මිකා මිය | සැලසුම් නිලධාරී |

## 1.3 විෂය පථය

වැලිගම නගරය, වැලිගම බොක්කේ ඇති වලයාකාර පිහිටීම හා නොගැඹුරු මුහුද සංචාරක කර්මාන්තයට මෙන්ම ධීවර කර්මාන්තයටද මනා ප්‍රවේශකත්වයක් සපයමින් නිර්මාණය වී ඇත. මෙම ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තයට හා ධීවර කර්මාන්තයට යොදාගත හැකි ඉහළ සංවර්ධන විභවතාවයකින් යුක්ත ප්‍රදේශ රාශියක් පිහිටා ඇත. එහෙත් මේ දක්වා එම ප්‍රදේශ ප්‍රශස්ථ භාවිතය සඳහා යොමුවී නොමැත. එබැවින් ඉහළ සංවර්ධන විභවතාවයකින් යුක්ත වැලිගම නගර සහා බල ප්‍රදේශය සඳහා සැකසෙන මෙම සංවර්ධන සැලැස්ම ප්‍රාදේශීය මට්ටමට සීමා වේ.

මෙම සංවර්ධන සැලැස්ම මඟින් 2030 වසර වන විට වැලිගම නගරය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය කිරිම අරමුණු වන අතර, ඒ සඳහා භෞතික, සමාජ, ආර්ථික හා පාරිසරික කටයුතු ඒකාබද්ධව සංවර්ධනය කරා යොමු කිරිමට අපේක්ෂිතය. වැලිගම නගර සභා බල ප්‍රදේශය සිතියම් අංක 01 මගින් පහත දක්වා ඇත.

**සිතියම් අංක 01:** වැලිගම නගර සභා බල ප්‍රදේශය



## 1.4 සැලසුම් ක්‍රියාවලිය

| | | |
|---|---|---|
| 1.4.1 | **පසුබිම් අධ්‍යයනය** | රාජ්‍ය ආයතන මගින් ආර්ථික සාමාජීය හා භෞතික තොරතුරු පිළිබඳ ද්විතික දත්ත ලබා ගැනීම. භූමි පරිහරණ රටාව පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කිරීම. දත්ත රැස්කිරීම (ක්ෂේත්‍ර සමීක්ෂණ මගින්, ආයතන මගින්, අන්තර්ජාලය මගින්, භූගෝලීය සිතියම් මගින් ප්‍රාථමික හා ද්විතික දත්ත රුස්කිරීම.) |
| 1.4.2 | **විෂය පථය** | පවතින තත්ත්වය විශ්ලේෂණය (EXCEL ,GIS, Drone,Google, SPSS සිතියම් මගින් මූලික විශ්ලේෂණය) |
| 1.4.3 | **ගැටළු හා විභවතා හඳුනාගැනීම** | අධ්‍යයන ප්‍රදේශය තුල ආර්ථික සාමාජීය භෞතික හා පාරිසරික අංශයන්හි පවත්නා ගැටළු හදුනාගන්නා ලදී. මේ සඳහා නගරයේ ඇති එක් එක් ආයතනයන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට 2017.12.19 දින පාර්ශවකරුවන්ගේ රැස්වීමක් වැලිගමදී පවත්වන ලදී. (ඇමුණුම් අංක 01) |
| 1.4.4 | **දැක්ම අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම** | සංවර්ධන ප්‍රදේශයේ පවත්නා විභවතා ප්‍රශස්ථ භාවිතය සඳහා යොමුකරමින් හා පවත්නා ගැටළු මගහරවා ගනිමින් භෞතික ආර්ථික, සමාජීය හා පාරිසරික, අංශයන්හි ඒකාබද්ධ සංවර්ධනය තුළින් අපේක්ෂිත සංවර්ධනය කරා රැගෙනයාමට අවශ්‍ය දැක්ම ගොඩනඟන ලද අතර, දැක්ම සාක්‍ෂාත් කරගැනීම සඳහා අරමුණු හා පරමාර්ථ සකස් කිරීම. |
| 1.4.5 | **විස්තරාත්මක විශ්ලේෂණය** | ශ.දු.අ.ත. විග්‍රහය,සංවේදීතා විග්‍රහය, සම්බන්ධක විග්‍රහය සහ සංවර්ධන නැමියාව පදනම් කරගෙන විස්තරාත්මක විග්‍රහයක් සකස් කිරීම. එය පදනම් කරගෙන දැක්ම සකස් කිරීම. එම දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අරමුණු හා පරමාර්ථ සකස් කිරීම. |
| 1.4.6 | **සංවර්ධන සැලැස්ම/ උපායමාර්ග ගොඩනැගීම.** | රැස්කරන ලද භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික දත්ත හා තොරතුරු සවිස්තරාත්මක විග්‍රහයකට යොමුකර, ප්‍රායෝගික ක්‍රමවේදයන් භාවිතා කරමින් නාගරික සංවර්ධන ක්‍රමවේදයන්ට අනුකූලව දැක්ම ළඟා කර ගැනීමට කටයුතු සිදු කිරීම. |
| 1.4.7 | **සැලසුම් රෙගුලාසි පිළියෙල කිරීම.** | සංවර්ධන සැලැස්මක් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධ වන නීති හා රෙගුලාසිද සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ලඟාවීම සඳහා දැනට හදුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගත වේ යැයි විශ්ලේෂණය මගින් අපේක්ෂා කරනු ලබන ගැටළුද අවම කර ගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී. |
| 1.4.8 | **පළාත් පාලන ආයතනයේ එකඟතාවය ලබා ගැනීම** | සකස් කරන ලද දළ සංවර්ධන සැලැස්ම සඳහා මහජන අදහස් ලබා ගැනීම අදාල පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට දින 60 ක කාලයක් ලබාදී මහජන අදහස් හා පළාත් පාලන යෝජනා අනුව අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලැබේ. |
| 1.4.9 | **සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම.** | අවසන් වරට සකස් කරන ලද දළ සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කර, සංවර්ධන සැලසුම් අංශය වෙත යොමු කිරීම. |
| 1.4.10 | **අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම** | සංවර්ධන සැලසුම් අංශය මගින් නීතිමය ක්‍රමවේදයන්ට අනුකූලව සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත්කිරීම. |

2017.02.07 දින වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරිමේ කටයුතු ආරම්භ කරන ලද අතර, 2017.04.30 දින දක්වා ප්‍රාථමික හා ද්විතීක දත්ත රැස්කිරීමේ කටයුතු සිදුකරන ලදි. එම තොරතුරු පදනම් කරගනිමින් කෙටුම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර 2017.12.19 දින එය ප්‍රදේශයේ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, පැමිණි පිරිස් ධීවර හා වාණිජ, අපරව්‍යූහ පහසුකම් හා පරිපාලන, පාරිසරික හා සංචාරක ලෙස කණ්ඩායම් තුනකට වෙන් කරන ලද අතර, ඉන් ලබාගන්නා ලද තොරතුරු හා අධිකාරිය මඟින් ලබාගන්නා ලද තොරතුරු පදනම් කරගනිමින් වැලිගම නගර සභා බල ප්‍රදේශයේ විභවතා හා ගැටළු හඳුනාගන්නා ලදි. අනතුරුව හඳුනාගත් විභවතා ගැටළු මෙන්ම ප්‍රදේශයේ සංවර්ධන නැම්යාව පදනම් කරගනිමින් නාගරික සංවර්ධන ක්‍රියාකාරකම් ලඟා කර ගැනීම සඳහා නගරයේ අනාගත දැක්ම හා ඊට සමගාමීව පරමාර්ථ, අරමුණු හා උපක්‍රම සකස් කර ඒ සඳහා ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික යන සාධක පාදක කරගනිමින් සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරන ලදි. ඒ සඳහා නගරය සතු ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන (SWOT Analysis) පිළිබඳ විශේෂ විග්‍රහයක් සිදුකරන ලද අතර, ඊට අමතරව සංවේදීතා විශ්ලේෂණය (Sensitivity Analysis), සම්බන්ධ විශ්ලේෂණය (Connectivity Analysis) සහ සංවර්ධන නැම්යාව පිළිබඳ විශ්ලේෂණය (Development Pressure Analysis) සිදුකිරිමෙන් අනතුරුව සැලැස්මේ අනාගත දැක්ම සකස් කරන ලදි.

ඒ අනුව, එම දැක්ම ලඟාකර ගැනීම සඳහා ඉහත සඳහන් විශ්ලේෂණයෙහි අඩංගු භෞතික, සාමාජීය, ආර්ථික හා පාරිසරික සාධක, උපක්‍රම බවට පත්කර ගනිමින් නාගරික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රායෝගිකත්වයට පත්කිරිම සඳහා ඒවාට අදාල විවිධ සැලසුම් සකස් කිරිම හා එම සැලසුම්වලට සමගාමීව සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි සකස් කිරිම සිදුකරන ලදි. ඉන් අනතුරුව මෙම සංවර්ධන සැලසුම සම්බන්ධව පළාත් පාලන ආයතනයන්හි අනුමැතිය ලබාගැනිමට මහජනතාවගේ අදහස් විමසීමට එම පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරන ලදි. ඔවුන්ගේ අනුමැතියෙන් පසුව අවසන් සංවර්ධන සැලසුම් කෙටුම්පත ප්‍රධාන සැලසුම් කමිටුවට හා සංවර්ධන සැලසුම් අංශයට යොමුකර එහි අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රකාශයට පත්කරන ලදි.

# 2.0 මූලික අධ්‍යයනය

## 2.1 අධ්‍යයන කලාපය

වැලිගම නගරය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර - කොළඹ වෙරළබඩ මහා මාර්ගයේ වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇත. මාතර දිස්ත්‍රික්කයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශයට පත් කර ඇති නාගරික ප්‍රදේශ 17 අතුරෙන් එකම නගර සභා බල ප්‍රදේශය වැලිගම නගරය වේ. වැලිගම නගර සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 13 කින් හා හෙක්ටයාර් 543.7 කින් සමන්විත වේ.

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය වන මාතර නගරයට සහ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන ගාල්ල නගරයට අතරමැදිව පිහිටි මෙම නගරය සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශයකි. දෛනික අවශ්‍යතා සපුරාලීම හා සංචාරක කටයුතු සඳහා නගරයට පැමිණෙන ජනතාව පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කරන සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ වලට අනුව දිනකට 55,000 ක ප්‍රමාණයක් මෙම නගරය කරා පැමිණෙන බව හඳුනාගෙන ඇත. මෙම ජනගහනයෙන් බොහෝ පිරිසක් වැලිගම නගර සභා බල ප්‍රදේශය හා වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආශ්‍රිතව වාසය කරන බව තහවුරු වේ.

අධ්‍යයනයේ පහසුව සඳහා වැලිගම බොක්කට සමාන්තරව වැලිගම නගරසභා මායිමේ සිට උතුරු දෙසට අරීය ප්‍රදේශයක් ආවරණය වන පරිදි වැලිගම හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 86 කින් යුත් ප්‍රදේශය අධ්‍යයන ප්‍රදේශය ලෙස හඳුනාගන්නා ලදි. මෙම අධ්‍යයන ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 34.9 ක් වන අතර. 2011 ජන හා නිවාස සංගණන වාර්තා වලට අනුව මුළු ජන සංඛ්‍යාව 124,941ක් වේ.

## 2.2 සැලසුම් සන්දර්භය හා වර්තමාන තත්ත්වය

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2007 වසරේදී සකස් කරන ලද " මාතර" නැමැති ග්‍රන්ථයට අනුව වැලිගම නගරය වසර 2003 ක පමණ ලේඛනගත ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ. ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේ දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමයේ දෙතිස් ඵල බෝධියක් වැලිගම රෝපණය කරවූ බව බෝධි වංශයේ සඳහන් වේ. විජයාවතරණයට පෙර හෝ සමගාමී කාල සමයක ආර්ය ගමනයක් වැලිගම තොටුපල ආශ්‍රයෙන් සිදුවී ඇතැයි ඉතිහාසඥයෝ සඳහන් කරන බවත්, බෝධිරෝපණයට පෙර 4 වන ශත වර්ෂයේ සමුද්‍රාසන්න ජනාවාසයක පොල්අතු පෙළට සිටුවා තිබූ බවත්, මෙගස්තිස් නම් දේශාටකයා සඳහන් කර ඇත. ක්‍රිස්තු පූර්ව යුගවලදී

වැලිගම පොල් වගාව පැවති බව මහාචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි ලේඛනගත කර ඇති බවට ‘‘මාතර’’ ග්‍රන්ථයේ දක්වා ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවෙහි ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනිම හා එහි වාසිසහගත පිහිටීම තුලින් උපරිම ඵල ලබා ගන්නා පරිදි භූමි පරිභෝග සැලැස්ම සකස් කිරිම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරිමයි.


සිතියම් අංක 02 හා 03 මගින් පෙන්වා ඇති පරිදි ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති ජාතික භෞතික සැලැස්මේ දකුණු පළාත් භෞතික සැලැස්මට අයත් මාතර දිස්ත්‍රික්කය සඳහා සකස් කරන ලද ව්‍යුහ සැලැස්මට අනුව වැලිගම නගරය අධි ඝනත්ව නාගරික කලාපය තුළ පිහිටා ඇති අතර, ක්‍රියාකාරිත්ව නාගරික ධූරාවලිය අනුව සංචාරක කලාපය තුළ පිහිටා ඇත. 2011- 2050 සඳහා සකස් කර ඇති ජාතික භෞතික ව්‍යුහ සැලැස්මෙහි වැලිගම ධීවර වරාය සංවර්ධනය හා සාගරය පදනම් කරගත් සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරිම සුදුසු බවට හඳුනාගෙන ඇත. එම සැලැස්මට අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අධි සංවේදිත වෙරළබඩ පාරිසරික ප්‍රදේශ සංවර්ධනයට හඳුනාගෙන ඇති අතර, වැලිගම නගරයද මෙම ප්‍රදේශයට ඇතුළත් කර ඇත.

1997 JICA ආයතනය මගින් සකස් කරන ලද නාගරික ධූරාවලිය අනුව ගාල්ල සහ මාතර ප්‍රධාන නගර ලෙසද වැලිගම දෙවනපෙළ නගරයක් ලෙසද හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 02 : දක්ෂිණ කලාපීය භෞතික සැලැස්ම : යෝජිත ජනාවාස ව්‍යුහ සැලැස්ම - මාතර දිස්ත්‍රික්කය**



**සිතියම් අංක 03 : දක්ෂිණ කලාපීය භෞතික සැලැස්ම : පවත්නා නාගරික ධූරාවලිය - දක්ෂිණ කලාපය**




මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,2050

මෙම සංවර්ධන ප්‍රදේශය මුහුදුබඩ මහා මාර්ගය, දුම්රිය මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය මඟින් කොළඹ නගරය, හම්බන්තොට හා මොනරාගල දිස්ත්‍රික්ක සමඟ සම්බන්ධ වන අතර, වැලිගම අකුරැස්ස මාර්ගයෙන් අකුරැස්ස දෙනියාය හා රත්නපුර දක්වා රට අභ්‍යන්තරය සමඟත් මනා සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.

වැලිගම ප්‍රදේශයේ ඓතිහාසික හා ගෘහනිර්මාණාත්මක වටිනාකමක් ඇති ස්ථාන ලෙස අග්‍රබෝධි විහාරය, කුෂ්ඨරාජගල, මෙතෝදිස්ත දේවස්ථානය, තිරුවැල කෝවිල හා මොන්ටේගු වලව්ව සඳහන් කළ හැක. අග්‍රබෝධි විහාරය දෙවන පෑතිස් රාජ්‍ය සමයේදී ඉදිකරවන ලද බැවින් හා අවලෝකේශ්වරනාථ බෝසතුන්ගේ ප්‍රතිමාව කුෂ්ටරාජගල ඉදිකර ඇති බැවින් එම ස්ථානවල ඇති ඓතිහාසික වටිනාකම පිළිබඳව සංචාරකයින් දැනුවත් කර සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගත හැක. අග්‍රබෝධි විහාරය, කුෂ්ඨරාජගල, මෙතෝදිස්ත දේවස්ථානය, තිරුවැල කෝවිල ඡායාරූප අංක 01, 02, 03, 04 මගින් දක්වා ඇත.

**ඡායාරූප 01 : අග්‍රබෝධි විහාරය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 02 : කුෂ්ටරාජගල**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 03 : මෙතෝදිස්ත දේවස්ථානය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 04 : තිරුවැල කෝවිල**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

වැලිගම නගරයේ අතීතයේ සිටම ධීවර කර්මාන්තය පැවති බවට සාධක හමුවී තිබේ. ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය වන වල්ලම් (ධීවර ඔරු) සහ වරායක් තිබූ බව විද්වතුන් විසින් සඳහන් කර ඇති බව " මාතර" නම් ග්‍රන්ථයෙහි දැක්වේ.

වැලි හා වැල් බහුලව පැවතීමත්, වල්ලිනම් කුල කාන්තාවකට දුන්ගම හා වල්ලික නම් වෙළඳගණයාට අයිතිව පැවති වරාය හේතුවෙන් වැලිගම නාමය ව්‍යවහාරයට පත්වී ඇති බව "මාතර" නම් ග්‍රන්ථයෙහි දක්වා ඇත.

නගර සහා බල ප්‍රදේශයේ භූ විෂමතාවය සලකා බලන විට පොදුවේ සමතලා ස්වරූපයක් ගන්නා අතර, නිරිත දෙසින් උස් බිම් කිහිපයක් පිහිටා ඇත. ප්‍රදේශයේ උස මුහුදු මට්ටමේ සිට මීටර් 25.0ක් දක්වා වන අතර උපරිම උස වලාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රෝහල් භූමිය ආශ්‍රිත ප්‍රදේශය හා කප්පරතොට ප්‍රදේශයේ පිහිටි කඳු මුදුන් තුන හැඳින්විය හැකිය. සාමාන්‍ය මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1800 - 2500 ත් අතර වේ. ප්‍රදේශය සඳහා මූලික වශයෙන් වර්ෂාපතනය ලැබෙන්නේ නිරිතදිග මෝසම් හා අන්තර් මෝසම් වර්ෂාපතනය මඟිනි. මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ට්‍රිගේට් අංශක 23- 25 ත් අතර වේ.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධානතම භූ ලක්ෂණය වශයෙන් කඩතොළු සහිත කිලෝ මීටර් 3 ක් පමණ වන දර්ශනීය වෙරළ තීරය දැක්විය හැකිය. මෙම වෙරළ තීරය මුහුදු බොකු, තුඩු, ගල්පර, දූපත් හා කලපු යන ස්වාභාවික ලක්ෂණ වලින් යුක්ත වන බැවින්, දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනය ලබා ගැනීමට මෙන්ම සෞන්දර්යාත්මක අගය වැඩි කිරීමට හැකියාව මේ නිසා ලැබී ඇත. තවද, මෙම මුහුදු වෙරළ ධීවර කර්මාන්තය සඳහා ද වැදගත් සාධකයක් වී ඇත.

නාගරික සීමාව තුළ පිහිටා ඇති ගංදූව, කාකදූව, වැලිගම බොක්ක දෙපස පිහිටි ගිරාගල හා රාස්සමූණ කඳු, කප්පරතොට ප්‍රදේශයේ පිහිටා ඇති මුහුදු දඹය හා වැලිගම ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන ජල මූලාශ්‍රය වන පොල්වත්ත ගඟ නගරයේ ඇති විශේෂිත සෞන්දර්යාත්මක වටිනාකම් ඇති භෞතික ලක්ෂණයන් වේ. මෙම භෞතික ලක්ෂණයන් නගරයේ පැවතීමෙන් එය නගරයේ සෞන්දර්යාත්මක අගය වැඩි කිරීම සඳහා මෙන්ම සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහාද බලපාන වැදගත් සාධකයක් බවට පත් කර ඇත.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන ගාල්ල වරාය, ගාල්ල කොටුව, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොග්ගල ගුවන් තොටුපොළ, කොග්ගල නිදහස් වෙළඳ කලාපය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය, රුහුණ විශ්ව විද්‍යාලය, කතරගම පූජා නගරය, සිංහරාජ වනාන්තරය, යාල වනෝද්‍යානය හා රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානය වැනි ස්ථාන සමඟද මනා සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.


2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද ජන හා නිවාස සංගණන වාර්තාවලට අනුව මාතර දිස්ත්‍රික්කයේ මුළු ජන සංඛ්‍යාව 965,291ක් වන අතර, වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ජන සංඛ්‍යාව 22,149 වේ. ඒ අනුව වැලිගම නගරයේ ජන සංඛ්‍යාව මාතර දිස්ත්‍රික් ජන සංඛ්‍යාවෙන් 2.3% ක අගයක් ගනී. 2011 වසරේ ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යා වර්ධන අනුපාතය 0.7 % හා සැසඳීමේදී වැලිගම, මාතර හා අකුරැස්ස (නාගරික ප්‍රදේශවල) ජන සංඛ්‍යා වර්ධන අනුපාත අඩු අගයක් ගෙන ඇති අතර, දෙවිනුවර පමණක් ඉතා වැඩි වර්ධන අනුපාතයක් ගෙන ඇත. 2001 – 2011 කාල පරාසය තුල ජන සංඛ්‍යා වර්ධන අනුපාතය අඩු වීමට හේතුවක් ලෙස 2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යවසනය බලපාන ලද බව පැහැදිලි වේ. සුනාමි ව්‍යවසනය හේතුවෙන් නගරයේ ජීවත් වූ ජන සංඛ්‍යාව 1,500ක් පමණ මියගිය අතර, වෙරළ ආශ්‍රිත ජන සංඛ්‍යාවෙන් කොටසක් නගර සීමාවෙන් පිටත ප්‍රදේශවලට එනම්, මීදිගම, පොල්අතුමෝදර, පැලෑන වැනි ප්‍රදේශවල ඉදිකරන ලද සුනාමි නිවාස ව්‍යාපෘතිවල පදිංචි කරවීමත්, තවත් කොටසක් නගරයෙන් පිටතට සංක්‍රමණය වීමත් සිදුවිය.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 13 ක් ඇති අතර, මුළු වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 543.7 කි. ඒ අනුව, 2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද ජන සංගණන වාර්තාවට අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශයේ දළ ජන ඝනත්වය හෙක්ටයාර 1 කට පුද්ගලයන් 43 ක් වේ. 2011 වර්ෂයේ වැලිගම නගරයේ මුළු භූමි පරිහරණ රටාව අනුව නේවාසික භාවිතය සඳහා හෙක්ටයාර 293.07 ප්‍රමාණයක් යෙදවී ඇති අතර, ඒ අනුව ශුද්ධ ජන ඝනත්වය හෙක්ටයාර් එකකට පුද්ගලයන් 76 ක් වේ.

2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද ජන සංගණන වාර්තාවට අනුව වැඩිම ජන ඝනත්වයක් වාර්තා වී ඇත්තේ අලුත් වීදිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වන අතර එහි ජන ඝනත්වය හෙක්ටයාර් 1 ට පුද්ගලයින් 133ක් වේ. කප්පරතොට උතුර, ගල්බොක්ක නැගෙනහිර හා බටහිර ග්‍රාම නිළධාරී කොට්ඨාශවලද ජනඝනත්වය වැඩි අගයක් ගන්නා අතර, අඩුම ජන ඝනත්වයක් වන හෙක්ටයාර 1 කට පුද්ගලයන් 17 ක් වාර්තා වී ඇත්තේ කොහුණුගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙනි. හෙට්ටිවීදිය හා වල්ලිවල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසවල ජන ඝනත්වය අනෙකුත් ග්‍රාම නිලධාරී කොට්ඨාස හා සැසඳීමේදී අඩු අගයක් ගෙන ඇත.

වැලිගම නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව අතුරින් සිංහල ජනයා 66.04% ක් ජීවත් වන අතර, සුළු ජාතීන් අතුරින් බහුතරය මුස්ලිම් ජනතාව වේ. එය මුළු ජනගහනයෙන් 30.82% ක් පමණ වේ. මෙම ප්‍රදේශයේ වාසය කරන ද්‍රවිඩ ජනගහනය 3.09% ක් වන අතර, ඉතිරි ප්‍රමාණය අනෙකුත් ජාතීන් වේ. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ජාතීන් අනුව ජන සංයුතිය ප්‍රස්ථාර අංක 01 මඟින් නිරූපනය කෙරේ.

**ප්‍රස්ථාර අංක 01**




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2011 ජන හා නිවාස සංගණන වාර්තාව

වැලිගම නගරය මාතර - කොළඹ ප්‍රධාන මුහුදු බඩ මාර්ගයෙහි පිහිටීම, වෙරළ බඩ දුම්රිය මාර්ගය මෙම නගරය හරහා ගමන් කිරීම, විශේෂිත භූ ලක්ෂණ වලින් යුත් දර්ශනීය වෙරළ තීරයක පිහිටීමත්, වාණිජ හා සේවා ලබා ගැනීමට ඇති පහසුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ජාතික පාසල්, දිසා රෝහල සහ නගරයට යාබදව ධීවර වරාය පිහිටීමත් යන කරුණු පදනම් කරගෙන මෙම ප්‍රදේශයට පැමිණෙන දෛනික සංසරණ ජන සංඛ්‍යාව 55,000ක් පමණ වන බව ගණන් බලා ඇත.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 543.7 ක් වේ. 2012 වසරේ සකස් කරන ලද භූමි පරිභෝග සැලැස්මට අනුව සලකා බැලීමේදී 2017 වසරේ සංවර්ධන කටයුතු සඳහා යෙදවී ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර් 464.9 ක් වේ . ඒ අනුව සමස්ත භූමි ප්‍රමාණයෙන් 85.5% ක් ප්‍රමාණයක් සංවර්ධනය සඳහා යොදාගෙන ඇත.

2017 වසරේ සිදු කරන ලද භූමි පරිහරණ සමීක්ෂණයට අනුව, හෙක්ටයාර් 81.5 (14.29%) ක භූමි ප්‍රදේශයක් සංවර්ධන කටයුතු සඳහා යොදාගත නොහැක. ඒ සඳහා කුඹුරු ඉඩම්, වගුරු බිම්, ජල ප්‍රදේශ ආදිය ඇතුලත් වී ඇත. එහෙත් කෘෂිකාර්මික ඉඩම් ලෙස හඳුනාගෙන ඇති පොල් හා කුරුඳු ඉඩම් හා හිස් ඉඩම් අනාගත සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැක. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ භූමි පරිභෝග රටාව වගු අංක 01 මගින් දක්වා ඇත.

**වගු අංක 01 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - භූමි පරිභෝග රටාව (2017)**

| භාවිතය | භූමි ප්‍රමාණය (හෙක්.) 2012 | ප්‍රතිශතය (%) 2012 | භූමි ප්‍රමාණය (හෙක්.) 2017 | ප්‍රතිශතය (%) 2017 | භූමි ප්‍රමාණය වෙනස (හෙක්.) |
|---|---|---|---|---|---|
| නේවාසික | 339.9 | 62.50% | 353.7 | 65.04% | 13.8 |
| වාණිජ | 14.1 | 2.59% | 20.2 | 3.71% | 6.1 |
| කර්මාන්ත | 5.8 | 1.07% | 6.4 | 1.18% | 0.6 |
| රාජ්‍ය ආයතන | 16.4 | 3.02% | 18.8 | 3.46% | 2.4 |
| මාර්ග හා ගමනාගමන | 28 | 5.15% | 29.7 | 5.46% | 1.7 |
| උද්‍යාන හා ක්‍රීඩා පිටි | 3.8 | 0.70% | 3.8 | 0.70% | 0 |
| ආගමික ස්ථාන | 10.6 | 1.95% | 10.6 | 1.95% | 0 |
| සුසාන භූමි | 2.2 | 0.40% | 2.2 | 0.40% | 0 |
| සංචාරක | 7.1 | 1.31% | 17.7 | 3.25% | 10.6 |
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ | | | 1.8 | 0.33% | 1.8 |
| කුඹුරු | 33.1 | 6.09% | 20.9 | 3.84% | -12.2 |
| පොල් | 25.7 | 4.73% | 12.3 | 2.26% | -13.4 |
| වගාවන් | 21.6 | 3.97% | 10.5 | 1.93% | -11.1 |
| හිස් බිම් | 10 | 1.84% | 10 | 1.84% | 0 |
| වගුරු බිම් | 9.5 | 1.75% | 9 | 1.66% | -0.5 |
| ජල | 15.9 | 2.93% | 15.9 | 2.93% | 0 |
| ජැටි | | | 0.2 | 0.04% | 0.2 |
| | **543.7** | **100%** | **543.7** | **100%** | **-** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය.

වැලිගම නගර සභා බල ප්‍රදේශයෙහි පවතින මාර්ග A,B,C,D සහ E වශයෙන් වර්ගීකරණය කළ හැකිය. මෙයින් A හා B ශ්‍රේණියේ මාර්ග, මාර්ග සංවර්ධන අධිකාරිය මගින්ද, C හා D ශ්‍රේණියේ මාර්ග පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ද E ශ්‍රේණියේ මාර්ග වැලිගම නගර සභාව මඟින්ද නඩත්තු කරනු ලබයි. එම මාර්ග පද්ධතිය පිළිබඳ විස්තර පහත අංක 02 වගුව මඟින් පෙන්වා ඇත.

**වගු අංක 02 : වැලිගම නගර සභා බල ප්‍රදේශය : මාර්ග පද්ධතිය - 2017**

| ශ්‍රේණිය | නඩත්තු කරන ආයතනය | මාර්ග සංඛ්‍යාව | දිග (කිලෝමීටර්) |
|---|---|---|---|
| A | මාර්ග සංවර්ධන අධිකාරිය | 01 | 7.5 |
| B | මාර්ග සංවර්ධන අධිකාරිය | 02 | 1.8 |
| C | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 05 | 6.38 |
| D | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 08 | 3.40 |
| E | නගර සභාව | 314 | 50.57 |
| | **එකතුව** | **330** | **69.65** |

මූලාශ්‍රය: මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සං.අ., වැලිගම නගර සභාව- 2017

ඉහත වගුවෙහි දැක්වෙන පරිදි A ශ්‍රේණියට අයත් මාර්ග වශයෙන් කොළඹ - වැල්ලවාය මහා මාර්ගය හා පැරණි ගාලු පාර, වැලිගම - අකුරැස්ස මාර්ගය හා දුම්රිය පොළ මාර්ගය දැක්විය හැකි අතර, එම මාර්ග වල දිග කිලෝ මීටර් 9.3 ක් වේ. තවද, කොළඹ - මාතර දුම්රිය මාර්ගය ද නගරය හරහා ගමන් කරන අතර, එහි දිග කිලෝ මීටර් 3.2 ක් වේ. මීට අමතරව ඉහත මාර්ග පද්ධතිය හා සම්බන්ධ වන පොදු හා පෞද්ගලික මාර්ග පවතී. තවද, දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය වැලිගම නගරයට කිලෝමීටර් 06 ක පමණ දුරින් පිහිටා ඇත.

නාගරික ප්‍රදේශය සඳහා හෙක්ටයාර් 543.7 ක පමණ භූමි ප්‍රමාණයක් යෙදවී ඇති අතර, ඉන් හෙක්ටයාර් 29.7 ක් මාර්ග සඳහා යෙදවී ඇත. ඒ අනුව මුළු භූමි ප්‍රමාණයෙන් මාර්ග සඳහා යෙදවී ඇති ප්‍රතිශතය 5.46% ක් වන අතර, සම්මත ප්‍රමාණය වන 10% ක අවමයවත් ලඟා කරගෙන නොමැත.

2011 ජන හා නිවාස සංගණනයට අනුව වැලිගම නගරයේ සාක්ෂරතා මට්ටම සියයට 95 ක් පමණ වන අතර, එය දිස්ත්‍රික්කයේ සාක්ෂරතා මට්ටමට සමාන අගයක් ගනී.

ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වැදගත් වන රජයේ පාසල් 09 ක්ද පෞද්ගලික පාසල් 03 ක් හා රජයේ වෘත්තීය පුහුණු ආයතනයක් ද පවතී.

**වගු අංක 03 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පාසල් පිළිබඳ තොරතුරු - 2017**

| අනු අංකය | විදුහලේ නම | ගුරුවරුන් ප්‍රමාණය | සිසුන් ප්‍රමාණය | ගුරු සිසු අනුපාතය | ගොඩනැගිලි වලට යටවී ඇති භූමි ප්‍රමාණය (ව.මී.) | ශිෂ්‍යයෙක් සඳහා පන්ති කාමර ඉඩකඩ (ව.මී.) | ක්‍රීඩා පිටි |
|---|---|---|---|---|---|---|---|
| **01** | කප්පරතොට සංඝානන්ද ම.විදුහල | 16 | 167 | 10.45 | 429 | 2.6 | නැත |
| **02** | වැලිගම ජිනරාජ ක. විදුහල | 16 | 241 | 15.05 | 477 | 2.0 | ඇත |
| **03** | වැලිගම ධර්මරාජ ක. විදුහල | 22 | 325 | 14.8 | 559 | 1.7 | නැත |
| **04** | ශ්‍රී සුමංගල බාලිකා විදුහල | 112 | 2,727 | 24.3 | 2,814 | 1.0 | නැත |
| **05** | පැලැන වජිරඥාණ මහ විදුහල | 23 | 286 | 12.4 | 1,076 | 3.7 | නැත |
| **06** | ධර්මපාල ආදර්ශ ක. විදුහල | 28 | 325 | 33.0 | 559 | 0.6 | නැත |
| **07** | වැලිගම සිද්ධාර්ථ ක. විදුහල | 94 | 2,048 | 21.8 | 1,099 | 0.4 | නැත |
| **08** | අර්ෆා මැදි විදුහල | 52 | 1,252 | 24.0 | 1,236 | 1.7 | ඇත |
| **09** | මුස්ලිම් ප්‍රාථමික විදුහල | 23 | 782 | 34.0 | 513 | 0.7 | නැත |
| | **එකතුව** | **386** | **8,153** | **21.12** | **8,762** | **1.1** | **-** |

මූලාශ්‍රය : පාසල් පිළිබඳ වාර්ෂික වාර්තාව - 2017, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, වැලිගම

සමස්තයක් ලෙස සලකා බලන විට එක් ශිෂ්‍යයකු සඳහා වන පන්ති කාමර ඉඩකඩ ප්‍රමාණය වර්ග මීටර් 1.1 ක් වන අතර, එය සම්මත අගය වන 0.9 ට වඩා වැඩි අගයක් ගෙන ඇත. එසේවුවද, ධර්මපාල ආදර්ශ විදුහල, වැලිගම සිද්ධාර්ථ ජාතික පාසල හා මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලයේ එක් ශිෂ්‍යයකු සඳහා වන පන්ති කාමර ඉඩකඩ ව.මී. 0.7 ට වඩා අඩු වන අතර, එය සම්මත ප්‍රමාණයට වඩා අඩු අගයක් ගනී.

ඉහත රජයේ පාසල් වලට අමතරව ජාත්‍යන්තර පාසල් 06 ක් නගරය තුල පිහිටා ඇති අතර, එහි 2016 වර්ෂයේදී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 824 ක් හා ගුරුවරු සංඛ්‍යාව 84 ක් වේ. පිරිවෙන් 02 ක්ද නගරය තුළ පිහිටා ඇති අතර, එහි 2016 වර්ෂයේදී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 88 පමණ වේ. තවද, 1 වසර සිට 11 වසර දක්වා උපකාරක පන්ති 11 ක් හා වෘත්තීය පුහුණු ආයතනයක් ද පිහිටා ඇති

අතර, එම ආයතන මඟින් නාගරික ප්‍රදේශයට මෙන්ම ඉන් පරිබාහිර ප්‍රදේශවලටද අධ්‍යාපන සේවා සපයනු ලැබේ.

නගරය තුළ පිහිටා ඇති ස්වාභාවික ජලාපවාහන මාර්ග කිහිපයකි. ඒවා නම්, පොල්අතුමෝදර ගඟ, කප්පරතොට කලපුව, පොල්කදන් ඇළ අග්‍රබෝධි ඇළ, යාං ඕඩය ඇළ සහ ගුඩ්ෂෙඩ් ඇළ යනාදිය වේ. මෙම ප්‍රදේශයේ ජලාපවහනය ක්‍රමවත් කිරිම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත 1994 වර්ෂයේදී අග්‍රබෝධි ඇළ, යාං ඕඩය ඇළ සහ ගුඩ්ෂෙඩ් ඇළ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර ඇත. එහෙත් නගරයේ ජලය මේ දක්වා නිසි පරිදි ගලායාමක් සිදුවී නොමැති අතර, ජලය එක්රැස් වීම නිසා නගර මධ්‍ය ප්‍රදේශයේ මැසි මදුරු උවදුර සහ වෙනත් රෝග බෝ වීමේ අවදානමක් පවතී.

නගරය තුළ ඇති සනිපාරක්ෂක ජල මුද්‍රිත වැසිකිළි ප්‍රමාණය සියයට 99.0 ක් වන අතර, සනීපාරක්ෂක නොවන වැසිකිළි ප්‍රමාණය සියයට 0.6 කි. මෙම වැසිකිළිවලට අමතරව නගර සභාව මඟින් නඩත්තු කරනු ලබන පොදු වැසිකිළි 08 ක් ඇත.

වැලිගම නාගරික ප්‍රදේශය තුළ පහත සඳහන් රාජ්‍ය ආයතන මඟින් මහජනතාවට සෞඛ්‍ය සේවා සැපයිම සම්බන්ධව කටයුතු කරනු ලබයි.

1. වැලිගම දිසා රෝහල
2. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය.

නගරයේ සෞඛ්‍ය සේවා සැපයීම අංශ දෙකක් යටතේ සිදුකරනු ලැබේ. එනම් නිවාරණ සේවා අංශය හා ප්‍රතිකාර සේවා අංශය වේ. මෙහිදී රෝග නිවාරණය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් පමණක් සිදුකරනු ලැබේ.

වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජන සංඛ්‍යාව 72,843 වන අතර, එම ජන සංඛ්‍යාව සඳහා සෞඛ්‍ය සේවා සැපයීම වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් පස් දෙනෙකු, දන්ත චිකිත්සක නිලධාරියකු හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන් 18 දෙනෙකු මඟින් සිදුකෙරේ. ඒ අනුව, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයින් 38,142 ක් සඳහා එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයකු ද පුද්ගලයින් 15,257ක් සඳහා එක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු ද පුද්ගලයින් 4,238 ක් සඳහා එක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය ක්ද සේවා සපයනු ලබයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සම්මත ප්‍රමාණයන්ට අනුව පුද්ගලයින් 8,000 ක් සඳහා එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයකු ද පුද්ගලයින් 6,000 ක් සඳහා එක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු ද පුද්ගලයින් 3,000 ක් සඳහා එක් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක් ද සේවා

සැපයිය යුතුවේ. ඒ අනුව මෙම ප්‍රදේශය සඳහා නිලධාරින් සම්මත ප්‍රමාණයට අනුව ප්‍රමාණවත් නොවේ.

වැලිගම නගර සභාවේ සංවර්ධන අංශයෙන් ලබාගන්නා ලද දත්ත අනුව නගර සභා බල ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය එක්රැස් කිරිම වැලිගම නගර සභාව මඟින් සිදුකරනු ලැබේ. ප්‍රදේශය තුළ දිනකට එකතු වන කැළි කසල ප්‍රමාණය ටොන් 15 ක් පමණ වේ. එම ප්‍රමාණය පොදු වෙළඳපොළ, වානිජ ආයතන, කර්මාන්ත ශාලා, දිසා රෝහල හා නිවාස යන ස්ථාන වලින් බැහැර කරනු ලබන ඝණ අපද්‍රව්‍ය වලින් යුක්ත වේ. එම ආයතනවලින් එකතු වන ඝණ අපද්‍රව්‍යයන්හි දිරාපත් වන හා දිරාපත් නොවන ද්‍රව්‍යයන්ගේ සංයුතිය පහත වගු අංක 04 පරිදි වේ.

**වගු අංක 04 : වැලිගම නගර සභා බල ප්‍රදේශය : ඝණ අපද්‍රව්‍ය සංයුතිය - 2016**

| සංයුතිය | ප්‍රතිශතය % |
|---|---|
| දිරාපත් වන ශාක සහ සත්ත්ව කොටස් | 80.0 |
| දිරාපත් නොවන ද්‍රව්‍ය | 10.0 |
| කිසියම් දෙයකට යොදාගත නොහැකි ද්‍රව්‍ය | 10.0 |
| එකතුව | 100.0 |

මූලාශ්‍රය : වැලිගම නගර සභාව, සංවර්ධන අංශය - 2016

ඉහත වගුවට අනුව නගරය තුල ජනනය වන කැළි කසලවලින් ඉහල ප්‍රතිශතයක් අන්තර්ගතව පවතින්නේ දිරාපත් වන ශාක හා සත්ත්ව කොටස් වේ. එම ප්‍රමාණය 80% කි. නගර සභාව මඟින් එක්රැස් කරනු ලබන ඝණ අපද්‍රව්‍යයන්ගේ දිරාපත් වන ද්‍රව්‍ය තෝරා, කප්පරතොට ප්‍රදේශයේ පිහිටි අක්කර 17 ක් වන නගර සභාව සතු භූමිය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙමඟින් නගර සභාවට අමතර ආදායමක් උපයා ගන්නා අතරම නගර අලංකරණයට හා සනීපාරක්ෂාව සඳහා ද ඉවහල් වී ඇත.


ඝණ අපද්‍රව්‍යයන්ගේ දිරාපත් නොවන ද්‍රව්‍යයන්ගේ ප්‍රතිශතය 10 කි. ඒවායේ ඇති ප්ලාස්ටික්, වීදුරු වැනි ද්‍රව්‍ය අලෙවි කිරිම සිදුකරන අතර, ඉතිරි වන කොටස් ප්‍රතිචක්‍රීකරණය කරනු ලබයි. ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි 10 % ක පමණ ප්‍රමාණයක් බහාලුම් ස්ථානයක් සඳහා යොමු කළ යුතු වුවද, ස්ථිර බහාලුම් ස්ථානයක් නොමැති බව වැලිගම නගර සභාව මඟින් ලබා ගන්නා ලද දත්ත අනුව වාර්තා වී ඇත.

ප්‍රදේශයේ සාමාන්‍ය උස මට්ටම් වන මීටර් 0 - 5 අතර ප්‍රදේශයේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 95% පමණ පිහිටා ඇති අතර, පරණ කඩේ,ගල් බොක්ක, පැලෑන බටහිර ග්‍රාම නිලධාරී වසම් මීටර්

0 – 1.5 ත් අතර පිහිටා ඇත. සිතියම් අංක 04 හි දැක්වෙන පරිදි, වැලිගම නාගරික බල ප්‍රදේශය තුල පිහිටා ඇති පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ පහත දක්වා ඇත.

- මුහුදු බොක්කකින් සමන්විත කිලෝමීටර් 03 ක දිගින් යුත් වෙරළ තීරය
- මුහුදු දූපත්
- මුහුදු තුඩු සහ ගල්පර
- කප්පරතොට කලපුව හා ඒ ආශ්‍රිත කඩොලාන පරිසර පද්ධතිය.
- පොල්අතුමෝදර ගංගාව හා පරිසර පද්ධතිය. (පරිනත අවස්ථාව)
- ස්වභාවික ඇළ මාර්ග
- පහත් බිම් හා කුඹුරු ඉඩම්

**සිතියම් අංක 04 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පාරිසරික සංවේදී ප්‍රදේශ 2018**



## 2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

අධ්‍යාන ප්‍රදේශය සලකා බලා සැලසුම් ප්‍රදේශයෙහි සැලසුම් සීමා නිර්ණය කිරිමේදී පහත අංශ 03 පදනම් කරගෙන වැලිගම සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි.

**1. ක්‍රියාකාරීත්ව ප්‍රදේශය**

වැලිගම නාගරික ප්‍රදේශය විහවතා වලින් පරිපූර්ණ වූ එකිනෙකට වෙනස් වූ භාවිතයන්ගෙන් සමන්විත වූ නගරයකි. නගර මධ්‍ය ප්‍රදේශය වැලිගම නගර සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර, නගරයේ දකුණු මායිමේ පිහිටා ඇති වෙරළ කලාපය තුල සංචාරක හා ධීවර කර්මාන්ත ස්ථානගත වී ඇත. එලෙසම නගරයේ නැගෙනහිර මායිම දෙසින් ගලා බසින පොල්අතුමෝදර ගඟ සංචාරක කර්මාන්තයට මනා ප්‍රවේශකත්වයක් සපයයි. නගරය පුරා ව්‍යාප්තව ඇති මාර්ග ජාලය තුලින් නගරයේ වැසියන්ට හා දෛනික සංසරණ ජනතාවට මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි. දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පැමිණෙන ජනතාවගෙන් 90% ක පමණ ප්‍රමාණයක් වැලිගම නගර සභා බල ප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වාසය කරන බව හඳුනාගන්නා ලදි. මේ වන විට වැලිගම නගර සභා බල ප්‍රදේශය තුල ජන ඝනත්වය හා නිවාස ඝනත්වය ඉහල අගයක් ගන්නා අතර, අපරව්‍යුහ පහසුකම් විශාල ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතර, ඉහළ ඉඩම් වටිනාකමක් දක්නට ලැබේ. නගර සභා බල ප්‍රදේශයෙන් ඔබ්බට වන්නට ජන ඝනත්වයේ හා අපරව්‍යුහ පහසුකම්වල ව්‍යාප්තියේ ක්‍රමික අඩුවීමක් දක්නට ඇති අතර, ඉඩම් වටිනාකම් ද ක්‍රමයෙන් අඩු වී ඇත.


**2. භූගෝලීය ලක්ෂණ**

වැලිගම නගරය වැලිගම බොක්ක, පොල්අතුමෝදර ගඟ, කප්පරතොට කලපුව සහ වැසි ජලය ගලායාම සඳහා ස්වභාවිකව නිර්මාණය වූ ඇළ මාර්ග පද්ධතියක් සහිතව නිර්මාණය වී ඇත. මෙම ස්වභාවික පිහිටීම පාදක කර ගනිමින් නගර වැසියන්ගේ ජනාවාස නගර මධ්‍ය ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන ව්‍යාප්ත වී ඇත.

**3. පරිපාලන මායිම්**

වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, වැලිගම නගර සභා බල ප්‍රදේශය හා වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් ඒකාබද්ධවීමෙන් සැකසී ඇත. දැනට නාගරික ප්‍රදේශයේ පවත්නා සංවර්ධනය සැලකිල්ලට ගෙන මහා මාතර සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරිමේ කටයුතු ආරම්භ කර ඇති බැවින් ද දැනට පවත්නා නගර සභා බල ප්‍රදේශයම, සිතියම් අංක 05 හි දැක්වෙන පරිදි මෙම සංවර්ධන සැලැස්මේ සංවර්ධන ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 05 : පරිපාලන මායිම්**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

# 3.0 සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

වැලිගම නගර සහා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබුයේ නගරයේ පවතින විභවතා කාර්යක්ෂම ලෙස භාවිතයට ගනිමින් දැනට පැන නැඟී ඇති ගැටළු මඟහරවා ගනිමින් සැලසුම්ගත සංවර්ධනයකට යොමු කිරීම සඳහාය. වැලිගම නගරය වෙරළ කලාපීය පාරිසරික සංවේදී කලාපයක් තුල පිහිටා ඇති විශේෂ ආර්ථික වටිනාකමක් සහිත ප්‍රදේශයකි. සංචාරක ආකර්ශනයක් ඇති කි.මී. 3.0 ක පමණ දිග වෙරළ තීරයකට හිමිකම් කියන මෙම නගරය අතීතයේ සිට පැවත එන රිටිපන්න ධීවර කර්මාන්තයට ඉතා ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. වර්තමානය වන විට දියමත ලිස්සායාමේ ක්‍රීඩාව (සර්ෆින් ක්‍රීඩාව) සඳහා දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය ඇති මුහුදු කලාපයක් පැවතීමත්, කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය, කොළඹ - මාතර දුම්රිය මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ ඉහල ප්‍රවේශකත්වයක් පැවතීමත් ඓතිහාසික වශයෙන් වැදගත් වන ගෘහ නිර්මාණාත්මක වැදගත්කමක් ඇති ගොඩනැගිලි පැවතීමත් වැලිගම නගරයට ඇති විභවතා ලෙස හඳුනාගෙන ඇත.

ඉහල විභවතාවයක් පවතින වැලිගම නගරය සඳහා වාර්ෂිකව පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ ප්‍රමාණය වැඩි වෙමින් පවතී. එහෙත් මෙම නාගරික ප්‍රදේශයට පැමිණෙන ජනතාවට ප්‍රශස්ථ සේවාවක් සලසාදීම සඳහා අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් ක්‍රමවත් ලෙස සංවර්ධනය කර නොමැත. ප්‍රදේශයේ ස්වභාවිකව ජලය බැසනොයාම නිසා කාණු තුල ජලය එක්රැස්වීම, ඩෙංගු, පාචනය වැනි රෝග බෝ වීමට හේතුවන අතර, නගර මධ්‍ය ප්‍රදේශයේ අධික දුර්ගන්ධයක් ඇතිකිරීමට හේතු වී ඇත. එමෙන්ම වැලිගම නාගරික ප්‍රදේශය සඳහා අපජලය හා මලාපවහනය පිරිපහදු පද්ධතියක් නොමැතිකම හේතුවෙන් වර්ෂා කාලයේදී මෙම ප්‍රදේශයේ පවතින ඇතැම් වැසිකිලි උතුරා යාම නිසා සෞඛ්‍ය ගැටළු මතු වී ඇත. මෙම අපිරිසිඳු ජලය පොල්අතුමෝදර ගඟට හා සංචාරක ආකර්ශනයක් සහිත වැලිගම වෙරළ තීරයට එක්වීමෙන් මුහුදු ජලය දූෂණය වීමේ තර්ජනයක් ඇතිවී ඇත. යෝග්‍යතා සිතියමට අනුව වැලිගම නගර මධ්‍ය ප්‍රදේශය සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය ප්‍රදේශයක් වුවද, එහි පවතින භූමියේ ස්වභාවය අනුව ජලය රඳා පැවතීම හේතුවෙන් ඩෙංගු බරවා වැනි රෝග බෝවීමේ අවදානමක් පවතී. නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ වලදී පහත සඳහන් ගැටළු හඳුනාගන්නා ලදි.

1. පහසුවෙන් ජලය බැස යාම සඳහා මතුපිට කාණු පද්ධතිය සහ ඇළ මාර්ග සංවර්ධනය කර තිබුණද නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් පහත අංක 05, 06 ඡායාරූප මගින් පෙන්වා ඇති පරිදි ස්වාභාවික ජලය බැසයාම අවහිර වී ඇත.

   උදා:- යාංඕඩය ඇළ, අග්‍ර බෝධි ඇළ, ගුඩ්ෂෙඩ් ඇළ

**ඡායාරූප 05 : යාංඹිඩය ඇළ**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 06 : අග්‍රබෝධි ඇළ**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

2. පහත අංක 07, 08, 09, 10 ඡායාරූපයන්ගෙන් පෙන්වා ඇති පරිදි නගර මධ්‍යයේ පවතින වාණිජ සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි ඉහල වාණිජ වටිනාකමක් ඇති භූමි භාග ඌණ භාවිතයේ පැවතීම.

**ඡායාරූප 07. සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් භූමිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 08. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 09. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**ඡායාරූප 10. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

3. වැලිගම නගර සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත කප්පරතොට කලපුව සහ ඒ ආශ්‍රිත පිහිටි වගුරු බිම් ප්‍රදේශය යොදා ගෙන ඇත. කප්පරතොට කලපුව වැලිගම නාගරික ප්‍රදේශයේ පරිසර ආකර්ශනයක් සහිත, ගංවතුර පාලනය හා නගරයේ ජලය බැසයාම සඳහා පිහිටි ඉතාම වැදගත් පාරිසරික සංවේදී ප්‍රදේශයක් වේ. නමුත් ඡායාරූප අංක 11 සහ 12 හි දැක්වෙන පරිදි වැලිගම නගර සභාව මඟින් එම කලපු ප්‍රදේශයෙන් විශාල ප්‍රමාණයක ඝන අපද්‍රව්‍ය ගොඩගසා ඇති අතර, ඒ තුළින් අවට ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට හා කප්පරතොට කලපුව ආශ්‍රිතව පවත්නා පරිසර පද්ධතියට තර්ජනයක් එල්ල වී ඇත.

**ඡායාරූප 11. කප්පරතොට කලපුව**



මූලාශ්‍රය : Google Earth, 2018

**ඡායාරූප 12. ඝන අපද්‍රව්‍ය බැහැර කල භූමිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

4. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ රථවාහන ගමනාගමනය සඳහා මාර්ග ජාලයක් පැවතියද, පහත ඡායාරූප අංක 13 හි දැක්වෙන පරිදි කාර්ය බහුල වේලාවන් තුලදී නගර මධ්‍ය ප්‍රදේශයේ අධික රථවාහන තදබදයක් පැවතීම. හෙට්ටිවීදිය, වැලිගම - අකුරැස්ස මාර්ගය, වජිරඥාන මාවත, පරණ ගාලු පාර උදාහරණ ලෙස දැක්විය හැකිය.

**ඡායාරූප 13. හෙට්ටිවීදිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

5. වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා ජලය සපයන ප්‍රධාන මූලාශ්‍රය පොල්අතුමෝදර ගඟ වේ. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ලබාගන්නා ලද තොරතුරු වලට අනුව දැනට මෙම ප්‍රදේශයේ ඉල්ලුමට සරිලන ලෙස ජලය සැපයීම සිදුනොකරන අතර, නගර සීමාව තුල ජල පීඩනයද ප්‍රමාණවත් නොවේ. ඒ අනුව, දැනට පවත්නා ජල ධාරිතාවය ප්‍රමාණවත් නොවීම නාගරික ජනතාවට මුහුණපෑමට සිදුව ඇති ප්‍රධාන ගැටළුවකි.

6. වැලිගම නගර සභා බල ප්‍රදේශය තුල පාසල් 09 ක් පිහිටා ඇති අතර, ඉන් 05ක් කණිෂ්ඨ විදුහල් වේ. නගරයේ තිබෙන පාසල් 09න් පාසල් 07ක් සඳහා ක්‍රීඩා පිටි පහසුකම් නොමැති අතර, පාසල් 02ක් සඳහා පමණක් ක්‍රීඩා පිටි පහසුකම් තිබුණද එම ක්‍රීඩා පිටි ප්‍රමාණවත් නොවේ. මීට අමතරව 2017.12.19 දින පැවති පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී පහත සඳහන් ගැටළු හඳුනාගන්නා ලදි.
   - සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශ විධිමත් පරිදි කළමනාකරණය නොකිරීම.
   - සංචාරක උපදේශන සේවාවක් නොමැතිවීම.
   - සංචාරකයන්ට අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය නොවීම.
   - පවත්නා පාරිසරික සංචාරක ප්‍රදේශ සුදුසු පරිදි සංචාරක කටයුතු සඳහා යොදා නොගැනීම.
   - සනීපාරක්ෂක පහසුකම් විධිමත් පරිදි සපයා නොමැතිවීම.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී වැලිගම නාගරික ප්‍රදේශයේ දැනට පවතින විභවතා ප්‍රශස්ථ භාවිතයට යොමුකිරීම හා ප්‍රදේශයේ පවතින ගැටළු අවම කිරීම හා නගරයේ සංවර්ධනයට ඇති අවහිරතා ඉවත් කොට දකුණුලක පිබිදෙන හොඳම සංචාරක පාරාදීසය ලෙස සැලසුම්ගත සංවර්ධනයකට යොමුකිරීම සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුව ඇත.

වැලිගම නාගරික ප්‍රදේශයේ වෙසෙන ජනගහනයෙන් 28% ක් පමණ ධීවර කටයුතු සඳහාත් 25% ක් පමණ සංචාරක කටයුතු සඳහාත් යෙදවී ඇත. එහෙත් මෙම ජනතාව වෙත ධීවර හා සංචාරක කර්මාන්තය ප්‍රශස්ථ භාවිතයට යොමු කිරීම සඳහා ලැබිය යුතු තාක්ෂණික ඥාණය මේ දක්වා ලැබී නොමැතිවීම හේතුවෙන් නුපුහුණු ශ්‍රමිකයන් බවට පත්වී ඇත. මෙය ප්‍රදේශයේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන් බලපාන සාධකයන් වන අතර, සංචාරක කටයුතු පවතින කාලයේදී පමණක් ධීවර ක්ෂේත්‍රයේ රැකියා නියුතු බොහෝ පිරිසක් සංචාරක කටයුතු වලට ප්‍රවේශවීමේ නැමියාවක් දක්නට ඇත.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද 2011 ජන හා නිවාස සංගණන වාර්තාවට අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශයේ වයස අවුරුදු 15 - 44 අතර ජන සංඛ්‍යාව 10,269 ක් වන අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 46.4% කි. ඉන් පුරුෂ ජන සංඛ්‍යාව 4,929 ක් (45.9%) වන අතර ස්ත්‍රී ජන සංඛ්‍යාව 5,340 (46.8%) ක් වේ. මෙම ජන සංඛ්‍යාවෙන් වෘත්තීය

පුහුණු සඳහා මෙන්ම තෘතීක අධ්‍යාපන කටයුතු සඳහා යොමු වී නොමැති කොටස ඒ සඳහා යොමු කිරිම තුලින් ප්‍රදේශයේ පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය වැඩිකර ගත හැකි අතර, ආර්ථික වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් සැපයිය හැක.

ඉහත හඳුනාගන්නා ලද ගැටළු වැලිගම නගරයේ අනාගත සංවර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකිරීමට ඉවහල් වන අතර, එමඟින් ඇතිවන අවිධිමත් සංවර්ධනය නගරයේ ආර්ථික පසුබෑමකට ලක්වීමට හේතු වේ. එබැවින් එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහාත් වැලිගම නාගරික ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරිම සහ නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා සියළු පහසුකම් ලබාදීම සඳහාත් මෙම සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබන අතර, එමඟින් වැලිගම නගරය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය කිරිමට යෝජිතය.

# දෙවන කොටස

**වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 4 දරණ පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජූලි මස 09 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

.................................................................

**පාඨලී චම්පික රණවක,**
**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**2019 අගෝස්තු මස 01 වන දින.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2135/24 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8ඉ වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, එකී පනතේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව, එකී පනතේ 8උ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යය.

2019 අගෝස්තු මස 01 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 30680 — 27 (2019/08)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8අ වගන්තියේ බලතල ප්‍රකාරව වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8ඊ වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 අගෝස්තු මස 01 වැනි දින.

08 - 751

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# 4.0 සංවර්ධන සැලසුම් රාමුව

## 4.1 දැක්ම

***"දකුණු ලක පිබිදෙන සමුද්‍ර වංකීය සංචාරක පාරාදීසය"(The Blooming Tourism Bay City in Down South)***




## 4.2 දැක්මේ ප්‍රකාශය

**සමුද්‍රවංකය**

වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති වලයාකාර පිහිටීම වැලිගම නගරයේ සංවර්ධනයට පාදක වී ඇත. වැලිගම නගරයේ කුමන ස්ථානයක සිටියද පහසුවෙන් මුහුද දර්ශනය කිරීමේ හැකියාව පවතින අතර, කිලෝ මීටර් 3.0 ක් දිග පුළුල් වෙරළ තීරය හා නොගැඹුරු මුහුද සංචාරක කර්මාන්තයට තෝතැන්නක් සේම ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය සඳහා ඉතාමත් උචිත ප්‍රදේශය ලෙස හඳුනාගත හැක. තවද, නොගැඹුරු මුහුද ධීවර යාත්‍රා වලට ආරක්ෂාව සපයනු ලබන බැවින් වෙරළ කලාපය සංචාරක කටයුතු වලට මෙන්ම ධීවර කටයුතු සඳහා ද යොදාගෙන ඇති බව සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී අනාවරණය විය. ඒ අනුව, වැලිගම වෙරළ තීරයේ පවතින පුළුල් බව හා නොගැඹුරු මුහුද සහිත වක්‍ර ස්වභාවය සංචාරක හා ධීවර කටයුතු සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි. නගරයේ ස්වභාවික ජලය ගලායාම සඳහා සකස් වී ඇති ඇළ මාර්ග පද්ධතිය සහ කාණු ගංවතුර වැනි ස්වභාවික විපත් අවම කිරීමට හේතු වී ඇත. මෙම වැලිගම බොක්කේ පිහිටීමට සමගාමීව නිර්මාණය වී ඇති ස්වභාවික ජල මාර්ග පද්ධතිය අංක 01 රූප සටහන මඟින් පෙන්නුම් කෙරේ.

**රූප සටහන 01 - වැලිගම බොක්ක සහ ජල මාර්ග පද්ධතියේ පිහිටීම**



මූලාශ්‍රය : චන්ද්‍රිකා ඡායාරූපය, 2018

**සංචාරක පාරාදීසය**

ස්වභාවික සම්පත් සහ ජලජ සම්පත් වලින් සපිරි වැලිගම නගරය සංචාරක හා ධීවර කර්මාන්තය සඳහා ඉහල විභවතාවයක් පෙන්නුම් කරනු ලබයි. වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති වලයාකාර පිහිටීම සහ නොගැඹුරු මුහුද රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණු වීම සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි. කිලෝ මීටර් 3 ක් දිග වෙරළ තීරය හා ස්වභාවික ජෛව විවිධත්වයෙන් යුත් පරිසර පද්ධතීන් වැලිගම නගරයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය වීම සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි.

දැනට පවත්නා ධීවර සහ සංචාරක කර්මාන්තය චිරස්තායී සංවර්ධනයකට යොමුකිරිම තුළින් වසර 2030 වන විට වැලිගම නගර සභා බල ප්‍රදේශය සංචාරකයින් සඳහා සියළු පහසුකම් වලින් සපිරි සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරීමත්, දේශීය ආදායම ඉහළ නැංවීමත් අරමුණු කරගෙන වැලිගම නගරය **"සුරක්ෂිත වටපිටාවක් තුලින් පිබිදෙන සොඳුරු සංචාරක පාරාදීසය"** ලෙස සංවර්ධනය මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර මෙම සංවර්ධන සැලැස්ම සකසා ඇත.

- **සුරක්ෂිත වටපිටාව** - සාමාජීය හා පාරිසරික වශයෙන් තිරසර බව ඇති කිරීම.
- **පිබිදෙන** - භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික අංශවල අඛණ්ඩ වර්ධනය
- **සොඳුරු** - භෞතික, සාමාජීය, සංස්කෘතික ලක්ෂණ විද්‍යාමාන වන පරිදි භූදර්ශනය කිරීම.
- **සංචාරක පාරාදීසය** - සංචාරකයින් සඳහා සියළු පහසුකම් වලින් සපිරි පුරවරය.

## 4.3 අරමුණු

1. වැලිගම බොක්ක පදනම් කරගත් සංචාරක නගරයක්
2. නාගරික ආර්ථිකයට ඉවහල් වන ධීවර කර්මාන්තයක්
3. දර්ශනීය වටපිටාවකින් යුත් සුව පහසු නගරයක්

## 4.4 පරමාර්ථ

**01. වැලිගම බොක්ක පදනම් කරගත් සංචාරක නගරය**

1.1 වසර 2030 වන විට ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගෙන් 5% ක් "රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාව" සඳහා ආකර්ශනය කරගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

1.2 වසර 2030 වන විට හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශවල සංවේදීතාවය හා ස්වභාවික සෞන්දර්ය ආරක්ෂා කරගනිමින්, සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශ බවට පත් කරගැනීම.

1.3 වසර 2030 වන විට සංචාරක කර්මාන්තය ආශ්‍රිත ඍජු හා වක්‍ර රැකියා 5,000 ක් බිහිකිරීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සැපයීමට සුදුසු ඉඩම් හඳුනාගැනීම.

**02. නාගරික ආර්ථිකයට ඉවහල් වන ධීවර කර්මාන්තයක්**

2.1 වසර 2030 වන විට ධීවර ක්ෂේත්‍රයේ රැකියා 3000 දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

2.2 වසර 2030 වන විට ධීවර කර්මාන්තයේ පුහුණු ශ්‍රමිකයින් 50% දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

**03. දර්ශනීය වටපිටාවකින් යුත් සුව පහසු නගරයක්**

3.1 වසර 2030 වන විට නගර මධ්‍යයේ හඳුනාගත් ජලාපවහන පද්ධතිය හා මාර්ග පද්ධතිය දියුණු කිරීම.

3.2 වසර 2030 වන විට කි.මී. 3.0 ක් වන වෙරළ තීරය විවේක හා විනෝද කටයුතු සඳහා විවෘත කිරීම.

## 5.0 ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය (ශ.දු.අ.ත. විශ්ලේෂණය) හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

අරමුණ 01 : වැලිගම බොක්ක පදනම් කරගත් සංචාරක නගරය

| | | | |
|---|---|---|---|
| **ශක්තීන්**<br>1. නගරයේ ස්වාභාවික පිහිටීම<br>2. සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් හඳුනාගත් ඉතා ජනප්‍රිය සංචාරක ගමන් මාර්ගයේ පිහිටා තිබීම.<br>3. මැරියට්, කේප් රිසෝට්, බේ රිසෝට් වැනි ප්‍රසිද්ධ හෝටල් පිහිටා තිබීම.<br>4. සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි රජයේ සහ පුද්ගලික අංශයේ හිස් ඉඩම් සියයට 12.8% පැවතීම.<br>5. ජීවිතාරක්ෂක බලකායක් වෙරළ කලාපය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරිම.<br>6. වැලිගම නාගරික සංවර්ධන ප්‍රදේශය ආශ්‍රිතව ස්වභාවික ආකර්ශනයකින් හා ජෛව විවිධත්වයකින් යුත් ප්‍රදේශ පැවතීම. | ශ | දු | **දුර්වලතා**<br>1. වෙරළ තීරය අපිරිසිදු ස්වභාවයෙන් යුක්ත වීම.<br>2. රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා අවශ්‍ය පහසුකම් හා සුදුසුකම්ලත් පුහුණුකරුවන් නොමැතිවීම. |
| **අවස්ථා**<br>1. සංචාරකයින් මෙරටට පැමිණීමේ ක්‍රමික වර්ධනය.<br>2. සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරන ලද 2017 – 2030 උපාය මාර්ගික සංචාරක සංවර්ධන සැලසුම මඟින් අනාගත සංචාරක විභවතාවයක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගැනීම.<br>3. මිරිස්ස ධීවර වරාය මඟින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිල් තල්මසුන් නැරඹීමට පහසුකම් සැපයීම. | අ | ත | **තර්ජන**<br>1. වැලිගම නගරයට ආසන්නව පිහිටි මිරිස්ස, උණවටුන, පොල්හේන වැනි සංචාරක ප්‍රදේශයන් පැවතීම. |

**අරමුණ 01 : වැලිගම බොක්ක පදනම් කරගත් සංචාරක නගරය**

**ශක්තීන්**

**1. වැලිගම නගර සහා බල ප්‍රදේශයේ ස්වාභාවික පිහිටීම.**

**සිතියම් අංක 06 : වැලිගම නගරයේ ස්වාභාවික පිහිටීම**



මූලාශ්‍රය :Google Earth ,2018

සිතියම් අංක 06 හි දක්වා ඇති පරිදි, වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති වැලිගම නගරය පාරිසරික වැදගත්කමක් ඇති කිලෝ මීටර් 3.0 ක් පමණ දිග වෙරළ තීරයකින් යුක්ත වන අතර, වෙරළාශ්‍රිත පරිසර පද්ධතීන් සහිත රාක්ෂමූණ, ගංදුව වැනි දූපත් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ වෙරළ තීරයන් අතුරින් සර්ෆින් ක්‍රීඩාවට වඩාත්ම උචිත රළ සහිත වෙරළ තීරයක් ලෙස වැලිගම වෙරළ තීරය ප්‍රසිද්ධියක් උසුලයි. දැනට පැළැන වෙරළ තීරය සහ මිදිගම වෙරළ තීරය රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා යොදාගනු ලබන අතර, ඡායාරූප අංක 14 හි පෙන්වා ඇති පැළැන ප්‍රදේශයට වැඩි විදෙස් සංචාරකයින් ප්‍රමාණයක් පැමිණෙන බව ක්ෂේත්‍ර සමීක්ෂණ වලදී අනාවරණය විය.

**ඡායාරූප 14 : පැළැන මුහුදු තීරය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**2. ඉතා ජනප්‍රිය සංචාරක ගමන් මාර්ගයේ පිහිටා තිබීම.**

සිතියම් අංක 07 හි දැක්වෙන පරිදි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයින් දිවයිනේ රැඳී සිටින කාලය පදනම් කරගෙන හඳුන්වා දී ඇති දින 07 දින 11 සහ දින 14 ගමන් මාර්ග ආවරණය වන ලෙස වැලිගම නගරය පිහිටා තිබීම සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරිම සඳහා ප්‍රබල ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 07 : සංචාරක ගමන් මාර්ග**





මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය

**3. සංචාරක හෝටල් පැවතීම.**

වැලිගම නගරයේ සංචාරක ව්‍යාපාරය වැඩි වශයෙන් වෙරළ ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇත. බල ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා විවිධ තරු පන්තීන්ට අයත් හෝටල්, ලැගුම්හල්, තානායම් හා ආපනශාලා ආදිය ඉදිකර ඇත. සංචාරකයින් සඳහා සේවා සපයන ආයතන අතර හෝටල් සඳහා ප්‍රමුඛතාවයක් හිමි වී ඇත. ප්‍රදේශයේ පවතින සමස්ත සංචාරක කටයුතු සඳහා භාවිතා වී ඇති කාමර සංඛ්‍යාවෙන් සියයට 68 ක් සංචාරක හෝටල් සතු වන අතර, එම සංචාරක හෝටල්හි සේවය කරන සේවක සංඛ්‍යාව 623 පමණ වේ. කාමර 200කින් සමන්විත මැරියට් හෝටලය වැලිගම පැලැන ප්‍රදේශයේ පිහිටා ඇති අතර, කාමර 90ක් හා විලා 45කින් සමන්විත වැලිගම කේප් රිසෝට් හෝටලය කප්පරතොට ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම හෝටල් වල පිහිටීම වැලිගම නගරයේ සංචාරක කර්මාන්තයට මනා දායකත්වයක් සපයනු ලබයි. 2012 වසර සිට 2017 වසර දක්වා වැලිගම ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය පහත දැක්වෙන ප්‍රස්ථාර අංක 02 මඟින් පෙන්වා ඇති අතර, කේප් රිසෝට් සහ මැරියට් හෝටල් වල වර්තමාන තත්ත්වය ඡායාරූප අංක 15 මඟින් පෙන්වා ඇත.

**ප්‍රස්ථාර අංක 02 : සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය 2012 - 2017**




මූලාශ්‍රය : **ක්ෂේත්‍ර සමීක්ෂණය,2017**

**ඡායාරූප 15 : ප්‍රධාන සංචාරක හෝටල්**




මූලාශ්‍රය : https://nashaplaneta.net/en/asia/srilanka/weligama

**4. වෙරළාශ්‍රිත ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදාගත හැකි රජයේ ඉඩම් පැවතීම.**

වැලිගම නගර සහා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි බිම් කොටස් පොල්අතුමෝදර ගඟ සහ වෙරළ කලාප ආශ්‍රිතව පිහිටා තිබීම ප්‍රබල විභවතාවයක් ලෙස හඳුනාගත හැක. සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි රජයේ ඉඩම් හෙක්. 57.81ක් හෙවත් සියයට 11 ක් පමණ පැවතීම ප්‍රබල විභවතාවයක් වන අතර, එම ඉඩම්වල පිහිටීම සිතියම් අංක 08 මඟින් පෙන්වා ඇත.

සිතියම් අංක 08 : සංවර්ධනයට යොදාගත හැකි රජයේ ඉඩම්වල පිහිටීම



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තා,2018

**5. ජීවිතාරක්ෂක බලකායක් වෙරළාශ්‍රිත ප්‍රදේශයේ ක්‍රියාත්මක වීම.**

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක වෙරළ තීරයන් තුළ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක බලකායේ උප මධ්‍යස්ථාන ස්ථානගත කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් පසුව වැලිගම නගර සභා බල ප්‍රදේශය සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය කිරිම සඳහා වෘත්තීය ජීවිතාරක්ෂකයන් වැලිගම මිරිස්ස ප්‍රදේශයේ ස්ථානගත කර ඇති අතර, සුදුසුකම්ලත් ජීවිතාරක්ෂකයින් සේවයේ යොදවා ඇති බැවින් මෙම වෙරළ තීරයේ සංචාරය කරන දේශීය හා විදේශීය සංචාරකයන් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සේවයේ යොදවා ඇති ජීවිතාරක්ෂකයන්ගේ විශිෂ්ඨ සේවය හා කැපවීම ප්‍රශංසාවට ලක් කර ඇත. මේ වන විට ජීවිත විශාල සංඛ්‍යාවක් මෙම බලකාය මඟින් බේරා ගෙන ඇත.

**දුර්වලතා**

**1. වෙරළ තීරය අපිරිසිදු ස්වභාවයෙන් යුක්ත වීම.**

වැලිගම වෙරළ තීරයේ පවතින නොගැඹුරු මුහුද සංචාරක කර්මාන්තට මෙන්ම ධිවර කර්මාන්තයටද එකසේ වැදගත් වේ. ජන සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මඟින් 2011 වසරේ නිකුත් කරන ලද සංගණන වාර්තා වලට අනුව නගරසභා බල ප්‍රදේශයේ වාසය කරන මුළු ජනගහනයෙන් 1/4 ක් පමණ ධීවර හා සංචාරක කටයුතු සඳහා යොමු වී ඇත. එහෙත් මෙම කටයුතු වල නිරත වන ධීවර කණ්ඩායම් හෝ අදාල ආයතන වෙරළ ප්‍රදේශයේ පවතින තත්ත්වය පිළිබඳ නිසි සැලකිල්ලක් යොමු නොකිරිම හේතුවෙන් වෙරළේ තැනින් තැන අපද්‍රව්‍ය බැහැර කරලීමටත් නිසි ක්‍රමවේදයක් නොමැතිව ඔරු බෝට්ටු නවතා තැබීමටත් පෙළඹී ඇත. ඡායාරූප අංක 16 මඟින් වැලිගම වෙරළේ තැනින් තැන ඔරු බෝට්ටු නවතා ඇති ආකාරය පෙන්වා ඇත.

**ඡායාරූප 16 : වැලිගම වෙරළ තීරය**






මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**2. රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා අවශ්‍ය පහසුකම් හා සුදුසුකම්ලත් පුහුණුකරුවන් නොමැතිවීම.**

වැලිගම පැලැන මුහුදු තීරය වක්‍රාකාරව පිහිටා ඇති බැවින්, රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණුවීම සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි. ක්ෂේත්‍ර සමීක්ෂණ වලට අනුව සංචාරක සමයේ දිනකට දෙස් විදෙස් සංචාරකයින් 150 ක් පමණ මෙම ක්‍රීඩාව පුහුණුවීම සහ විනෝදාංශයක් ලෙස ක්‍රීඩා කිරිම සඳහා වැලිගම වෙරළ තීරයට පැමිණේ. ඡායාරූප අංක 17 හි දක්වා ඇති පරිදි එම සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා තාවකාලික වෙළඳ කුටි 33 ක් පමණ ඉදිකර ඇත. මෙම ක්‍රීඩාව පුහුණු කිරීම සඳහා විධිමත් පුහුණුවක් ලැබූ පුහුණුකරුවන් නොමැති අතර, නුපුහුණු පුහුණුකරුවන් දිනකට 10 දෙනෙකු පමණ දැනට

මෙම ප්‍රදේශයේ රළමත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණු කිරිමේ නිරතව සිටී. ඒ සඳහා පහසුකම් සපයන කණ්ඩායම් මගින් විමසීම් කිරීමේදී අනාවරණය වූයේ අදාල පුහුණුවීම් කටයුතු සඳහා ඕස්ට්‍රේලියාව වැනි විදේශ රටවල්වලට යායුතු බවත් ඒ සඳහා අධික මුදලක් වැයකල යුතු බවත්ය.

**ඡායාරූප 17 : පැළැන වෙරළ තීරය**







මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

අවස්ථා

**1. සංචාරකයින් මෙරටට පැමිණීමේ ක්‍රමික වර්ධනය.**

වැලිගම නගර සහා බල ප්‍රදේශයේ සංචාරක හෝටල් පිළිබඳව කරන ලද සමීක්ෂණය පරිදි ඔක්තෝබර් සිට මාර්තු මාසය දක්වා කාල සීමාව තුළදී සංචාරක හෝටල් කාමර භාවිත ප්‍රතිශතය සියයට 95 ක් පමණ වේ. එංගලන්තය, ඕස්ට්‍රේලියාව, රුසියාව වැනි රටවල සීත සෘතුව උදාවීමත් සමඟම එම රටවල සංචාරකයින් මෙරටට පැමිණේ. එසේ පැමිණෙන සංචාරකයින්ගෙන් කොටසක් වැලිගම නගරයේද නවාතැන් ගැනීම මෙයට හේතු වී ඇත. අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සංචාරක රාත්‍රීන් භාවිතය සියයට 44 දක්වා අඩු වී ඇත. එයට හේතු වී ඇත්තේ මෙම කාල සීමාව තුළ විදේශීය සංචාරකයින් මෙරට පැමිණීම අඩුවීමයි. වැලිගම නගර සහා බල ප්‍රදේශයේ සංචාරක රාත්‍රීන් ගණන පහත ප්‍රස්ථාරය මඟින් දක්වා ඇති අතර, 2010 වසරේ සිට 2017 වසර දක්වා සංචාරකයින්ගේ පැමිණීම පහත අංක 03 ප්‍රස්ථාරය මඟින් පෙන්වා ඇත.

**ප්‍රස්ථාර අංක 03 : ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව (2010 – 2017)**





මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය

**2. අනාගත සංවර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන සැලසුම්**


ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ සිතියම් අංක 09 දරණ ජාතික භෞතික ව්‍යුහසැලැස්මට අනුව වැලිගම නගරය නාගරික මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර, සිතියම් අංක 10 හි දැක්වෙන පරිදි සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරන ලද 2017 – 2030 උපාය මාර්ගික සංචාරක සංවර්ධන සැලසුම් මඟින් අනාගත සංචාරක විභවතාවයක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 09 : ජාතික භෞතික ව්‍යුහසැලැස්ම 2050**




මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2050

**සිතියම් අංක 10 : නවාතැන් පහසුකම් වල පිහිටීම 2017**




මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය, 2017

**3. ස්වභාවික ආකර්ශනයකින් හා ජෛව විවිධත්වයකින් යුක්ත ස්ථාන පැවතීම.**

වැලිගම නාගරික සංවර්ධන ප්‍රදේශය ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට යොදා ගත හැකි ස්වභාවික ආකර්ශනයක් හා ජෛව විවිධත්වයකින් හෙබි රුමස්සල, මඩොල් දූව, බොරාල වැව හා ගරාඩුව කලපුව පිහිටා තිබීම වැලිගම නාගරික සංවර්ධන අවස්ථාවක් ලෙස හඳුනාගැනීමට පුළුවන. මෙම ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයින් වැලිගම නගරයට ආකර්ශනය කරගැනීම සංවර්ධන සැලැස්මේ අරමුණක් වේ. මෙම ස්ථාන ඡායාරූප අංක 18 මගින් දක්වා ඇත.

**ඡායාරූප 18 : ස්වභාවික ආකර්ශනයක් සහිත ජෛව විවිධත්වයෙන් යුත් ස්ථාන**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**4. මිරිස්ස ධීවර වරාය මගින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිල් තල්මසුන් නැරඹීමට පහසුකම් සැපයීම.**

වැලිගම නගරයේ සිට කිලෝ මීටර් 5.0 ක් පමණ ඈතින් පිහිටි මිරිස්ස ප්‍රදේශය නිල් තල් මසුන් බහුල ප්‍රදේශයකි. එම ප්‍රදේශය දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රසිද්ධියට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ නොවැම්බර් සිට අප්‍රේල් දක්වා කාල සීමාව තුළ නිල් තල් මසුන් බහුලව ගැවසෙන අතර, මෙම කාල සීමාවේ උණුසුම් ජලය සොයා නිල් තල් මසුන් ජලය මතුපිටට පැමිණීම සිදුවේ. එම කාල සීමාව තුළදී දිනකට සංචාරකයින් 500 කට අධික ප්‍රමාණයක් නිල් තල්මසුන් නැරඹීර සඳහා මිරිස්ස ධීවර වරායට පැමිණේ. වැලිගම නගර සංවර්ධනයේදී එය ප්‍රධාන අවස්ථාවක් ලෙස හඳුනාගත හැක. මිරිස්ස ධීවර වරායෙන් නිල් තල් මසුන් නැරඹීම සඳහා පිටත් වූ සංචාරකයින්ගේ ඡායාරූප අංක 19 දරණ ඡායාරූපය මඟින් පෙන්වා ඇත.

**ඡායාරූප 19 : නිල් තල්මසුන් නැරඹීම**





මූලාශ්‍රය : https://nashaplaneta.net/en/asia/srilanka/weligama

**තර්ජන**

1. **සංචාරක ආකර්ශනයක් සහිත වෙනත් වෙරළ තීර වැලිගම නගරයට ආසන්නව පැවතීම.**

වැලිගම නගරයේ සිට කිලෝමීටර් 05 ක් පමණ දුරින් මිරිස්ස වෙරළ තීරය පිහිටා ඇති අතර, කිලෝමීටර් 23 ක් පමණ දුරින් උණවටුන වෙරළ තීරය පිහිටා ඇත. මෙම වෙරළ තීරය ගාල්ල නගරයට ඉතා ආසන්නව පිහිටා ඇති බැවින් ගාල්ල නගරයේ තිබෙන ඓතිහාසික කොටුව සහ ඒ ආශ්‍රිතව පවත්නා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන නැරඹීමට අවස්ථාව සැලසෙන අතර, උණවටුන වෙරළ තීරයේ පවතින මද රළ සහිත ස්වභාවය දිය නෑමට සහ ජල ක්‍රීඩා කිරීම සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබයි. එබැවින් මෙම වෙරළ කලාපයට පැමිණෙන සංචාරකයින්ගෙන් සියයට 38 ක් පමණ උණවටුන වෙරළ තීරය කරා ඇදී යන බව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තා වලට අනුව තහවුරු වී ඇත.

පුළුල් වෙරළක් හා මද රළ සහිත ස්වභාවයකින් යුක්ත මිරිස්ස වෙරළ තීරය දිය නෑමට සහ විවේකීව ගතකිරීමට උචිත පරිසරයක් සහිතව පිහිටා ඇත. මෙහි පවත්නා සුවදායී පරිසරය වැලිගම කලාපයට පැමිණෙන සංචාරකයින්ගෙන් 60% ක් පමණ මිරිස්ස ප්‍රදේශය වෙත ඇදී යාමේ ප්‍රවනාතවයක් ඇති බව සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් හඳුනාගෙන ඇත.

උණවටුන හා මිරිස්ස වෙරළ තීර සමඟ සසඳා බැලීමේදී වැලිගම බොක්ක ආශ්‍රිත ප්‍රදේශය රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා මනා ප්‍රවේශකත්වයක් සැපයුවද ධීවර කර්මාන්තය සඳහා මෙම ප්‍රදේශය යොදාගැනීම සංචාරක කටයුතු පවත්වාගෙන යාමේදී භෞතික හා සමාජීය ගැටළු ඇති වීමට හේතුවී ඇත. වැලිගම නගරයට ආසන්න වෙරළ තීර ඡායාරූප අංක 20 මඟින් පෙන්වා ඇත.

**ඡායාරූප 20 : වැලිගම නගරයට ආසන්න වෙරළ තීර**




මූලාශ්‍රය : https://nashaplaneta.net/en/asia/srilanka/weligama

**අරමුණු 02 : නාගරික ආර්ථිකයට ඉවහල් වන ධීවර කර්මාන්තයක්**

| | | | |
|---|---|---|---|
| **ශක්තීන්**<br>1. ප්‍රදේශයේ ජීවත් වන ජන සංඛ්‍යාවෙන් 28% ක් (1650) පමණ ධීවර ක්ෂේත්‍රයේ නියැලීම හා වැලිගම නගරය ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම.<br><br>2. කප්පරතොට ධීවර ජැටියක් පැවතීම හා වෙරළ තීරයේ මාළු වෙළඳසැල් 16 ක් පැවතී<br>3. ම.<br><br>4. “රිටි පන්න” ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම හා විවිධාංගීකරණය කරන ලද මත්ස්‍ය නිෂ්පාදන අලෙවියට යොදාගත හැකිවීම. | **ශ** | **දු** | **දුර්වලතා**<br>1. ධීවර ජැටියක් පැවතියද සියළු බෝට්ටු එම ස්ථානයේ නවතා තැබීමට නොහැකි වීම.<br><br>2. ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම සඳහා දැනුම නොමැතිවීම. |
| **අවස්ථා**<br><br>1. විදේශීය සංචාරකයින් රිටි පන්න ධීවර කර්මාන්තය සහ නැවුම් මාළු නිෂ්පාදනය කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීම.<br><br>2. මිරිස්ස ප්‍රදේශයේ ධීවර වරායක් පිහිටා තිබීම. | **අ** | **ත** | තර්ජන<br>- |

ප්‍රබලතා


1. **ප්‍රදේශයේ ජීවත් වන ජන සංඛ්‍යාවෙන් 28% ක් (1650) පමණ ධීවර ක්ෂේත්‍රයේ නියැලීම හා වැලිගම නගරය ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම.**

වැලිගම නගර සභා බල ප්‍රදේශය කිලෝමීටර් 3 ක් පමණ දිගු වෙරළතීරයකින් යුක්ත වන අතර, එහි වෙසෙන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත්තේ ධීවර කර්මාන්තයයි. මහවීදිය, කුඩා පොළ ආශ්‍රිතව ධීවර තොටුපොළවල් 2 ක් පිහිටා ඇති අතර,කප්පරතොට ධීවර ජැටියක් ඉදිකර ඇත.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද වාර්තා වලට අනුව 2017 වසරේ වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ නියැලෙන පවුල් සංඛ්‍යාව 1,440 ක් වන අතර එම පවුල් අතරින් ඍජු ලෙස ධීවර කර්මාන්තයේ නියැලෙන පවුල් සංඛ්‍යාව 844 කි. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාව සලකා බැලීමේදී ධීවර කර්මාන්තයේ නියලෙන පවුල් සංඛ්‍යාව 29% ක් පමණ වේ. ඒ අනුව මෙම ප්‍රදේශයේ ජීවත්වන මුළු ධීවර ජන සංඛ්‍යාව 6423 කි. නගරයේ ජනතාවගෙන් 28% ක් ධීවර කටයුතු වල නියැලීම තුලින් නගරයේ ආර්ථිකය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදේ.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මාතර දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ධීවර කර්මාන්තය සඳහා යෙදවී ඇති මුළු යාත්‍රා ප්‍රමාණය 340 කි. ඉන් බහුදින යාත්‍රා 79 ක්ද, එක්දින යාත්‍රා 28 ක්ද, ෆයිබර් ග්ලාස් ඔරු 70 ක්ද, එන්ජින් ඔරු 128 ක්ද, හබල් භාවිතා කරන ඔරු 35ක් ද වේ. මෙම යාත්‍රා භාවිතය තුළින් 2017 වර්ෂයේ මුළු මාළු නිෂ්පාදනය ප්‍රස්ථාර අංක 04 සහ ඡායාරූප අංක 21 මඟින් පෙන්නුම් කෙරේ.

**ප්‍රස්ථාර අංක 04 : මාළු නිෂ්පාදනය -2017**




මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාතර දිස්ත්‍රික් කාර්යාලය. 2017

**ඡායාරූප 21 : මිරිස්ස ධීවර වරාය**



මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාතර දිස්ත්‍රික් කාර්යාලය. 2017

**2. කප්පරතොට ධීවර නැංගුරම් පොල පැවතීම හා වෙරළ තීරයේ මාළු වෙළඳසැල් 16 ක් පැවතීම.**

කප්පරතොට ධීවර නැංගුරම් පොල මේ වන විට සංවර්ධනය කර තිබුනද, එය ධීවර කටයුතු සඳහා අදාලවන බෝට්ටුවලින් කොටසක් පමණක් නවතා තැබීමේ ස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. එහෙත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ධීවර සංස්ථාවේ එකගතාවය මත දිය කඩනයක් ඉදිකිරීම මගින් මෙම ප්‍රදේශයේ පවත්නා සියළුම ධීවර බෝට්ටු මෙම ස්ථානයට යොමු කිරීමේ හැකියාව පවතින අතර, නිල් තල් මසුන් නැරඹීම සඳහා අදාල බෝට්ටු නවතා තැබීම සහ ගමන් ආරම්භ කිරීම සඳහා මෙම ජැටිය යොදාගත හැක. ඡායාරූප අංක 22 මගින් කප්පරතොට ධීවර නැංගුරම්පොලහි වර්තමාන තත්ත්වය පෙන්නුම් කෙරේ.

**ඡායාරූප 22 : කප්පරතොට ධීවර නැංගුරම් පොල**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

වැලිගම වෙරළ ආශ්‍රිතව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහය මත නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකරන ලද මාළු වෙළඳසැල් 16 ක් පවතින අතර, එම වෙළඳසැල් සංචාරක කටයුතු සඳහා යොදාගත හැක. මාළු වෙළඳ සැල් මාළු අලෙවි කිරීමේ කටයුතු වලට අමතරව, නිමි භාණ්ඩ අලෙවි කිරීම, බීරළු රේන්ද විකිණීම, සැකසූ ආහාර අලෙවි කිරීම වැනි කටයුතු වලට යොදාගෙන ඇත. එබැවින්, එම වෙළඳසැල් සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අදාල වන කටයුතු වලට යොදාගත හැක. එම මාළු වෙළසැල් ඡායාරූප අංක 23 මගින් පෙන්නුම් කෙරේ

**ඡායාරූප 23 : වැලිගම වෙරළ තීරයේ ඉදිකර ඇති මාළු වෙළඳසැල්**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**3. "රිටි පන්න" ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම හා විවිධාංගීකරණය කරන ලද මත්ස්‍ය නිෂ්පාදන අලෙවියට යොදාගත හැකිවීම.**

වැලිගම ප්‍රදේශය අතීතයේ සිට රිටිපන්න ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලා තිබෙන බැවින් එය සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා යොදාගත හැක. සංචාරකයින්ට රිටිපන්න ධීවර කර්මාන්තය මඟින් මාළු බෑම සඳහා අවස්ථාව උදාකරදීම තුලින් අමතර ආදායමක් උපයාගත හැකි අතර, සංචාරකයින් හට නව අත්දැකීම් අත්විදීමට ද අවස්ථාව සැලසේ.

මේ වන විට වැලිගම නගරයට පැමිණෙන සංචාරකයින් පැයකට රු. 200 ක් ගෙවා රිටි පන්න ධීවර කර්මාන්තයේ නියැලී සිටින ආකාරය කප්පරතොට සහ මිදිගම වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශයේ දක්නට ඇත. දෙස් විදෙස් සංචාරකයින් රිටි පන්න ධීවර කර්මාන්තයේ යෙදී සිටින ආකාරය අංක 24 ඡායාරූපය මගින් පෙන්වා ඇත.

**ඡායාරූප 24 : රිටිපන්න ධීවර කර්මාන්තය**





මූලාශ්‍රය : https://lanka.com/about/interests/stilt-fishing/

**දුර්වලතා**

1. **ධීවර ජැටියක් පැවතියද ධීවර කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් නොමැතිවීම.**

   දැනට කප්පරතොට ධීවර වරායට අයත් ලියාපදිංචි බෝට්ටු 402 ක් ඇති අතර, ඒවායින් බහුදින ධීවර යාත්‍රා 85 ක්ද, එක්දින බෝට්ටු 07ක්ද, ප්ලාස්ටික් බෝට්ටු (පිටත එන්ජිම සහිත) 60ක් ද වේ. වැලිගම කප්පරතොට අළුතින් ඉදිකරන ලද ධීවර ජැටිය ආශ්‍රිත ප්‍රදේශයේ මුහුද ගැඹුරු බැවින් ධීවර බෝට්ටු සඳහා ආරක්ෂාව සැපයීම ගැටළුවක් වී ඇත. එබැවින් ධීවර බෝට්ටු එම ස්ථානයේ නවතා තැබීමට නොහැකි වී ඇත. තවද, ධීවර ජැටියකට අවශ්‍ය ඉන්ධන පිරවුම්හලක්, අයිස් ගබඩාවක්, සනීපාරක්ෂක හා අපරවයුහ පහසුකම් සපයා නොමැත.

2. **ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරිම සඳහා දැනුම නොමැතිවිම.**

   වැලිගම නගර සහා බල ප්‍රදේශයේ වාසය කරන මුළු ජනගහනයෙන් 28% ක් පමණ ධීවර ක්ෂේත්‍රෙය් නියැලී ඇත. මෙයින් සමහර ධීවරයින් සඳහා නිසි අධ්‍යාපනයක් නොමැතිකමින් නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරිමට මැලිකමක් දක්වති.

**අවස්ථා**


1. **විදේශීය සංචාරකයින් රිටි පන්න ධීවර කර්මාන්තය සහ නැවුම් මාළු නිෂ්පාදනය කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීම.**

   වැලිගම ප්‍රදේශයේ සංචාරක කටයුතු සඳහා පැමිණෙන විදේශීය සංචාරකයින් රිටිපන්න ධීවර කර්මාන්තය කෙරෙහි දැඩි ඇල්මක් දක්වන අතර, ඔවුන් ද එම ක්‍රම අනුගමණය කරමින් මාළු ඇල්ලීමේ කටයුතු වල නිරත වන අතර, එසේ අල්ලා ගන්නා මසුන් විවිධ ක්‍රම වලට සකසා අනුභව කිරිමටද කැමැත්තක් දක්වති.

2. **මිරිස්ස ප්‍රදේශයේ ධීවර වරායක් පිහිටා තිබීම.**

   වැලිගම නගරයේ සිට කිලෝමීටර් 05ක් පමණ නැගෙනහිර දෙසින් පිහිටි මිරිස්ස ධීවර වරාය වැලිගම නගර සහා බල ප්‍රදේශයේ වාසය කරන ධීවර ජනතාව බහුදින ධීවර යාත්‍රා දියත් කිරිම සඳහා උපයෝගී කරගනු ලැබේ. ඡායාරූප අංක 25 හි දැක්වෙන මිරිස්ස ධීවර වරායට අයත් ලියාපදිංචි බෝට්ටු 518 ක් ඇති අතර, ඒවායින් බහුදින ධීවර යාත්‍රා 184ක්ද, එක්දින බෝට්ටු 15 ක්ද, ෆයිබර් බෝට්ටු (පිටත එන්ජිම සහිත) 165 ක් ද වේ. ප්‍රස්ථාර අංක 05 හි දක්වා ඇති පරිදි, මත්ස්‍ය නිෂ්පාදනය පිළිබඳ සලකා බැලීමේදී මාතර දිස්ත්‍රික්කයේ අනෙකුත් ධීවර වරායන්ට සාපේක්ෂව මිරිස්ස ධීවර වරායෙන් වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් පෙන්නුම් කරයි.

**ප්‍රස්ථාර අංක 05 : වැලිගම නගරය ආසන්න ප්‍රදේශවල මත්ස්‍ය නිෂ්පාදනය**




මූලාශ්‍රය : ධීවර සංස්ථාව - 2017

**ඡායාරූප 25 : මිරිස්ස ධීවර වරාය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**අරමුණු 03 : දර්ශනීය වටපිටාවකින් යුත් සුව පහසු නගරයක්**

| | | | |
|---|---|---|---|
| **ශක්තීන්**<br>1. නගරයේ ස්වභාවික පිහිටීම.<br>2. පහසු ප්‍රවේශකත්වය.<br>3. පොල්අතුමෝදර ගඟ, ස්වභාවික ඇළ මාර්ග සහ කප්පරතොට කලපුව පිහිටා තිබීම නිසා ගංවතුර ඇතිවීම පාලනය වීම. | ශ | දු | **දුර්වලතා**<br>1. අපරවයුහ පහසුකම් නිසි පරිදි සංවර්ධනය නොවීම.<br>2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නුසුදුසු ස්ථානයක පවත්වාගෙන යාම.<br>3. අපජලය හා මළ අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා සකස් කර ඇති ඇළ මාර්ග සහ කාණු වෙත යොමු කිරිම. |
| **අවස්ථා**<br>1. වැලිගම නගරය ආසන්නයේ කර්මාන්ත කලාප 03ක් පැවතීම.<br>2. ගාල්ල පරිපාලන නගරය හා මාතර වාණිජ නගරය ආසන්නව පිහිටා තිබීම. | අ | ත | තර්ජන<br>- |

**ශක්තීන්**

**1. නගරයේ ස්වභාවික පිහිටීම**

වැලිගම නගරය දකුණු ලක ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය වන මාතර නගරයේ සිට කි.මී. 18.0 ක් සහ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන ගාල්ල නගරයේ සිට කි.මී. 28 ක් දුරින් පිහිටා තිබීම නිසා වාණිජ කටයුතු සහ පරිපාලන කටයුතු මෙන්ම අනෙකුත් දෛනික අවශ්‍යතා සඳහා පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඇත. තවද, වැසි ජලය ගලායාම සඳහා ස්වභාවිකව නිර්මාණය වී ඇති කාණු පද්ධතිය ගංවතුර වැනි ස්වභාවික ව්‍යසන වලින් නේවාසිකයින් ආරක්ෂා කරන අතර, දඹ, තුඩු සහ පුළුල් වෙරළ තීරයකින් සමන්විත වැලිගම බොක්ක ධීවර හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වේ.

**2. පහසු ප්‍රවේශකත්වය**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වෙරළට මායිම්ව පිහිටා ඇති වැලිගම නගරය මුහුදුබඩ මහා මාර්ගය, දුම්රිය මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ කොළඹ ප්‍රධාන අගනගරය හා සම්බන්ධ වන අතර, කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානයේ සිට කිලෝ මීටර් 6 ක් පමණ ආසන්නයේ පිහිටා ඇත. මුහුදුබඩ මහා මාර්ගය ඔස්සේ කොළඹ - හම්බන්තොට හා මොනරාගල දිස්ත්‍රික්ක සමඟ සම්බන්ධ වන අතර වැලිගම අකුරැස්ස මාර්ගයෙන් අකුරැස්ස, දෙනියාය හා රත්නපුර දක්වා රට අභ්‍යන්තරය සමඟ පවතින මනා සම්බන්ධතාවයක් පවත්වනු

ලබයි. ඒ අනුව, අකුරැස්ස - වැලිගම, ඉමදූව - වැලිගම, කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය හා දුම්රිය මාර්ගය වැලිගම නගරය සඳහා ප්‍රවේශකත්වය සපයන ආකාරය සිතියම් අංක 11 මගින් පෙන්නුම් කරයි.

**3. පොල්අතුමෝදර ගඟ, ස්වභාවික ඇළ මාර්ග සහ කප්පරතොට කලපුව පිහිටා තිබීම නිසා ගංවතුර ඇතිවීම පාලනය වීම.**

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ නැගෙනහිර මායිමේ පොල්අතුමෝදර ගඟ පිහිටා ඇති අතර, මුළු නාගරික ප්‍රදේශයම ආවරණය වන පරිදි යාංඕඩය ඇළ, අග්‍රබෝධි ඇළ, පොල්කඳන් ඇළ සහ රුකුලේ ඇළ පිහිටා ඇති අතර, කප්පරතොට කලපුව ගාලු පාරට මායිම්ව පිහිටා ඇත. වැලිගම නගර සභා බල ප්‍රදේශය මුහුදු මට්ටමේ පිහිටියද ප්‍රදේශයේ පවතින ඇළ මාර්ග පද්ධතියේ හා කලපුව, නාගරික ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයක් ඇතිවීම පාලනය කිරීමට උපකාරී වේ. කප්පරතොට කලපුව සහ පොල්වතුමෝදර ගඟ වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ගංවතුර ආපදාවට ලක්වන ප්‍රදේශ සිතියම් අංක 12 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 11 : පවත්නා මාර්ග ජාලය**




**යොමුව**

- ඒ ශ්‍රේණියේ මාර්ග
- බී ශ්‍රේණියේ මාර්ග
- සී සහ ඩී ශ්‍රේණියේ මාර්ග
- දුම්රිය මාර්ගය
- වැලිගම නගර සභා සීමාව

1:16,000

**පවත්නා මාර්ග ජාලය - 2018**
**වැලිගම නගරසභා බල ප්‍රදේශය**


**සිතියම් අංක : 11**

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කළේ | : ජේ.බී.බී. ජීවන්ද්‍ර |

නාගරික සංවර්ධන අධිකාරිය
මාතර දිස්ත්‍රික් කාර්යාලය

වැලිගම නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

**සිතියම් අංක 12 : ගංවතුරට ලක්වන ප්‍රදේශ**



**දුර්වලතා**

**1. අපරව්‍යුහ පහසුකම් නිසි පරිදි සංවර්ධනය නොවීම.**

- **ඇළ මාර්ගවල ජලය බැස නොයාම.**

වැලිගම නගර මධ්‍ය ප්‍රදේශය මුහුදු මට්ටමේ පිහිටා ඇති මද බෑවුම් සහිත ප්‍රදේශයකි. මෙහි ජලය බැසයාම සඳහා කාණු ඉදිකර තිබුණද එම කාණුවල තාක්ෂණික දෝෂ පැවතීම හේතුවෙන් ජලය විධිමත් පරිදි බැසයාමක් සිදුනොවන අතර, පවතින කාණුවල බොහෝ කලක් ජලය රැඳී පැවතීම හේතුවෙන් රෝග පැතිරීයාම හා නගර මධ්‍ය ප්‍රදේශයේ වාතය අපිරිසිදුවීමට ප්‍රබල සාධකයක් වී ඇත. නගර සභා බල ප්‍රදේශයේ මුළු භූමියෙන් 40% ක්ද මුළු ජනගහනයෙන් 31% ක්ද මුළු නිවාස ඒකක සංඛ්‍යාවෙන් 31% ක් ද මෙම ප්‍රදේශය තුල පිහිටා ඇත. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ මුහුදු මට්ටමේ පිහිටි භූමිය ඡායාරූප අංක 26 මඟින් පෙන්වා ඇත.

**ඡායාරූප 26 : ජලය බැස නොයාම**






මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

- **මාර්ග පටුවීම සහ මාර්ග දෙපස රථවාහන ගාල් කිරිම.**

වැලිගම නගර සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති මාර්ග නිසි ප්‍රමිතීන්ට අනුව ඉදිකර නොමැති අතර, අධික වේගයෙන් වාහන ගමනාගමනය සිදුකරන බැවින් හා ප්‍රධාන මාර්ගවල පදික මංතීරු නොමැති බැවින් පදිකයින්ගේ ආරක්ෂාවට තර්ජනයක් මතුවී ඇත. ප්‍රධාන මාර්ග දෙපස ඉදිකර ඇති වාණිජ ගොඩනැගිලි රථවාහන නැවතුම් ස්ථාන රහිතව ඉදිකර ඇති අතර, එම ස්ථාන සඳහා පැමිණෙන ගණුදෙනුකරුවන් ප්‍රධාන මාර්ගය දෙපස වාහන නැවැත්වීම හේතුවෙන්, වාහන ගමනාගමනය සඳහා ගැටළු මතුවී ඇත. මෙම කාර්ය බහුල වේලාවන් තුලදී ප්‍රධාන මාර්ග වන බොරාල මාර්ගය, අකුරැස්ස මාර්ගය, හෙට්ටිවීදිය සහ පරණ ගාලු පාර ආදියෙහි අධික රථවාහන තදබදයක් පවතින ආකාරය ඡායාරූප අංක 27 මගින් පෙන්වා ඇත.

**ඡායාරූප 27 : රථවාහන තදබදය**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

2. **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නුසුදුසු ස්ථානයක පැවතීම.**

වැලිගම කප්පරතොට කලපුව ආශ්‍රිත ජෛව විවිධත්වයෙන් අනූන වූ ප්‍රදේශය ජලය ස්වභාවිකව කළමනාකරණය කරමින් වැඩි ජලය මුහුදට මුදා හැරීමට උපකාරී වන ස්වභාවික ස්ථානයකි. එහෙත් වැලිගම නගර සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මෙම කලපුව ආශ්‍රිත ප්‍රදේශයේ ස්ථානගත වී ඇති බැවින් කප්පරතොට කලපුව සහ ඒ ආශ්‍රිත ජල ප්‍රදේශය දූෂණය වී ඇති අතර, පරිසර දූෂණයටද ප්‍රබල සාධකයක් වී ඇත. මීට අමතරව, මෙම ප්‍රදේශය පුරා පවත්නා අධික දුර්ගන්ධය සහ කසලවලින් නිකුත්වන අපද්‍රව්‍ය රළමත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා යොදාගෙන ඇති වෙරළ තීරය සඳහා මුදාහැරීමට කටයුතු කර ඇත. මෙම තත්ත්වය සංචාරක කර්මාන්තය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ගැටළුකාරී තත්ත්වයන් ඇති කිරීමට හේතු වී ඇත. කප්පරතොට ප්‍රදේශයේ කසල කළමනාකරණ ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබන ස්ථානය සිතියම් අංක 13 මඟින් පෙන්වා ඇත.

සිතියම් අංක 13 : කප්පරතොට ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**3. අපජලය හා මලඅපද්‍රව්‍ය වැසි ජලය බැසයන ඇළ මාර්ග සහ කාණු වෙත යොමු කිරීම.**

වැලිගම නගර සහා බල ප්‍රදේශය තුල එක්රැස් වන වැසි ජලය ගලායාම සඳහා ඉදිකර ඇති කාණු පද්ධතිය වෙත නිවාස වලින් බැහැර කරන අපජලය සහ වැසිකිලි වලින් පිටකරනු ලබන අපද්‍රව්‍ය යොමුකරන බව සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී අනාවරණය වී ඇත. මෙය නගරයේ හඳුනාගන්නා ලද ප්‍රබල දුර්වලතාවයකි. යාංඕඩය ඇළේ අපජලය එක්රැස් වී ඇති ආකාරය පහත අංක 28 දරණ ඡායාරූපය මඟින් පෙන්වා ඇත.

**ඡායාරූප 28 : යාංඕඩය ඇළ**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**අවස්ථා**

**1. වැලිගම නගරය ආසන්නයේ කර්මාන්ත කලාප 03 ක් පැවතීම.**

වැලිගම නගරය ආශ්‍රිතව පිහිටා ඇති උඩුකාව, වාලිමවුන්ට් හා මිදිගම ප්‍රදේශවල කර්මාන්තපුර 03ක් පිහිටා තිබීම හේතුවෙන් වැලිගම නගරය තුල කර්මාන්ත සඳහා ඉඩකඩ වෙන්කිරිමේ අවශ්‍යතාවයක් නොමැති අතර, කර්මාන්ත ශාලාවල ප්‍රමාණ හා වර්ග අනුව ඉහත සඳහන් ස්ථානවලින් අවශ්‍ය ඉඩකඩ සපයාදීමේ හැකියාව ඇත. එම කර්මාන්ත කලාපවල පිහිටීම සිතියම් අංක 14 මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 14 : කර්මාන්තපුර වල පිහිටීම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

# 6.0 සංවර්ධන සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

වැලිගම නගරය සඳහා වන සංවර්ධන සැලැස්ම සකස් කිරිමේ මූලික අරමුණ වන වැලිගම නගරය දකුණු කලාපීය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය කිරිම සඳහා දැනට පවත්නා සංවර්ධනය විධිමත් කිරිම සඳහා නගර මධ්‍ය ප්‍රදේශය, වෙරළ කලාපය සහ කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය සඳහා විශේෂ අවධානය යොමුකර සංකල්පිත සැලැස්ම සකස් කර ඇති අතර, සංවර්ධන උපාය මාර්ග අනුගමනය කිරිම තුළින් එය ක්‍රියාවට නැංවීමට යෝජිතය.

සංකල්පිත සැලැස්ම මඟින් වැලිගම නගරයේ ඉදිරි අනාගත සංවර්ධනය සිදුවන ආකාරය විදහා දක්වයි. වැලිගම නගරයේ දැනට අවිධිමත්ව පවත්නා සංචාරක, ධීවර හා වාණිජ කටයුතු සැලසුම්ගත සංවර්ධනයක් සඳහා යොමු කිරිමේ අරමුණින් මෙම සංකල්පිත සැලැස්ම සකස් කරන ලදී.

වැලිගම බොක්ක ආශ්‍රිතව නිර්මාණය වී ඇති වැලිගම නගරය කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය, පැරණි ගාලු පාර හා හෙට්ටිවීදිය ඔස්සේ විකාශය වී ඇති අතර, වැලිගම ඉමදූව හා වැලිගම - අකුරැස්ස මාර්ගය මඟින් රට අභ්‍යන්තරය සමඟ ඍජුව සම්බන්ධ වේ. වැලිගම - අකුරැස්ස මාර්ගය හෙට්ටිවීදිය හමුවන ස්ථානයත් හෙට්ටිවීදිය හා පරණ ගාලු පාර හමුවන ස්ථානයත් පාදක කරගනිමින් නගර මධ්‍ය ප්‍රදේශය නිර්මාණය වී ඇත. ඒ අනුව, එම කලාපය තුල වාණිජ සේවා මධ්‍යස්ථාන ඇති කිරිමට අපේක්ෂිතය.

වැලිගම නගරය වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති අතර, එහි පවත්නා වළයාකාර ස්වභාවය ඒ අයුරින්ම පවත්වා ගනිමින් මාර්ග පද්ධතිය ඉදිකර ඇත. ප්‍රදේශයේ පවත්නා මෙම වළයාකාර ස්වභාවය ගැඹුරු මුහුද, නොගැඹුරු මුහුද, මුහුදු වෙරළ හා ගොඩබිම ලෙස ස්ථර වලට වෙන්වී ඇති ආකාරයත් මාර්ග පද්ධතිය ඉදිකර ඇති ආකාරයත් සැලකිල්ලට ගෙන ගොඩබිම ප්‍රදේශය සංවර්ධනය කිරිම සුදුසු බව සැලසුම් කණ්ඩායම හඳුනාගන්නා ලදි. ඒ අනුව, ස්ථර කිහිපයක් ඔස්සේ නගරය සංවර්ධනය කරා යොමු කිරීමේ අරමුණින් දේදුන්නක වර්ණාවලියක් මෙන් වර්ණ ගැන්වූ අර්ධ කවාකාර හැඩතලයක් මෙම සංවර්ධන සැලැස්මේ දැක්ම සඳහා වූ සංකල්පනාත්මක සැලැස්ම සකස් කිරිම සඳහා උපයෝගී කරගන්නා ලදි. ඒ අනුව, වැලිගම බොක්ක ආශ්‍රිතව පවත්නා නොගැඹුරු මුහුදු කලාපය ධීවර හා සංචාරක කටයුතු ප්‍රවර්ධන කලාපය සඳහා ඉතාමත් සුදුසු ප්‍රදේශය බැවින් එම කටයුතු ප්‍රවර්ධනය කිරිමේ අරමුණින් දේදුන්නේ ආලෝකය විවිධ වර්ණ වලින් පෙන්වන්නා සේ පවත්නා සංවර්ධන රටාව, මාර්ග ජාලය සහ ඇළ මාර්ග පද්ධතිය පදනම් කරගෙන කලාප කිහිපයක් ඔස්සේ අනාගත සංවර්ධනය සිදුකිරිමට අපේක්ෂිතය.

වැලිගම බොක්ක ආශ්‍රිතව පවත්නා නොගැඹුරු මුහුදු කලාපය ධීවර හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගැනීමේ අරමුණෙන්, වැලිගම බොක්ක හා පොල්අතුමෝදර ගඟ ආශ්‍රිත ප්‍රදේශ සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහාත්, වැලිගම බොක්ක ආශ්‍රිත ප්‍රදේශය හා කප්පරතොට ප්‍රදේශය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහාත් කුඹල්ගම හා බටවල මංසන්ධි වාණිජ කටයුතු සඳහාත් සංවර්ධනය කිරීමටත් නේවාසික, සංචාරක හා වාණිජ කලාප ඇති කිරීමටත් අපේක්ෂා කෙරේ. පවත්නා මාර්ග පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම තුලින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා පහසුවෙන් අදාල ස්ථාන වලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කිරිමට යෝජිතය.

වැලිගම නගරයේ ප්‍රධානතම විභවතාවය වන වැලිගම බොක්ක සහිත කිලෝමීටර් 3.0 ට අධික දිගකින් යුත් පුළුල් වෙරළ තීරය හා නොගැඹුරු මුහුද පාදක කොටගෙන සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරිමට සැලසුම් කර තිබේ. ශ්‍රී ලංකාවේ වෙරළ තීරයන් අතුරින් රළ මත ලිස්සායාමේ ක්‍රීඩාවට වඩාත්ම උචිත රළ සහිත වෙරළ තීරයක් වන වැලිගම වෙරළ තීරය දෙස් විදෙස් සංචාරකයින් ආකර්ශනය කරගැනීමට සමත් වී තිබේ. මෙම සංචාරක කර්මාන්තයට සමගාමීව බල ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට පහසුකම් සැලසීම සඳහා තරු පන්තීන්ට අයත් හෝටල්, ලැගුම්හල්, තානායම් හා ආපනශාලා ඉදිවෙමින් පවතී. වැලිගම නාගරික ප්‍රදේශයේ සංචාරක කටයුතු සඳහා යොදාගෙන ඇති මුළු කාමර සංඛ්‍යාවෙන් 68 % ක් සංචාරක හෝටල් සතුවන අතර, පුද්ගලයන් 623ක් සඳහා සෘජු රැකියා අවස්ථා බිහිවී ඇත. සංචාරකයින් මෙරටට පැමිණීමේ ක්‍රමික වර්ධනයත්, අනාගත සංවර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන සැලසුම් සහ ක්ෂේත්‍රයන් ලබාගන්නා ලද තොරතුරු පිළිබඳ සලකා බලා වැලිගම නගරය සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාවක් පවතින බව හඳුනාගන්නා ලදි.


ඒ අනුව, වසර 2030 වන විට වැලිගම නගරය ***"දකුණු ලක පිබිදෙන සමුද්‍රවංකීය සංචාරක පාරාදීසය"*** යන දැක්ම යටතේ සංචාරක ආකර්ශනයක් සහිත නගරයක් ලෙස සංවර්ධනය කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීමත්, ධීවර කර්මාන්තය ඉහල නැංවීමට අවශ්‍ය ඉඩකඩ වෙන් කිරීමටත් හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශවල ස්වභාව සෞන්දර්ය ආරක්ෂා කර ගනිමින් සංචාරක කටයුතු සඳහා යොමු කිරිම තුළින් සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියා බිහි කිරිම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් සැලසීමත්, අරමුණු කරගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි.

සංචාරක කර්මාන්තය මෙන්ම වැලිගම නගරයේ අනාගත ආර්ථික සංවර්ධනයට දායක වන ප්‍රධාන අංගයක් ලෙස ධීවර කර්මාන්තය හඳුනා ගන්නා ලදී. මෙම ධීවර නිෂ්පාදන ආශ්‍රිත අලෙවිකරණ කටයුතු නගරය පුරා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම මඟින් ධීවර කර්මාන්තයේ ප්‍රබල ඉලක්ක සපුරා ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව වැඩි කිරිමට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වැඩි කිරිම

සෘජු හා වක්‍ර රැකියා වර්ධනය කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීමත් මෙම සංකල්පනාත්මක සැලැස්ම සකස් කිරිමේදී සලකා බලන ලද කරුණු වේ.

වැලිගම නගරයේ විභවතාවයන් හා සංවර්ධන නැමියාවන් සැලකිල්ලට ගනිමින් මුහුදු වෙරළ තීරයේ සිට පරණ ගාලු පාර දක්වා කොටස සහ පොල් අතුමෝදර ගඟ ආශ්‍රිත ප්‍ර දේශය සංචාරක කටයුතු සඳහාත් පරණ ගාලු පාරේ සිට හෙට්ටිවීදිය දක්වා ප්‍රදේශය වාණිජ කටයුතු සඳහාත්, හෙට්ටිවීදියේ සිට බණ්ඩාරනායක මාවත දක්වා ප්‍රදේශය මිශ්‍ර නේවාසික කටයුතු සඳහාත් ඉතිරි ප්‍රදේශය නේවාසික කටයුතු සඳහාත් යොමු කිරිමට සැලසුම් කර ඇත. ඉහත කරුණු සලකා බලා සකස් කරන ලද සංකල්පිත සැලැස්ම සිතියම් අංක 15 මගින් පෙන්වා ඇත.

සිතියම් අංක 15 : සංකල්පිත සැලැස්ම




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

## 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

වැලිගම නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වන වැලිගම නගරය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය කිරිම සඳහා සකස් කරන ලද යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම අංක 16 දරණ සිතියමේ දක්වා ඇත. සැලසුම් කණ්ඩායම මඟින් ලබාගන්නා ලද තොරතුරු වලට අනුව වැලිගම නගරය මාතර, ගාල්ල හා අනෙකුත් නාගරික ප්‍රදේශ හා සසඳා බැලීමේදී අඩු සංවර්ධනයක් පවතින එහෙත් සංවර්ධනය සඳහා වැඩි විභවතාවයකින් යුත් නගරයක් බව හඳුනාගන්නා ලදි. ඒ අනුව, නගරයේ පවත්නා ශක්තීන්, අවස්ථා, දුර්වලතා හා බාධක පිළිබඳ නිසි අවධානය යොමුකර දැනට පවතින භූමිය ප්‍රශස්ථ භාවිතය සඳහා යොමුකර නාගරික ජනයාගේ ආදායම් මට්ටම ඉහල නැංවීමත්, නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සැලසීම සඳහා යෝජිත භූමි පරිහරණ සැලැස්ම සකස් කර ඇත.


වැලිගම නගරය වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති බැවින් එම ප්‍රදේශය සංචාරක කටයුතු සඳහා ප්‍රමුඛතා ප්‍රදේශය ලෙස හඳුනාගන්නා ලද අතර, සුළං නිර්බාධිතව ගමන් කිරිම සඳහා හා දර්ශන පථයට අවහිර නොවන පරිදි ගොඩනැගිලි ඉදිකිරිම සඳහා සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි සකස් කර ඇත. මෙම ප්‍රදේශය මූලිකව සංචාරක කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කරන අතර, ඊට සමගාමීව වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය, මාර්ග පුළුල් කිරිම හා පාරිසරික සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා අදාල භූමි ප්‍රදේශ හඳුනාගෙන ඇත.

නගර මධ්‍ය ප්‍රදේශයේ අපරව්‍යුහ පහසුකම් ඒකාරාශී වී ඇති බැවින් එම ප්‍රදේශය අධි උස ගොඩනැගිලි ඉදිකිරිම සඳහා සැලසුම් කර ඇති අතර, වැඩි වශයෙන් මෙම ප්‍රදේශය වාණිජ සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදාගැනීමට අපේක්ෂිතය. නගර මධ්‍යයට ආසන්නව ඇති කොළඹ - මාතර දුම්රිය මාර්ගයෙන් උතුරු දෙසින් පිහිටා ඇති ප්‍රදේශය මේ වන විට නාගරික ලක්ෂණ පෙන්නුම් කරමින් ග්‍රාමීය ලක්ෂණ හා සමෝධානය වෙමින් සංවර්ධනය වන බැවින් එම ප්‍රදේශය අධි උස ගොඩනැගිලි ඉදිකිරිම සඳහා විශේෂ අවකාශ ලබාදීමට යෝජිතය.

තවද, මෙම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් හට කඩිනමින් අදාල ස්ථාන වෙත ප්‍රවේශවීමට ප්‍රවේශ පහසුකම් සැලසුම් කර ඇති අතර, මාර්ග හා ගමනාගමන සැලැස්මේ පෙන්වා ඇති පරිදි, හඳුනාගත් ප්‍රවේශ මාර්ග සෙවණ ගස් සහිතව මං තීරු දෙකක් දක්වා මීටර් 20.0 ක පළලකින් යුක්තව සංවර්ධනය කිරිමට යෝජිතය. ඒ අනුව වසර 2030 වන විට වැලිගම නගරය කලාපීයකරණ සැලැස්මේ පෙන්වා ඇති අකාරයට වෙරළ කලාපය අඩු ඝනත්වයකින්ද වෙරළ කලාපය හා පරණ ගාලු පාර අතර ඇති කලාපය මධ්‍ය

සනත්වයකින්ද, නගර මධ්‍ය ප්‍රදේශය අධි සනත්වයකින්ද නගර මධ්‍ය ප්‍රදේශයෙන් උතුරු දෙසට වන්නට තිරස් සංවර්ධනය වෙනුවට සිරස් සංවර්ධනය සඳහා යොමු කිරීමේ පදනම මත යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත. අනාගත සංවර්ධනය පෙන්නුම් කරන දික්කඩ සහ හරස්කඩ කැපුම් ස්ථානද සලකුණු කර එම සැලැස්ම අංක 16 සිතියම මඟින් පෙන්වා ඇත. ඒ අනුව වැලිගම නගරයේ අනාගත සංවර්ධනය, වෙරළ තීරයේ සිට පොල්අතුමෝදර ගඟ දක්වා ප්‍රදේශය රූපසටහන් අංක 02 දරණ අ - ආ හරස්කඩ මගින්ද, වෙරළ කලාපයේ පිහිටි කප්පරතොට සිට පැලෑන දක්වා ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය දෙසට රූපසටහන් අංක 03 දරණ ඇ - ඈ දික්කඩ මගින්ද පෙන්වා ඇත. නගරයේ අනාගතයේදී සංවර්ධනය වන ආකාරය දැක්වෙන දර්ශීය සංකල්පිත සැලැස්ම රූපසටහන් අංක 04 මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 16 : යෝජිත භූමි පරිහරණ රටාව**



**රූප සටහන් 02 - වෙරළ තීරයේ සිට පොල්අතුමෝදර ගඟ දක්වා ප්‍රදේශය : අ - ආ හරස්කඩ**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**රූප සටහන් 03 - කප්පරතොට සිට පැලෑන දක්වා ප්‍රදේශය : ඇ - ඈ දික්කඩ**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**රූප සටහන් අංක 04 : දර්ශීය සංකල්පිත සැලැස්ම**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

## 6.3 භෞතීය හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්ම

### 6.3.1 යෝජිත සේවා සැපයුම් සැලසුම්

නගරයෙහි 2030 වර්ෂය වන විට අපේක්ෂිත ජනගහනය සඳහා අවශ්‍ය නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනික යන සේවා සැලසුම් කිරිම සේවා සැලැස්ම මඟින් සිදුකරනු ලබයි.

වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ග කිලෝමීටර් 44 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර, වැලිගම නගර සභා බල ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 5.43 කි. 2030 වසර වන විට ඇස්තමේන්තුගත ජනගහනය වගු අංක 05 මගින් දක්වා ඇත.

**වගු අංක 05 : ඇස්තමේන්තුගත ජනගහනය 2030**

| වර්ෂය | ජනගහනය | වර්ධන අනුපාතය (%) |
|---|---|---|
| **2011** | 22149 | 0.2 |
| **2016** | 23228 | 0.98 |
| **2020** | 24156 | 0.98 |
| **2025** | 25364 | 0.98 |
| **2030** | 26643 | 0.98 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2017

ඉහත වගුවට අනුව වැලිගම නාගරික ප්‍රදේශයේ අපේක්ෂිත ජනගහන වර්ධනය 2011-2030 වර්ෂ අතර වෙනස 4494කි.

**වගු අංක 06 : ඇස්තමේන්තුගත නිවාස අවශ්‍යතාවය 2030**

| වර්ෂය | ජනගහනය | පවුල් සංඛ්‍යාව | පවතින නිවාස සංඛ්‍යාව | නිවාස අවශ්‍යතාවය | නිවාස හිඟය |
|---|---|---|---|---|---|
| **2011** | 22,149 | 4713 | 4,696 | 4,713 | 17 |
| **2016** | 23,228 | 4,760 | | 4,760 | 99 |
| **2020** | 24,156 | 4,809 | | 4,809 | 113 |
| **2025** | 25,369 | 4,860 | | 4,860 | 164 |
| **2030** | 26,643 | 4,903 | | 4,903 | 207 |


සටහන :

- පවුලක සාමාන්‍ය සංඛ්‍යාව වාර්ෂිකව 4.7 ක්ම පවතීයයි උපකල්පනය කර ඇත.
- 2011 පැවති තාවකාලික නිවාස 35 ද නිවාස හිඟයට එකතුකර ඇත.
- 2011 වර්ෂයේ වාර්තාවූ අර්ධ ස්ථිර නිවාස 219 එම ස්ථානයේම වැඩි දියුණු කරන පදනම සලකා බලා ඇත.

*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය.*

ඉහත වගුවට අනුව වැලිගම නාගරික ප්‍රදේශයේ නිවාස හිඟය 2011- 2030 වර්ෂ අතර වෙනස 207 කි. පොම්පෙවත්ත සහ ජෝති කොරටුව වැනි අඩු ආදායම් ලාභී නිවාස සැලසුම්ගත සංවර්ධනයකට යොමු කිරීම තුලින් මෙම නිවාස හිඟය මගහරවා ගැනීමට සැලසුම්කර ඇත. ඒ අනුව, යෝජිත නිවාස ඝනත්වය සිතියම් අංක 17 මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 17 : යෝජිත නිවාස ඝනත්වය 2030**



### 6.3.2 සෞඛ්‍ය පහසුකම් සැලැස්ම

වැලිගම නගර සභා බල ප්‍රදේශය තුළ වැලිගම දිසා රෝහල, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මහජනතාවට සෞඛ්‍ය සේවා සැපයිම සම්බන්ධව කටයුතු කරනු ලබයි. නගරයේ සෞඛ්‍ය සේවා සැපයීම අංශ දෙකක් යටතේ සිදුකරනු ලැබේ. එනම් නිවාරණ සේවා අංශය හා ප්‍රතිකාර සේවා අංශය වේ. මෙහිදී රෝග නිවාරණය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් පමණක් සිදුකරනු ලැබේ.

වැලිගම නගරය හා අවට ප්‍රදේශයට සෞඛ්‍ය සේවා සපයනු ලබන වැලිගම දිසා රෝහල නගරයේ සිට කිලෝමීටර් 2 ක් පමණ දුරින් වලාන ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇත. මෙම රෝහලේ වාට්ටු 05 ක්, ඇඳන් 94 ක් සහ හදිසි ප්‍රතිකාර ඒකකයකින් සමන්විතය. 2016 වසරේ නේවාසික රෝගීන් 10050 ක් පමණ රෝග නිවාරණ කටයුතු සඳහා පැමිණ ඇති අතර, රෝගීන් 103,842 පමණ පැමිණ ඇත්තේ සායනික කටයුතු සඳහාය. මෙම රෝගීන් සඳහා ප්‍රතිකාර කිරිම සහ සායනික කටයුතු සඳහා නිරත වනුයේ වෛද්‍යවරු 06 දෙනෙකු පමණි. තවද, මෙම රෝහල තුල දැනට ශල්‍යාගාරයක් නොමැති අතර, ඊ.සී.ජී. සහ එක්ස් කිරණ පරීක්ෂණ සඳහා අවශ්‍ය පහසුකම් සපයා නොමැත. එබැවින් වැලිගම නගරය සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරිමේදී ප්‍රදේශයේ ජනතාවට සහ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා මෙම රෝහල වැඩිදියුණු කළ යුතු වුවද, ඒ සඳහා භූමියේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති අතර, පටු මාර්ගයන් සහිත කඳු මුදුනක ස්ථානගත වී ඇති බැවින් ප්‍රවාහන අපහසුතා පවතී. ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකි වැලිගම නගරයේ සිට කිලෝමීටර් 8.0 ක් දුරින් පිහිටා ඇති කොරියන් මිත්‍රත්ව රෝහල වෙත යොමු කිරීම තුලින් සෞඛ්‍ය අවශ්‍යතා ඉතා පහසුවෙන් ඉටුකර ගත හැක.


### 6.3.3 අධ්‍යාපන පහසුකම් සැලැස්ම

2011 ජන හා නිවාස සංගණනයට අනුව වැලිගම නගරයේ සාක්ෂරතා මට්ටම 95% ක් පමණ වන අතර, එය දිස්ත්‍රික්කයේ සාක්ෂරතා මට්ටමට සමාන අගයක් ගෙන ඇත. මේ අනුව, වැලිගම නගරයේ සාක්ෂරතා මට්ටම ඉතා සතුටුදායක මට්ටමක පවතින බව හඳුනාගත හැකිය.

ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වැදගත් වන රජයේ පාසල් 09 ක්ද පෞද්ගලික පාසල් 03 ක් හා වෘත්තීය පුහුණු ආයතනයක් ද පවතී. සම්මත ප්‍රමාණයට අනුව සෑම ශිෂ්‍යයකු සඳහා ප්‍රාථමික අධ්‍යාපනය ලබාගැනීමට කිලෝමීටර් එකක අරීය ප්‍රදේශයක් තුළ ප්‍රාථමික පාසලක් පිහිටා තිබිය යුතුවේ. පහත දැක්වෙන අංක 18 දරණ සිතියම මගින් වැලිගම නගරයේ පාසල් ව්‍යාප්තිය සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවය සපුරා ඇති බව හඳුනා ගත හැකිය.

නගරයේ පවතින පාසල්වලින් ක්‍රීඩාපිටි පහසුකම් පවතින්නේ අර්ෆා මැදි විද්‍යාල හා වැලිගම ජිනරාජ කණිටු විද්‍යාලේ පමණි. අනෙක් පාසල්වලට ක්‍රීඩාපිටි පහසුකම් නොමැති අතර, එම පහසුකම් සපයා ගනු ලබන්නේ නගරයේ පොදු ක්‍රීඩාපිටිය වන සේනානායක ක්‍රීඩාපිටිය මඟිනි. එහෙත්, එය සියළු ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා සුදුසු වන ආකාරයට සංවර්ධනය කර නොමැත. අග්‍රබෝධි විහාරය ඉදිරිපිට ඇති හිස් භූමිය තුල රථවාහන නැවතුම් ස්ථාන සහිතව ක්‍රීඩාගාරයක් ඉදිකිරිම සහ දැනට පවත්නා සේනානායක ක්‍රීඩාංගනය ක්‍රමවත් පරිදි සංවර්ධනය කිරීම සඳහා හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 18 : අධ්‍යාපන සේවා පහසුකම් ව්‍යාප්තිය**



### 6.3.4 යෝජිත ප්‍රවාහන සැලැස්ම

වැලිගම නගරයේ මාර්ග පටුවීම හා රථවාහන නැවතුම් ස්ථාන සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන්වී නොතිබීම කාර්යක්ෂම ගමනාගමනයට බාධාවක් වී ඇති අතර, මාර්ග සඳහා වෙන්වී ඇත්තේ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 5.5% ක් පමණි. ඒ අනුව තෝරාගත් මාර්ග සඳහා පදික මංතීරු ඉදිකිරිම හා සෙවන ගස් සිටුවීම තුළින් ප්‍රදේශයේ වෙසෙන මහජනතාවට සහ දෙස් විදෙස් සංචාරකයින්ට පහසුවෙන් ගමන්කිරිමට අවස්ථාව සලසාදීමත් සංචාරකයින්හට ආරක්ෂාකාරීව නගරය පුරා සැරිසැරීමටත් අවස්ථාව සලසාදීමේ අරමුණින් ප්‍රවාහන සැලැස්ම සකස් කර ඇත.

එසේම, දක්ෂිණ අධිවේගී මාර්ගයේ බලපෑම හා මුහුදුබඩ දුම්රිය මාර්ගයේ වැලිගම දුම්රිය ස්ථානයේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා දුම්රියපොළ පිවිසුම් මාර්ගය හා ඒ අවට ප්‍රදේශය ප්‍රතිනිර්මාණය කිරිම, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා සමුපකාර දෙපාර්තමේන්තුව සතු භූමිය ප්‍රශස්ත භාවිතය සඳහා යෙදවීම, රථවාහන නැවතුම් ස්ථාන ඇති කිරිම තුළින් නගර මධ්‍ය ප්‍රදේශය සැලසුම්ගත සංවර්ධනයක් කරා යොමු කළ හැක. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් මාර්ග පුළුල් කළ යුතුව ඇත. ඒ අනුව, 2030 වසර වන විට ඇතිවන ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා සංවර්ධන සැලැස්ම යටතේ හඳුනා ගන්නා ලද පුළුල් කිරීමට යෝජිත මාර්ග සැලැස්ම අංක 19 දරණ සිතියම මඟින් පෙන්වා ඇත.

**සිතියම් අංක 19 : යෝජිත මාර්ග හා ගමනාගමන සැලැස්ම**




**වගු අංක 07 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - යෝජිත මාර්ග හා ගමනාගමන සැලැස්ම - 2030**

| මාර්ගයේ නම | යෝජිත මංතීරු |
|---|---|
| 1. කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය වැලිගම - අකුරැස්ස මාර්ගය, වජිරඥාන මාවත, බොරාල පාර, පැරණි ගාලු පාර, කප්පරතොට වටරවුම පාර, මැද මාවත | 02 |
| 2. පලල්ලපාර, බණ්ඩාරනායක මාවත, කුඩළුමුල්ල පාර | 04 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

ඉහත අංක 07 වගුවෙහි සඳහන් කර ඇති පරිදි කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය, වැලිගම - අකුරැස්ස මාර්ගය, බෝට් යාඩ් පාර, වජිරඥාන මාවත, බුහාරි මජිඩ් මාවත බොරාල පාර, පැරණි ගාලු පාර සේනානායක ක්‍රීඩාංගනය දක්වා, කප්පරතොට වටරවුම පාර, ඩිමෝනි පාර, මැද මාවත යන මාර්ග සෙවන ගස්, පදික මංතීරු සහ පාපැදි මංතීරු සහිතව මංතීරු දෙකක් දක්වා රූප සටහන් අංක 05 හි දැක්වෙන හරස්කඩට අනුව පුළුල් කර සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

**රූප සටහන් අංක 05 : මාර්ග හරස්කඩ - මංතීරු දෙක**





මංතීරු දෙක - මාර්ග හරස්කඩ

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

වැලිගම නගරය සංචාරක පාරාදීසයක් ලෙස සංවර්ධනය වීමේදී නගර මධ්‍ය ප්‍රදේශයේ ඇති විය හැකි රථවාහන තදබදය අවම කිරිම සඳහා පවත්නා මාර්ග පුළුල් කිරිම මෙන්ම විකල්ප මාර්ග හඳුනාගැනීම ද අවශ්‍ය වන බැවින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඔස්සේ පැමිණෙන රථවාහන සඳහා නගරය මඟහැර යාමටත් අතුරු මාර්ග ඔස්සේ පහසුවෙන් නගරයට ප්‍රවේශ වීමට හැකි වන සේ පලල්ල පාර, බණ්ඩාරනායක මාවත හා කුඩළුමුල්ල පාර ඒකාබද්ධ කර රූප සටහන් අංක 06 හි දක්වා ඇති පරිදි මංතීරු 04කින් යුක්තව විකල්ප මාර්ගයක් ලෙස පුළුල් කර සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත.

**රූප සටහන් අංක 06 : මාර්ග හරස්කඩ - මංතීරු හතර**




මාර්ග හරස්කඩ - මංතීරු හතර

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය


පවත්නා සංවර්ධන නැමියාව හා දැක්ම පදනම් කරගෙන මාර්ග වල අවම පළල රූප සටහන් අංක 06 හි හා 07 හි දක්වා ඇති පරිදි මීටර් 7.0 ක් හා මීටර් 9.0 ක් වශයෙන් සංවර්ධනය කිරීමට යෝජිතය.

**රූප සටහන් අංක 07 : මීටර් 7 පළල මාර්ග හරස්කඩ**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**රූප සටහන් අංක 08 : මීටර් 9 පළල මාර්ග හරස්කඩ**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම**

වැලිගම නගරය සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරිමේදී දෙස් විදෙස් සංචාරකයින්ගේ සහ නේවාසික ජනයාගේ අවශ්‍යතා සපුරාලීම සඳහා නගර මධ්‍ය ප්‍රදේශයට විශේෂ අවධානය යොමු කර දැනට පවත්නා දුම්රිය ස්ථානය සහ බස් නැවතුම් පොල ඒකාබද්ධ කර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරිමට සහ මැද මාවත, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පැරණි ගාලු පාර ඇතුලත් වනසේ ප්‍රවාහන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරිමට හඳුනාගෙන ඇත. ඊට අමතරව බොරාල පාර සහ හෙට්ටිවීදිය මාර්ගය හමුවන මංසන්ධියේ පවතින අධික මාර්ග තදබදය මඟහැරවීමට විකල්ප මාර්ගයක් ඉදිකිරිම සුදුසු බව හඳුනාගෙන ඇත.

නගර මධ්‍ය ප්‍රදේශයේ පවතින ත්‍රී රෝද රථ නවතා තැබීමට සහ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා නගරයට පැමිණෙන රථ වාහන නවතා තැබීමට බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරිමට සැලසුම් කර ඇති භූමියෙන් කොටසක් යොදා ගැනිමට අපේක්ෂා කෙරේ. තවද, වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතියට අයත් භූමියේ හඳුනාගත් ප්‍රදේශ වාහන නවතා තැබීම සඳහා වෙන්කර ඇත. නගර මධ්‍ය ප්‍රදේශය සහ වෙරළ කලාපය සංවර්ධනය විය යුතු ආකාරය අංක 09 රූපසටහන මඟින් පෙන්වා ඇත.

රූප සටහන් අංක **09 :** වැලිගම නගර මධ්‍ය ප්‍රදේශය - යෝජිත සැලැස්ම



### 6.3.5 යෝජිත ජල සැපයුම් සැලසුම

වැලිගම නගරයට නළ ජල සම්පාදනය සඳහා ජලය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය පොල්අතුමෝදර ගඟ වේ. කනංකෙ ප්‍රදේශයේදී පොල්අතුමෝදර ගඟෙන් ලබා ගන්නා ජලය හල්ලල පිහිටි පිරිපහදු මධ්‍යස්ථානය මඟින් පිරිසිදු කරනු ලබන අතර, වැලිගම පිහිටි ජල ටැංකිය මගින් බෙදා හරිනු ලබයි. මෙමඟින් දෛනිකව සපයන ජල ප්‍රමාණය ඝන මීටර් 6,500 ක් වන අතර, එම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින්, දැනට මහා මාතර සංවර්ධන සැලැස්ම යටතේ නව ජල ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, 2020 වසර වන විට එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය. එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව බාධාවකින් තොරව පැය 24 පුරාම ජලය ලබාදිය හැකි බව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් දැනුම් දෙන ලදි. 2030 වසර සඳහා පුරෝකථනය කරන ලද දෛනික ජල අවශ්‍යතාවය අංක 08 වගුවේ දක්වා ඇති අතර, යෝජිත ජල සැපයුම සිතියම් අංක 20 මගින් දක්වා ඇත.

වගු අංක 08 : වැලිගම නගර සභා බල ප්‍රදේශය - දෛනික ජල අවශ්‍යතාවය

| වර්ෂය | ඇස්තමේන්තුගත ජනගහනය | දෛනික සංසරණ ජනගහනය | හෝටල් සඳහා ජල අවශ්‍යතාවය | රෝහල් සඳහා ජල අවශ්‍යතාවය | දෛනික ජල අවශ්‍යතාවය |
|---|---|---|---|---|---|
| 2011 | 22,149 | 50,000 | 69 $m^3$ | 19 $m^3$ | 4674 $m^3$ |
| 2016 | 23,228 | 55,000 | 171 $m^3$ | 19 $m^3$ | 5031 $m^3$ |
| 2020 | 24,156 | 58,500 | 238 $m^3$ | 19 $m^3$ | 5289 $m^3$ |
| 2025 | 25,369 | 70,000 | 383 $m^3$ | 19 $m^3$ | 5808 $m^3$ |
| 2030 | 26,643 | 80,000 | 628 $m^3$ | 19 $m^3$ | 6402 $m^3$ |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය.

**සටහන් :-** ඒක පුද්ගල ජල පරිභෝජනය (නේවාසික) – ලීටර් 180
ඒක පුද්ගල ජල පරිභෝජනය (සංසරණ ජනගහනය) – ලීටර් 12
හෝටල් කාමරයක් සඳහා ජල අවශ්‍යතාව – ඝන මීටර් 0.4

**සිතියම් අංක 20 : යෝජිත ජල සැපයුම**



### 6.3.6 යෝජිත විදුලි සහ දත්ත රැහැන් සැලසුම

ජාතික විදුලි පද්ධතියෙන් දකුණු පළාතට විදුලිය සපයනු ලබන්නේ මතුගම, ගාල්ල, දෙනියාය, ඇඹිලිපිටිය හා බලංගොඩ පිහිටි උප පොලවල් හරහාය. ඒ අනුව වැලිගම ප්‍රදේශයට විදුලිය සැපයීම සඳහා මෙගාවොට්ස් 10 ක විදුලි ධාරිතාවයක් ගාල්ල හා දෙනියාය උප පොළ හරහා ලබා ගනී.

වැලිගම නගර සහා බල ප්‍රදේශය තුළ අධිසැර (කිලෝවොට්ස් 33 ) විදුලි රැහැන් කිලෝමීටර් 6.46 ක්ද අඩු සැර (කිලෝවොට්ස් 11) විදුලි රැහැන් කිලෝමීටර් 2.47 ක්ද ඇති අතර, නගරය තුළ විදුලිය බෙදා හැරීම සඳහා තරාපැවි (Transformer) 12 ක් ඉදිකර ඇත.

මේ වන විට වැලිගම නගර සභා බල ප්‍රදේශය තුළ සියළුම වාණිජ, කර්මාන්ත හා ආගමික ස්ථාන සඳහා විදුලි බලය සපයා ඇති අතර, පවත්නා නිවාස සංඛ්‍යාවෙන් 97.8% ක් විදුලි බලය සපයා ඇත. ඒ අනුව විදුලිය නොමැති නිවාස 2.2% ක් ලෙස ගණන් බලා ඇත. එම නිවාස තාවකාලික නිවාස ලෙස හඳුනාගන්නා ලදි.

වැලිගම නාගරික ප්‍රදේශයේ ඉදිරි සංවර්ධන කටයුතුවලදී ඉහළ විදුලි ධාරිතාවයක් ලබා දීමට අවශ්‍ය වුවහොත් ඉහත ජාල උප පොළ හරහා ලබා දිය හැකියාව පවතී. දැනට පවත්නා ජාල උපපොල සිතියම් අංක 21 මගින් දක්වා ඇත.

සිතියම් අංක 21 : විදුලි ජාල උපපොල පිහිටීම



මූලාශ්‍රය : විදුලිබල මණ්ඩලය, වැලිගම.

### 6.3.7 කාණු හා මලාපවාහන සැලසුම

වැලිගම නගර සභා බල ප්‍රදේශය තුල ඉදිකර ඇති කාණු පද්ධතිය වැසි ජලය ගලා යාම සඳහා සැලසුම් කර තිබුනද, එම කාණු පද්ධතියෙහි තාක්ෂණික දෝෂ පැවතීම හේතුවෙන් ක්‍රමවත් පරිදි ජලය බැසයාමක් සිදු නොවන අතර, කාණු තුල එක්රැස් වන ජලය කාලයක් රඳා පැවතීම හේතුවෙන් මදුරු උවදුර වැනි පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුවී ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබා ගන්නා ලද තොරතුරු වලට අනුව, සංචාරක සමය ආරම්භ වීමත් සමග මදුරු උවදුර සීග්‍රයෙන් පැතිරයාම ආරම්භ වේ. මෙම තත්ත්වය සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා අවහිරතාවයක් වන බැවින්, දැනට ඉදිකර ඇති කාණු පද්ධතිය ක්‍රමවත්ව ජලය බැසයාම සඳහා නැවත සකස් කල යුතුව ඇත. එම අවශ්‍යතා සලකා බලා සංවර්ධනය කිරීමට යෝජිත ජලාපවාහන පද්ධතිය සිතියම් අංක 22 මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 22 : යෝජිත ජලාපවාහන පද්ධතිය**




**යොමුව**

- සංවර්ධනය කිරීමට නියමිත ඇළ මාර්ග
- ඒ ශ්‍රේණියේ මාර්ග
- දුම්රිය මාර්ගය
- වැලිගම නගර සභා සීමාව

1:16,000

**යෝජිත ජලාපවහන පද්ධතිය - 2030**
**වැලිගම නගරසභා බල ප්‍රදේශය**

වැලිගම නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

**සිතියම් අංක : 22**

සකස් කළ දිනය : 2018 දෙසැම්බර් 10
යාවත්කාලීන කළේ : 2019
මූලාශ්‍රය : නා.සං.අ. මාතර කාර්යාලය
සකස් කළේ : ජේ.බී.බී. ජීවන්දර

නාගරික සංවර්ධන අධිකාරිය
මාතර දිස්ත්‍රික් කාර්යාලය

**සංවර්ධන උපක්‍රම**

**මලාපවාහන පිරිපහදු ඒකකයක් ඉදිකිරීම**

නගර සීමාව තුළ ඒකාබද්ධ පොදු මලාපවාහන පද්ධතියක් ක්‍රියාත්මක නොවන අතර, ජල මුද්‍රිත සනිපාරක්ෂක වැසිකිළි සහ සනීපාරක්ෂක නොවන වැසිකිළි භාවිතා වේ.

නගරය තුළ ඇති සනිපාරක්ෂක ජල මුද්‍රිත වැසිකිළි ප්‍රමාණය 99.0% ක් වන අතර, සනීපාරක්ෂක නොවන වැසිකිළි ප්‍රමාණය 0.6% කි.එසේම, වැසිකිළි නොමැති නිවාස 0.4% ක් පවතී. ඒ අනුව, සෞඛ්‍යාරක්ෂිත නොවන වැසිකිළි ප්‍රමාණය 0.6% ක් හා වැසිකිළි නොමැති නිවාස 0.4% ක් පැවතීම සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් අයහපත් ලෙස බලපානු ලබන සාධකයක් ලෙස හඳුනා ගත හැකිය.

නගර මධ්‍ය ප්‍රදේශය හා වෙරළ ආසන්න ප්‍රදේශයේ නොගැඹුරු භූගත ජල මට්ටමක් පැවතීම නිසා ජල මුද්‍රිත වැසිකිළි වර්ෂා කාලයේදී උතුරා යාම සිදුවේ. ඉන් පරිසරය දූෂණය වීම මෙන්ම බෝවන රෝග වැළදීමේ ප්‍රවණතාවය ඉහළ යනු ඇත. මෙම ගැටළුව මඟහැරවීම සඳහා අංග සම්පූර්ණ මලාපවාහන පිරිපහදු ඒකකයක් සැලසුම් කිරීම සඳහා අංක 29 ඡායාරූපයෙහි දක්වා ඇති පරිදි කප්පරතොට වැලිගම පිෂමන් බේ හෝටලයට යාබද භූමියේ හඳුනාගෙන ඇත. එමගින් 2030 වසර වන විට මෙම ගැටළුව සම්පූර්ණයෙන් විසඳෙනු ඇත.

**ඡායාරූප 29 : මලාපවාහන පිරිපහදු ඒකකය සඳහා යෝජිත භූමිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය.

### 6.3.8 අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම

වැලිගම නගර සභාවේ සංවර්ධන අංශයෙන් ලබාගන්නා ලද දත්ත අනුව නගර සභා බල ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය එක්රැස් කිරිම වැලිගම නගර සභාව මඟින් සිදුකරනු ලැබේ. ප්‍රදේශය තුළ දිනකට එකතු වන කැළි කසල ප්‍රමාණය ටොන් 15 ක් පමණ වේ. එම ප්‍රමාණය පොදු වෙළඳපොළ, වාණිජ ආයතන, කර්මාන්ත ශාලා, දිසා රෝහල හා නිවාස යන ස්ථාන වලින් බැහැර කරනු ලබන ඝණ අපද්‍රව්‍ය වලින් යුක්ත වේ. එම ආයතනවලින් එකතු වන ඝණ අපද්‍රව්‍යයන්හි දිරාපත් වන හා දිරාපත් නොවන ද්‍රව්‍යයන්ගේ සංයුතිය වගු අංක 09 මගින් දක්වා ඇත.

**වගු අංකය 09 : ඝණ අපද්‍රව්‍ය සංයුතිය - 2017**

| සංයුතිය | ප්‍රතිශතය % |
|---|---|
| දිරාපත් වන ශාක සහ සත්ත්ව කොටස් | 80.0 |
| දිරාපත් නොවන ද්‍රව්‍ය | 10.0 |
| කිසියම් දෙයකට යොදාගත නොහැකි ද්‍රව්‍ය | 10.0 |
| එකතුව | 100.0 |

මූලාශ්‍රය : වැලිගම නගර සභාව, සංවර්ධන අංශය - 2017

නගරය තුල ජනනය වන කැළි කසලවලින් ඉහල ප්‍රතිශතයක් අන්තර්ගතව පවතින්නේ දිරාපත් වන ශාක හා සත්ත්ව කොටස් වේ. එම ප්‍රමාණය 85% කි. නගර සභාව මඟින් එක්රැස් කරනු ලබන ඝණ අපද්‍රව්‍යයන්ගේ දිරාපත් වන ද්‍රව්‍ය තෝරා, කප්පරතොට ප්‍රදේශයේ පිහිටි අක්කර 17 ක් වන නගර සභාව සතු භූමිය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය කප්පරතොට කලපුව ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලබන බැවින්, කලපුවෙහි ජලය මෙන්ම සංචාරක ආකර්ෂණයක් සහිත මුහුදු වෙරළෙහි ජලයද දූෂණය කිරීමට හේතුවී ඇත.

වැලිගම නගරය තුල එක්රැස් වන ඝණ අපද්‍රව්‍යගේ දිරාපත් නොවන ද්‍රව්‍යයන්ගේ ප්‍රතිශතය 10% කි. ඒවායේ ඇති ප්ලාස්ටික්, වීදුරු වැනි ද්‍රව්‍ය අළෙවි කිරිම සිදුකරන අතර, ඉතිරි වන කොටස් ප්‍රතිචක්‍රීකරණය කරනු ලබයි. ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි 10% ක පමණ ප්‍රමාණය ඝණ අපද්‍රව්‍ය පාරිසරික සංවේදී ප්‍රදේශයකට බැහැර කරනු ලබන අතර, එය අහිතකර පාරිසරික බලපෑම් ඇතිවීමට හේතුවන ක්‍රියාවලියකි. එබැවින්, ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ඝණ අපද්‍රව්‍ය සනීපාරක්ෂක භූමි පිරවුම් ක්‍රමය යටතේ බහාලීම සඳහා දැනට හඳුනාගෙන ඇති වාලිමවුන්ට් කර්මාන්ත පුරයේ ඉදිකිරීමට යෝජිත බිම් පිරවුම් ව්‍යාපෘති භූමිය වෙත යොමු කිරිම සුදුසුය. එම භූමිය ඡායාරූප අංක 30 මගින් පෙන්වා ඇත.

**ඡායාරූප 30 : යෝජිත බිම් පිරවුම් ව්‍යාපෘති භූමිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය.

## 6.4 ආර්ථික සංවර්ධන උපක්‍රම

වැලිගම නගරය වර්ග කිලෝ මීටර් 8 ක පමණ අරීය ප්‍රදේශයකට දෛනික සේවා සපයන අතර, කොළඹ තංගල්ල වැල්ලවාය ප්‍රධාන මාර්ගය, මුහුදුබඩ දුම්රිය මාර්ගය සහ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය ඔස්සේ මනා ප්‍රවේශකත්වයක් සපයා තිබීම නගරයේ ආර්ථික වර්ධනය කෙරෙහි බලපා ඇත. නගරයේ කාර්යභාරය සලකා බැලීමේදී වාණිජ, මූල්‍ය හා අධ්‍යාපන අංශවල සේවා පහසුකම් ලබාගැනීම සඳහා 2030 වසර වන විට දෛනිකව නගරයට 100,000කට අධික ජන සංඛ්‍යාවක් පැමිණෙන බව ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණ වලට අනුව තහවුරු වේ.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ රැකියා නියුක්තිය 2011 වසරේදී 5,721 ක් වී ඇති අතර, 2017 වසර වන විට එය 6,545 දක්වා 14.4% කින් වර්ධනය වී ඇත. 2011 වර්ෂයේ 7,940 ක් පමණ වූ සේවා වියුක්තිය 2017 වර්ෂය වන විට 4,008 දක්වා 49.5% කින් අඩු වී ඇත. මේ සඳහා ප්‍රධාන දායකත්වය සපයා ඇත්තේ සංචාරක කර්මාන්තය බව සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් හඳුනාගන්නා ලදි. දැනට වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පවත්නා හෝටල් සහ ආගන්තුක නිවාසවල සේවය කරන සේවකයින් පිළිබඳ තොරතුරු අංක 10 වගුව මගින් දක්වා ඇත.

වගු අංක 10 : වැලිගම නගර සභා බල ප්‍රදේශයේ සංචාරක ආයතනවල රැකියා නියුක්තිය

| ආයතන භාවිතය | සංඛ්‍යාව | | සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2012 | 2017 | 2012 | 2017 |
| හෝටල් | 07 | 20 | 42 | 1,906 |
| ලැගුම්හල් | 04 | 34 | 07 | 95 |
| ආගන්තුක නිවාස | 09 | 25 | 19 | 65 |
| තානායම | 01 | 01 | 04 | 04 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය.

ඉහත වගුවට අනුව, 2012 වසරේ 72ක් වූ සේවා නියුක්තිය 2017 වසර වන විට 2,070 දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව, සංචාරක ක්ෂේත්‍රයේ රැකියා නියුක්තියේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන බැවින්, පවතින රැකියා වියුක්තිය අවම කිරීමට සංචාරක, ධීවර හා වාණිජ කටයුතු සංවර්ධනය කිරීම සුදුසුය. ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කිරීමට යෝජිතය.

උපාය මාර්ග 1

නගර මධ්‍ය ප්‍රදේශය සියළු පහසුකම් සහිත වාණිජ ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම හා දුම්රිය පොල හා බස් නැවතුම්පොල ඒකාබද්ධ කර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඇති කිරීම.

උපාය මාර්ග 2

වෙරළ තීරයේ පවතින සම්පත් ප්‍රශස්ථ භාවිතයට යොමු කිරීම සඳහා අදියර 4 ක් යටතේ වෙරළ තීරය සංවර්ධනය කිරීම සහ දැනට රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා යොදාගෙන ඇති පැලැන ප්‍රදේශය එම ක්‍රීඩාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සහිතව සංවර්ධනය කිරීම.

උපාය මාර්ග 3

කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය හා නාරා ආයතනය පිහිටි භූමිය සංචාරක කටයුතු ප්‍රවර්ධන කලාපයක් ලෙස හදුනාගෙන සැලසුම්ගත සංවර්ධනයක් කරා යොමු කිරීම.

උපාය මාර්ග 4

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා රිටි පන්න ධීවර කර්මාන්තය යොදා ගැනීම. මේ සඳහා කප්පරතොට හා පරණ කඩේ ප්‍රදේශය සුදුසුය.

### 6.4.1 ආර්ථික සැලැස්ම

වැලිගම වෙරළ තීරයේ පවතින වක්‍ර ස්වභාවය සහ මද රළ සහිත ස්වභාවය රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාව සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබන බැවින් දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා වැලිගම ප්‍රදේශයට සංකේන්ද්‍රණය වීමේ ප්‍රවනතාවයක් ඇත. දැනට නගරයට පැමිණෙන සංචාරකයින්හට අවශ්‍ය පහසුකම් නගරය තුළ සපයා නොමැති බැවින් සංචාරකයින්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරිම සඳහා අවශ්‍ය සියළුම පහසුකම් සහිත වාණිජ මධ්‍යස්ථානයක් නගර මධ්‍ය ප්‍රදේශයේ ඉදිකිරිම.

තවද, නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්හට තොරතුරු ලබාගැනීම සඳහා අවශ්‍ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන බස් නැවතුම් පොළ, දුම්රිය පොළ වැනි සුදුසු ස්ථානවල ස්ථාපිත කිරිම.

ධීවර හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා දැනට පවත්නා උද්‍යාන ක්‍රීඩා පිටි හා විවෘත ප්‍රදේශ ක්‍රමවත් සැලැස්මකට අනුව සංවර්ධනය කිරීම.


වෙරළ කලාපය දෙස් විදෙස් සංචාරකයින්හට අවශ්‍ය සියළුම විවේක හා විනෝද කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථා සපයන ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇත. ඒ යටතේ වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය අදියර 04කින් සිදුකිරිමට යෝජිත අතර, එහි I අදියර යටතේ මාළු වෙළඳසැල් 16 ක් ඉදිකිරිම හා රථවාහන නැවතුම් ස්ථාන සැපයීමට සැලසුම් සකස් කරන ලදි. ඒ අනුව, මාළු වෙළඳසැල් ඉදිකිරිම නිමකර ඇති අතර, භූ දර්ශන කටයුතු ද නිම වෙමින් පවතී. ඡායාරූප අංක 31 මගින් එය දක්වා ඇත. ව්‍යාපෘතියේ අදියර II යටතේ ළමා උද්‍යානය සංවර්ධනය කිරිම, රථ වාහන නැවතුම් ස්ථාන සඳහා ඉඩකඩ වෙන්කිරිම හා රුක් රෝපණය කිරිම ප්‍රධාන කාර්යයන් වන අතර, දැනට ළමා උද්‍යානය ඉදිකර භූ දර්ශන කටයුතු නිමකර ඇත. රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, ආපන ශාලා ඉදිකිරීම සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා මුර කුටියක් ඉදිකිරිම III අදියර යටතේ සිදුකිරිමට යෝජිතය. එම ස්ථානයේ ඉදිකිරීමට යෝජිත ආපනශාලා ඉදිකල යුතු ආකාරය රූප සටහන් අංක 10 මගින් පෙන්වා ඇත. අදියර IV යටතේ ආපන ශාලාවක් සහ නැරඹුම් මධ්‍යස්ථානයක් ඉදිකිරිමට යෝජිත අතර, රථවාහන නැවතුම් ස්ථාන සැපයීම ද මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත කාර්යයක් වේ. වැලිගම වෙරළ උද්‍යානය සංවර්ධනය කිරිම සඳහා සකස් කරන ලද සැලැස්ම අංක 11 රූප සටහන මඟින් දක්වා ඇත.

**ඡායාරූප 31 : වෙරළ සංවර්ධන ව්‍යාපෘතියේ අදියර I යටතේ ඉදිකර ඇති මාළු වළෙඳ සැල්**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

**රූප සටහන් අංක 10 : වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර යටතේ ඉදිකිරීමට යෝජිත ආපන ශාලාවල ඉදිරි පෙනුම**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය.

රූපසටහන් අංක 11 : වැලිගම වෙරළ උද්‍යානය





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

### 6.4.2 සංචාරක සැලැස්ම

දැනට ඌණ භාවිතයේ පවතින කප්පරතොට නාරා ආයතනය පිහිටි භූමිය සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත අතර, කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන කලාපයක් ලෙසත්, කප්පරතොට රාස්සමූණ කන්ද නැරඹුම් මධ්‍යස්ථානයක් ලෙසත් සංවර්ධනය කිරිමට යෝජිතය.

මේ වන විට වැලිගම නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා යොදාගෙන ඇති කප්පරතොට කලපුව ප්‍රදේශයේ පවත්නා පාරිසරික සංවේදීතාවය ක්‍රමයෙන් අඩු වෙමින් පවතින අතර, එය කප්පරතොට කලපුවේ පවතින ජෛව විවිධත්වයට මහත් තර්ජනයක් වී ඇත. එම ගැටළුව නිරාකරණය කිරිම සඳහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මහා මාතර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගෙන ඇති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකර කප්පරතොට කලපුව ප්‍රදේශය පාරිසරික සංචාරක කටයුතු සඳහා යොමුකිරිම තුළින් සංචාරකයින් සඳහා අවශ්‍ය පාරිසරික සංචාරක කටයුතු සඳහා ඉඩකඩ ලබාදීමට සැලසුම් කර ඇත. මෙම ප්‍රදේශය ඉතා නිසසල පරිසරයක පිහිටි බැවින් සුන්දර කුඩා නිවාස ඉදිකිරිමට යෝජිත අතර, ඒ සඳහා දේශීය අමුද්‍රව්‍ය බහුලව යොදාගැනීමට අපේක්ෂා කෙරේ. යෝජිත ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද සංකල්පිත සැලැස්ම පහත රූප සටහන් අංක 12 හි දක්වා ඇත.

**රූප සටහන් අංක 12 : කප්පරතොට කලපුව සංවර්ධන ව්‍යාපෘතිය**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

කප්පරතොට ජැටිය ආශ්‍රිත ප්‍රදේශය ඉතා මනරම් පරිසරයක පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ දැනට භූමිය පිහිටා ඇති ආකාරයට කප්පරතොට ජැටිය දෙසට මුහුණලා ඇති නාරා ආයතනයට අයත් භූමිය ස්වභාවික පිහිණුම් තටාක සහ ඊට අවශ්‍ය සියළුම උපාංග සහිතව සංවර්ධනය කිරිමට යෝජිතය. ඒ සඳහා සකස් කරන ලද සංකල්පිත සැලැස්ම රූප සටහන් අංක 13 හි දක්වා ඇත.

**රූප සටහන් අංක 13 : කප්පරතොට නාරා ආයතනය සතු භූමිය (සංකල්පිත සැලැස්ම)**






මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය,2018

වැලිගම ප්‍රදේශය අතීතයේ සිට රිටි පන්න ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් උසුලා තිබෙන බැවින් එය සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා යොදාගත හැක. සංචාරකයින්හට රිටිපන්න ධීවර කර්මාන්තය තුළින් මාළු බැම සඳහා අවස්ථාව උදාකරදීම තුළින් අමතර ආදායමක් උපයා ගත හැකි අතර, සංචාරකයින් හට නව අත්දැකීම් අත්විදීමට ද අවස්ථාව සැලසේ. රිටිපන්න ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා කප්පරතොට ප්‍රදේශය සහ පරණ කඩේ ප්‍රදේශය හඳුනාගෙන ඇත.

කප්පරතොට ජැටියට මුහුණලා පිහිටා ඇති උස් භූමියෙහි වැලිගම තානායම පිහිටා ඇත. එහෙත් මෙම භූමිය තුල පවතින ගොඩනැගිලි මේ වන විට නිසි නඩත්තුවක් නොමැතිව ගරා වැටුනු ස්වභාවයෙන් පවතී. මෙම භූමියට ඉදිරිපසින් අභිනවයෙන් ඉදිකරන ලද කප්පරතොට ජැටිය මෙහි ඇති දර්ශනීයත්වය තව තවත් වර්ධනය කිරිමට හේතු වී ඇත. එබැවින් වැලිගම නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වන  සංචාරක පාරාදීසය ලෙස සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සහිත ස්ථානයක් නිර්මාණය කිරිමේ හැකියාව ඇත.

## 6.5 තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම.

වැලිගම නගර සභා බල ප්‍රදේශය වැලිගම බොක්ක ආශ්‍රිතව වෙරළ කලාපයේ පිහිටා ඇති ඉහළ සංවේදීතාවයකින් යුත් ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය තුල ඉහළ ජෛව විවිධත්වයක් ඇති කප්පරතොට කලපුව, තෙත් බිම් සහ වගුරු වලින් සමන්විත බැවින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කිරීමට යෝජිතය.

### 6.5.1 සංරක්ෂණ ප්‍රදේශ සැලැස්ම - තෙත්බිම්

#### 6.5.1.1 වැලිගම නගර සභා බල ප්‍රදේශයෙහි තෙත්බිම් වර්ගීකරණය

01. අභ්‍යන්තර ස්වභාවික මිරිදිය තෙත් බිම්
    උදා: ගංගා, වගුරු බිම්

02. මිරිදිය සහ ලවණ ජලය සහිත තෙත්බිම්
    උදා: කලපු, කඩොලාන

03. මිනිසා විසින් නිර්මිත තෙත් බිම්
    උදා: කුඹුරු, මෑතකාලීනව පුරන් වූ කුඹුරු බිම්

#### 6.5.1.2 තෙත්බිම් කලාපීකරණය

(අ.) තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය
(ආ.) විශේෂ කුඹුරු වගා කලාපය

(අ.) තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැදවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස පැවතගෙන යායුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

(ආ.) විශේෂ කුඹුරු වගා කලාපය

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය,ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

තෙත්බිම් කලාප සඳහා අනුමත භාවිතයන් පහත පරිදි වේ. (සිතියම් අංක 23 - වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා වන තෙත්බිම් කලාපීකරණ සැලැස්ම 2019 -2030, ඇමුණුම් අංක 02 - කලාප සඳහා වූ මාර්ගෝපදේශයන්)

### 6.5.1.3 තෙත්බිම් කලාප සදහා අනුමත භාවිතයන්

**I. තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය**

අ. ස්වභාවික පරිසරය සංරක්ෂණය වන පරිදි සකස් කරන ලද ස්වභාවික උද්‍යාන

ආ. පරිසර හිතකාමී අවන්හල්

ඇ. කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන

ඈ. එලිමහන් ශරීර සුවතා ස්ථාන / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන

ඉ. තෙත්බිම් කෞතුකාගාර

ඊ. පරිසර සංචාරක පහසුකම් ( කුළුණු මත ඉදිවූ කබානා ආදිය )

උ. තේමා උයන් ( පරිසර සංරක්ෂණය සමඟ කල හැකි )

ඌ. ස්වභාවිකත්වය මත පදනම් වූ විවේක විනෝද කටයුතු

ඍ. විවෘත තෘණ භූමිවල ස්වභාවය නොවෙනස් වන ආකාරයට ක්‍රීඩාවේ යෙදීම

ඎ. සම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ යෙදීම.;

එ. මල් එකතු කිරීම

ඒ. ජලාශ්‍රිත ගමනාගමනය ( ආරක්ෂාකාරීව අන්තර්ග්‍රහණය කර ක්‍රියාත්මක කල හැකි නම් )

ඔ. ගව පට්ටි පාලනය ( වෙනත් සත්ව පාලන හැර )

ඕ. අලංකාර තෙත් බිම් පවත්වාගෙනයාම.

ක. ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති

ඛ. නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර ආරක්ෂණ ඉදිකිරීම


ග. පරිසර හිතකාමී කෘෂි කර්මාන්තය.

**තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපයේ ඉදිකරන සියලු ඉදිකිරීම් කුළුණු මත ඉදිවිය යුතුය.**

**II. විශේෂ කුඹුරු කලාපය**

ගොවිජන සංවර්ධන පනතට සහ චක්‍රලේඛ අංක 19/2018 ට අනුකූල වන අනුමත භාවිතයන් පමණක් සිදු කල හැකිය.

**සිතියම් අංක 23 : තෙත්බිම් කලාපීකරණ සැලැස්ම 2030**



### 6.5.2 භූදර්ශන කළමනාකරණ සැලැස්ම 2019 - 2030

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ භූදර්ශන සැලැස්ම සැකසීමේදී පහත සඳහන් ප්‍රදේශ විධිමත් භූ දර්ශන සැලසුම් අනුව ප්‍රතිනිර්මාණය කල යුතු බව හඳුනාගන්නා ලදී.

1. වැලිගම වෙරළ උද්‍යානය (කප්පරතොට සිට පැලැන දක්වා)
2. කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය හා හරිත මංතීරු සංවර්ධනය කිරීම
3. සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය

එම එක් එක් ස්ථාන වලට අදාල දැනට පවතින තත්ත්වය දැක්වෙන ඡායාරූපය සහ එම ස්ථාන භූදර්ශන සැලසුම් කල යුතු ආකාරය පිලිබඳ දළ සටහන හා ඡායාරූප අංක 01 සිට 03 දක්වා ඇමුණුම් අංක 03 යටතේ දක්වා ඇත.

### 6.5.3 ආපදා අවම කිරීමේ සැලැස්ම 2019 - 2030

වර්ග කිලෝමීටර් 5.43 කින් සමන් විත වැලිගම නගර සභා බල ප්‍රදේශයෙහි වර්ෂ 2016 වන විට ජනගහනය 23,228 වන අතර පුරෝකථන ජනගහනය වර්ෂ 2030 වන විට 26,643 කි.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ වාර්තා වන ආපදා ලෙස ගංවතුර සහ සුනාමි ව්‍යසනය හැඳින්විය හැකිය. මෙම ව්‍යසන වල බලපෑමට ලක්වූ ප්‍රදේශ සිතියම් අංක 24 යටතේ දක්වා ඇත.

ගංවතුර ආපදා තත්ත්වය ඇතිවූ ප්‍රදේශ ලෙස පහත සඳහන් ග්‍රාම නිළධාරී කොට්ඨාශ හැඳින්විය හැකිය.

i. වල්ලිවෙල නැගෙනහිර
ii. වල්ලිවෙල දකුණ
iii. හෙට්ටිවීදිය
iv. කොහුණුගමුව
v. කප්පරතොට උතුර
vi. පැලැන බටහිර

2004 වර්ෂයේදී ඇතිවූ සුනාමි ව්‍යසනයේදී වැලිගම නගර සභා බල ප්‍රදේශයේ බලපෑමට ලක්වූ ආකාරය පහත පරිදි දැක්විය හැකිය.

සුනාමි ව්‍යසනය සිදුවූ මුළු බිම් ප්‍රමාණය - 33%

ව්‍යසනයට ලක්වූ ජනගහනය - 34%

ජීවිත හානි සංඛ්‍යාව - 446

සුනාමි ව්‍යසනය සිදුවූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ පහත දැක්විය හැකිය.

i. පැලැන බටහිර
ii. ගල්බොක්ක නැගෙනහිර
iii. අළුත් වීදිය
iv. පරණ කඩේ
v. කප්පරතොට දකුණ
vi. කප්පරතොට උතුර
vii. වල්ලිවෙල බටහිර

**1. සුනාමි ව්‍යසනයට ලක්වූ ප්‍රදේශයන් සඳහා යෝජනා කල හැකි ක්‍රමෝපායන්**

1.1. කඩොලාන වගා ව්‍යාප්ත කිරීම.

1.2. විවේක හා විනෝද පහසුකම් සඳහා වෙරළ තීරය වෙන් කිරීම

**2. අනුමත භාවිතයන්**

2.1. මාළු ගොඩබෑමේ ස්ථාන

2.2. විවෘත ප්‍රදේශ


2.3. වෙරළ උද්‍යාන

**ගංවතුර ආපදාවට ලක්වූ ප්‍රදේශයන් සඳහා යෝජනා කල හැකි ක්‍රමෝපායන්**

වැලිගම නගර සහා බල ප්‍රදේශයේ ගංවතුර තර්ජන නොමැති අතර අධික වර්ෂාව නිසා ඇතිවන බලපෑම දැකිය හැකිය. වර්ෂාව මඟින් ප්‍රදේශයට ලැබෙන ජලය බැසයාමට සුදුසු ක්‍රමවේදයක් නොමැති කමින් මෙම ආපදා තත්ත්වය ඇතිවේ.

ඒ අනුව වැසි ජලය බැසයාම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැකසීම මඟින් මෙම ආපදාව අවම කරගත හැකිය.

සිතියම් අංක 24 : ආපදාවට ලක්වූ ප්‍රදේශ - 2018



### 6.5.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 2019 - 2030

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව ජනගහනය 1,000 කට හෙක්ටයාර් 1.4 ක් අවම වශයෙන් ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතුය. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ 2016 වසර වන විට ජනගහනය 23,228 ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 26,643 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 37.30 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

**වැලිගම නගර සභා බල ප්‍රදේශයේ වර්තමානයේ පවතින ඍජු සහ වක්‍ර විනෝද පහසුකම්**

ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. ඍජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම්

i. ක්‍රීඩා කිරීම
ii. පිහිනීම
iii. දිවීම
iv. ඇවිදීම
v. බෝට්ටු පැදීම
vi. සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම
vii. මුහුදු රළ මත ලිස්සා යාම නිදසුන් ලෙස දැක්විය හැක.

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයක් සපුරාගත හැකි ස්ථාන ඉතා සීමිත අතර එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 11 යටතේ සහ ඇමුණුම 03 යටතේ දක්වා ඇත.

**වගු අංක 11 - වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ඍජු විනෝද පහසුකම් සපුරාගත හැකි උද්‍යාන වර්ග**

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| 1. | ඉතා කුඩා උද්‍යාන<br>Pocket Parks (EPP) | 0.19 |
| 2. | වෙරළ උද්‍යානය<br>Beach Park (EBP) | 1.29 |
| 3. | අසල උද්‍යාන<br>Local Parks (ELP) | 2.02 |
| | **එකතුව** | **3.5** |

වගු අංක 11 සඳහන් තොරතුරු වලට අනුව වැලිගම නගර සභා බල ප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර් 3.50 ක් විවෘත භූමි ලෙස ඇත. වර්තමාන ජනගහනය මත 23,228 සඳහා සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස හෙක්ටයාර් 32.51 වෙන්ව තිබිය යුතුය. නමුත් වගු අංක 11 අනුව වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි වැලිගම නගර සභා බල ප්‍රදේශයේ නොමැති අතර දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

i. මහජන පුස්තකාල සංඛ්‍යාව - 01

ii. කියවීම් ශාලා - 03

iii. සිනමා ශාලා - 01

2030 වන විට ජනගහනය 26,643 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 37.30 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. වැලිගම නගර සභා බල ප්‍රදේශයේ 2019 – 2030 වසර සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම සඳහා වන සිතියම, සිතියම් අංක 25 යටතේ සහ වගු අංක 12 යටතේ සහ ඇමුණුම 05 හි දක්වා ඇත.

**වගු අංක 12 - වැලිගම නගර සභා බල ප්‍රදේශය : යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 2019 - 2030**

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (ha) |
|---|---|---|
| 1. | **යෝජිත ප්‍රජා උද්‍යානය**<br>**Proposed Community Parks (PCP)** | 3.09 |
| 2. | **යෝජිත රේඛීය උද්‍යාන**<br>**Proposed Linear Park (PLiP)** | 31.56 |
| 3. | **යෝජිත වෙරළ උද්‍යානය**<br>**Proposed Beach Park (PBP)** | 3.31 |
| | **එකතුව** | **37.96** |
| 4. | **පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය** | 3.5 |
| | **සමස්ත එකතුව** | **41.46** |

**1. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද අවකාශිය සැලැස්ම සඳහා උපාය මාර්ග**

1.1. දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කලහැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ක්‍රීඩා සහ ඍජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනිම, වර්ගීකරණය කිරීම, ප්‍රතිසංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.

1.2. ප්‍රදේශයේ පවතින සංවර්ධනය කල යුතු සියළු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.

1.3. ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් ඍජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.

1.4. සමාජීය විනෝද කටයුතු පහසුකම්

දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතා වලට ගැලපෙන ප්‍රමිතියෙන් යුතු නිවාඩු නිකේතන, බංගලා, සංචාරක හෝටල්, ස්ථාපිත කිරීම.

**2. රේඛිය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම**

ප්‍රදේශයේ පවතින ඇළ, ඔය සහ ගඟ රක්ෂිතයන් රේඛිය උද්‍යාන ලෙස සංවර්ධනය කල යුතු අතරම එය ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැලසීමට මෙන්ම ගංවතුර උවදුර පවතින ප්‍රදේශවල එය පාලනයට යොදා ගත හැකිය.

**3. 2030 වන විට උෂ්ණත්වය අඩු කිරීමේ ක්‍රමවේදය**

3.1. සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.

3.2. සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුල ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.

3.3. ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබදව දැනුවත් කිරීම.

3.4. යෝජිත සියළුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම

3.5. බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොලවට උරාගන්නා ක්‍රමවේදයන්ට පමණක් සීමා කිරීම (interlocking) සහ ඒවා ද ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.

3.6. පවතින ක්‍රීඩාභූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මූලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

**4. යෝජිත රුක් රෝපන ප්‍රදේශ**

i. පරණ ගාළු පාර

ii. හෙට්ටිවීදිය පාර

iii. හෙට්ටිවීදිය මංසන්ධිය සිට අකුරැස්ස පාර දක්වා

iv. බුහාරි මස්ජිත් පාර

**යෝජිත ගස්වර්ග**

i. *Peltophorum inerme* - කහ මාර

ii. *Delonix regia* - මැයි මාර

iii. *Murraya paniculata* - ඇට්ටේරියා

iv. *Barringtonia asiatica* - මූදිල්ලා

v. *Thespesia populnea* - ගංසූරිය

vi. *Pisonia alba* - වාතබංග

**සිතියම් අංක 25 : යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම - 2030**



## 6.6 සංස්කෘතික හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපක්‍රම

වැලිගම නගර සහා බල ප්‍රදේශය තුළ ඓතිහාසික හා ගෘහ නිර්මාණාත්මක වශයෙන් වැදගත් ස්ථාන හා ගොඩනැගිලි කිහිපයක් පිහිටා ඇත. ඒ අතුරින් අග්‍රබෝධි විහාරය බෞද්ධාගමිකයින්ට වැදගත්වේ. මෙම විහාරයෙන් සොයා ගන්නා ලද අෂ්ඨමංගල පුරාවස්තුව අනුරාධපුර යුගයට අයත්වන අතර, එය අටමගල නමින් හඳුන්වා ඇත. තිරුවානා ගලින් නිම කරන ලද මෙය දැනට ලංකාවේ පවතින ඉතාම අලංකාර නොකැඩුනු එකම අටමගල ලෙස "මාතර" නම් ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. එම අග්‍රබෝධි විහාරය දෙවන පැතිස් රජ සමයේ ඉදිකරන ලද්දකි. තවද, ඓතිහාසික වටිනාකමකින් යුක්ත අවලෝදීතේශ්වර නාථ බෝධිසතුන්ගේ ප්‍රතිමාව වැලිගම කුෂ්ඨරාජගල ප්‍රදේශයේ ඉදිකර ඇති අතර, එම ස්ථානවල ඓතිහාසික වටිනාකම පිළිබඳව සංචාරකයන් දැනුවත් කිරීම තුලින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකිය. ඒ අනුව, කුඹල්ගම හන්දියේ සිට පැරණි ගාලු පාර ඔස්සේ කුෂ්ටරාජගල ප්‍රදේශයටත් එතැන් සිට අග්‍රබෝධි විහාරය ආශ්‍රිත ප්‍රදේශය හරහා තිරුවැල කෝවිල දක්වා පයින් ඇවිද යා හැකි සෙවණ ගස් සහිත මංතීරුවක් ප්‍රවාහන සැලැස්මේ දක්වා ඇත. වැලිගම ප්‍රදේශයේ ඓතිහාසික හා ගෘහනිර්මාණාත්මක වටිනාකමක් ඇති ස්ථාන වන අග්‍රබෝධි විහාරය, කුෂ්ඨරාජගල, මෙතෝදිස්ත දේවස්ථානය, තිරුවැල කෝවිල සිතියම් අංක 26 හි දක්වා ඇත.


## 6.7 ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම

වැලිගම සංවර්ධන සැලැස්මෙහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සකස් කරන ලද සංවර්ධන ව්‍යාපෘති සිතියම් අංක 27 හා වගු අංක 13 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 26 : කළමනාකරණය කිරීමට යෝජිත පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි**



**සිතියම් අංක 27 : යෝජිත සංවර්ධන ව්‍යාපෘති**



### 6.7.1. උපාය මාර්ගික ව්‍යාපෘති

**වගු අංක 13 : උපාය මාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 01 | ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (අග්‍රබෝධි ඇළ, යාං ඕඩය ඇළ, පොල් කඳන් ඇළ, ගුඩ්ෂෙඩ් ඇළ, පුංචි ඇළ) | නගර මධ්‍ය ප්‍රදේශය | නගර සභාව<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - | භාණ්ඩාගාර අරමුදල් | 200.00 | නගර සභාව<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ✓ | | |
| 02 | මළා පවාහන හා අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය ඉදිකිරීම | කප්පරතොට | පෞද්ගලික | අක්කර 5.0 | භාණ්ඩාගාර අරමුදල් | 500.0 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය | ✓ | | |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 03 | වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය<br>• කප්පරතොට සිට පැලැන දක්වා වෙරළ තීරය සංවර්ධනය කිරීම. | ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය හා මුහුදු වෙරළ ආශ්‍රිත බිම් තීරුව | මාර්ග සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අක් 15 | භාණ්ඩාගාර අරමුදල් | 100.0 | මාර්ග සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | ✓ | | |
| 04 | වැලිගම නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය<br>• බස් නැවතුම් පොල හා වාණිජ සංකීර්ණය ඉදිකිරිම.<br>• දුම්රිය පොල ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය.<br>• රථවාහන නැවතුම් ස්ථාන ඉදිකිරිම.<br>• නිල නිවාස සහ නවාතැන් පහසුකම් සැපයීම. | නගර මධ්‍ය ප්‍රදේශය | දුම්රිය දෙපාර්තමේන්තුව<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>නගර සභාව<br>සමූපකාර දෙපාර්තමේන්තුව<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>පෞද්ගලික | අක් 03 පමණ | භාණ්ඩාගාර අරමුදල් | 863.0 | මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>දුම්රිය දෙපාර්තමේන්තුව | | ✓ | |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 05 | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය<br>මංතීරු දෙකක් දක්වා පුළුල් කල යුතු මාර්ග<br>(කොළඹ - මාතර ප්‍රධාන මාර්ගය, වැලිගම - අකුරැස්ස මාර්ගය, වජිරඥාන මාවත, බොරාල පාර, කප්පරතොට වටරවුම පාර, මැද මාවත)<br>මංතීරු 4 දක්වා පුළුල් කල යුතු මාර්ග<br>(පලල්ල පාර, බණ්ඩාරනායක මාවත, කුඩලුමුල්ල පාර) | නගර සභා බල ප්‍රදේශය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව | - | භාණ්ඩාගාර අරමුදල් | 2500.0 | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>විදුලිබල මණ්ඩලය<br>ශ්‍රී ලංකා ටෙලිකොම්<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | ✓ | ✓ |
| 06 | කප්පරතොට සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම<br>දෙස් විදෙස් සංචාරකයින් සඳහා විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධනය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම | කප්පරතොට ජැටිය ආශ්‍රිත ප්‍රදේශය | නාරා ආයතනය | අක්කර 05.0 | භාණ්ඩාගාර අරමුදල් | 1500.0 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාරා ආයතනය | | ✓ | |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 07 | කාර්යාල සංකීරණ ව්‍යාපෘතිය | සුමංගල විදුහල ඉදිරිපිට | අධ්‍යාපන අමාත්‍යාංශය | අක් 01 | භාණ්ඩාගාර අරමුදල් | 80.0 | වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | ✓ | |
| 08 | කප්පරතොට කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය | කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය | නගර සභාව | අක් 17 රූ.0 පර්. 39.78 | භාණ්ඩාගාර අරමුදල් | 300.0 | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය | | ✓ | |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රු. මි. | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 09 | කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීම හා හරිත මංතීරු සංවර්ධන ව්‍යාපෘතිය | වැලිගම වෙරළ උද්‍යානයේ සිට පැරණි ගාලුපාර ඔස්සේ තිරුවාල කෝවිල දක්වා කොටස | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | | භාණ්ඩාගාර අරමුදල් | 75.0 | වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | | ✓ | |
| 10 | සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය | අග්‍රබෝධි පන්සල අසල | රජයේ | අක් 01 | භාණ්ඩාගාර අරමුදල් | 200.0 | වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | ✓ | |
| 11 | නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීම | කප්පරතොට | පෞද්ගලික | රූඩ 2.0 | භාණ්ඩාගාර අරමුදල් | 50.0 | වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | | | ✓ |

**ව්‍යාපෘති අංක 01**

| **ව්‍යාපෘති මාතෘකාව** | ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති |
|---|---|
| **ව්‍යාපෘතිය** | යාං ඕඩය ඇළ, අග්‍රබෝධි ඇළ, ගුඩ්ෂෙඩ් ඇළ, පුංචි ඇළ සහ පොල් කදන් ඇළ සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘති යෝජනාව** | පවත්නා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය |

**ව්‍යාපෘති ස්ථානය**

<table>
<tr><td rowspan="2">ස්ථානය</td><td>පළාත</td><td>දකුණු පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>මාතර</td></tr>
<tr><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>වැලිගම</td><td>පළාත් පාලන ආයතනය</td><td>වැලිගම න.ස.</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">යාං ඕඩය ඇළ හා අග්‍රබෝධි ඇළ - ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය<br>පොල් කදන් ඇළ, ගුඩ් ෂෙඩ් ඇළ, පුංචි ඇළ - අකුරැස්ස වැලිගම ප්‍රධාන මාර්ගය</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4"></td></tr>
<tr><td>යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)</td><td colspan="4"><br>අග්‍රබෝධි ඇළ අග්‍රබෝධි පන්සල ආසන්න ප්‍රදේශයෙන් ආරම්භ වී වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතියේ මාළු වෙළඳ සැල් ඉදිකර ඇති මහා වීදිය ප්‍රදේශය ආසන්නයෙන් මුහුදට ගලා බසින අතර, යාංඕඩය ඇළ රල මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා හඳුනාගෙන ඇති පැලැන ප්‍රදේශයෙන් මුහුදට ගලා බසී. පොල් කදන් ඇළ නගර මධ්‍ය ප්‍රදේශයේ පිහිටා ඇති අතර, අකුරැස්ස මාර්ගය ආසන්නයෙන් පොල් අතු මෝදර ගගට එක්වේ. ගුඩ්ෂෙඩ් ඇළ නගර මධ්‍යයේ දුම්රිය මාර්ගයට සමාන්තරව ගොස් බුහාරි මජ්ජිඩ් මාවත හරහා ගොස් මුස්ලිම් පල්ලිය අසලින් පොල්අතුමෝදර ගඟට එකතුවේ. එමෙන්ම, පුංචි ඇළ අකුරැස්ස ප්‍රධාන මාර්ගය හරහා ගොස් පොල්අතුමෝදර ගඟට එකතු වේ.</td></tr>
</table>

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | | | ✓ | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු | • නගරයේ ජීවත්වන වැසියන්, දෙස් විදෙස් සංචාරකයන් හට ජීවත්වීමට සුදුසු නිර්මිත පරිසරයක් ඇති කිරීම.<br>• නගර අලංකරණය ඇති කිරීම. |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | වැලිගම නගරය දකුණු පළාතේ ඇති සංචාරක නගර අතරින් රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා සුදුසු පරිසරයක් සහිත සංචාරක නගරයක් වේ. මෙහි දෛනික සංසරණ ජනගහනය 50,000 කට අධිකවේ. මෙම ප්‍රදේශයේ වැසි ජලය ගලායාම සඳහා ඉදිකර ඇති කාණු පද්ධතිය තුලින් නිසි පරිදි ජලය ගලායාමක් සිදු නොවීම හේතුවෙන් නගරයේ ජීවත්වන වැසියන් හා නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හට අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇත. එමෙන්ම මෙම ඇළ මාර්ග දුගඳ හමන තත්ත්වයකට පත්වී ඇත. තවද, මෙම ඇළ මාර්ග සංචාරක කටයුතු සඳහා යොදාගෙන ඇති වෙරළ තීර වෙත යොමු කර ඇති බැවින් මුහුදු ජලය අපවිත්‍ර වීමේ තර්ජනයට මුහුන පා ඇත. එබැවින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඇළ මාර්ග පද්ධතිය කඩිනමින් සංවර්ධනය කල යුතුව ඇත. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | **කෙටි කාලීන (වසර 1)** | ✓ | **මධ්‍ය කාලීන (වසර 1-3)** | | **දිගු කාලීන (වසර 3)** | | **මුළු ඇස්තමේන්තුගත පිරිවැය** | මි.200 |
| **මූල්‍ය ක්‍රමය** | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

**ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)**



i. දැනට පවත්නා දූෂිත ජලය මුළුමනින්ම ඉවත් කිරීම.
ii. අනවසරයෙන් සම්බන්ධකර ඇති, අප ජලය ගලා එන නල මාර්ග අවහිර කිරීම.
iii. වැසි ජලය පමණක් ගලා යාමට හැකිවන සේ ඇළ මාර්ග සංවර්ධනය කිරීම.
iv. නගර සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධීකරණයෙන් පසු විපරම් ඒකකයක් ඇති කිරීම.

**වර්තමාන තත්ත්වය**

නාගරික සංවර්ධන හා අඩු ආදායම් ව්‍යාපෘතිය මගින් වැසි ජලය ගලායාම සඳහා යාංඔඩය ඇළ, අග්‍රබෝධි ඇළ, ගුඩ්ෂෙඩ් ඇළ, පුංචි ඇළ සහ පොල්කදන් ඇළ සංවර්ධනය කර ඇතත්, එම ඇළ මාර්ග ඔස්සේ නිසි පරිදි ජලය ගලායාමක් සිදු නොවන බැවින්, වසර පුරාම ජලය එක්රැස්වී දුඟද හමන තත්ත්වයට පත්වී ඇත. තවද මෙම ඇළ මාර්ග සංවර්ධනය කිරීමේදී ආරක්ෂිත උපක්‍රම අනුගමනය කර නොමැති බැවින් ජනතාවගේ ආරක්ෂාවට ගැටළු මතුවී ඇත.

**ව්‍යාපෘති පිරිවැය**

| දළ ඇස්තමේන්තුව | රු. මිලියන 200.0 |
|---|---|

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>පහත්බිම් සංවර්ධන මණ්ඩලය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

## ව්‍යාපෘති අංක 02

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | යෝජිත මළාපවාහන හා අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය |
| **ව්‍යාපෘතිය** | යෝජිත මළාපවාහන හා අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | ❖ මළාපවාහන හා අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය ඉදිකිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

<table>
<tr><td rowspan="2">ස්ථානය</td><td>පළාත</td><td>දකුණු පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>මාතර</td></tr>
<tr><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>වැලිගම</td><td>පළාත් පාලන ආයතනය</td><td>වැලිගම නගර සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">කප්පරතොට වටරවුම් පාර</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4"></td></tr>
<tr><td>යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)</td><td colspan="4"> මෙම ඉඩමට යාබද ධීවර, සංචාරක හා නේවාසික කටයුතු පවතින අතර, යෝජිත ඉඩම එම ඉඩම්වලට වඩා මීටර් 3 – 4 උසකින් යුක්ත මුඩු ඉඩමක් ලෙස පිහිටා ඇත.</td></tr>
</table>

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | | | | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | • ජලාපවාහන හා මලාපවාහන ගැටළු සඳහා විසඳුම් ලබාදීම.<br>• නාගරික ජනතාව සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් බිහි කිරීම.<br>• සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම නාගරික ප්‍රදේශයේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 49% බිම් ප්‍රමාණයක් මුහුදු මට්ටමේ පිහිටා ඇති අතර, එම ප්‍රදේශයේ නාගරික හර ප්‍රදේශයද ඇතුලත්ව ඇත. එමෙන්ම ප්‍රදේශයේ සමස්ථ නිවාස ප්‍රමාණයෙන් 68% ප්‍රමාණයක් මෙම ප්‍රදේශය තුල ස්ථාපිත වී ඇති අතර, වැලිගම නාගරික ප්‍රදේශය තුල තරු පංතියේ සංචාරක හෝටල්, ආගන්තුක නිවාස, ලැගුම්හල් හා තානායම් ඇතුළු සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ගොඩනැගිලි 40 ක් පමණ පිහිටා ඇත. ඉන් 95% ක් මුහුදු මට්ටමේ පිහිටි ප්‍රදේශයට අයත් වේ. නාගරික ප්‍රදේශය මුහුදු මට්ටමේ පවතින ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහලින් පිහිටා තිබෙන බැවින් වැසි සමයේදී වැසිකිලි උතුරායාම හා අපජලය වසර පුරාම දැනට ඉදිකර ඇති කාණු පද්ධතිය තුල ඒකරාශීවීම හේතුවෙන් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට සෞඛ්‍ය ආරක්ෂිත පරිසරයක් නොමැතිවීමේ ගැටළුව හා මෙම දූෂිත ජලය වෙරළ තීරයට එකතුවීම හේතුවෙන් සංචාරක කර්මාන්තයද දැඩි අවධානමකට මුහුණ පා ඇත. ඒ අනුව, සංචාරක කර්මාන්තයේ තිරසර පැවැත්ම හා නාගරික ජනතාව සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ගොඩනැගීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඇත. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | ✓ | රජයේ | | වෙනත් | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | **කෙටි කාලීන (වසර 1)** | | **මධ්‍ය කාලීන (වසර 1-3)** | ✓ | **දිගු කාලීන (වසර 3)** | | **මුළු ඇස්තමේන්තුගත පිරිවැය** | මි. 7000.0 |

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාර අරමුදල් හා ආසියානු බැංකු ආධාර මුදල් | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම.** | **ජලය**<br><br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | **විදුලිය**<br><br>ලංකා විදුලිබල මණ්ඩලය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | සංචාරක කලාපය | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|

**පවත්නා තත්ත්වය**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන ඇති ව්‍යාපෘති භූමිය අක්කර 7 පමණ විශාල හිස් ඉඩමක් වශයෙන් පවතින භූමියක් වන අතර, ඉඩමේ පිහිටීම මුහුදට ආසන්න මුහුදු මට්ටමේ සිට මීටර් 4 – 5 උසකින් යුක්ත භූමියක් වේ.

මේ වන විට මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු බැංකු ආධාර මත ක්‍රියාත්මක උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන යටතේ රු.මි. 500 ක මුදලක් වෙන්වී ඇත.

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| මලාපවාහන පද්ධතිය ඉදිකිරීම | 500.0 |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| මලාපවාහන පද්ධතිය ඉදිකිරීම | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |

**ව්‍යාපෘති අංක 03**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | කප්පරතොට සිට පැලැන දක්වා වෙරළ තීරය සංවර්ධනය කිරිම. |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය | වැලිගම | පළාත් පාලන ආයතනය | වැලිගම න.ස. |
| **මායිම්** | **උතුරු** | **නැගෙනහිර** | **දකුණු** | **බටහිර** |
| | නව ගාලු පාර | බේ වීව් හෝටලය | මුහුද | මුස්ලිම් පල්ලිය |
| **ප්‍රවේශය** | ගාල්ල - මාතර නව ප්‍රධාන මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  යෝජිත ව්‍යාපෘති භූමිය ගාල්ල මාතර නව මාර්ගයට සහ වෙරළ තීරයට මැදිව පිහිටා ඇත. | | | |


**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් | |
| | ✓ | | ✓ | | | | ✓ | |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | | |
| **ව්‍යාපෘතියේ අරමුණු** | ආකර්ශනීය වෙරළ තීරයක් ඇති කිරීම, විවේක හා විනෝද කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම. රල මත ලිස්සායාමේ ක්‍රීඩාව වැඩි දියුණු කිරීම, ආපනශාලා පහසුකම් සැපයීම, දෙස් විදෙස් සංචාරකයින්ගේ ජීවිත ආරක්ෂාව තහවුරු කිරීම. | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම මුහුදු ප්‍රදේශය වැලිගම බොක්ක ආශ්‍රිතව පිහිටා ඇති බැවින් මද රළ සහිත ස්වභාවයකින් යුක්ත වේ. මෙම පිහිටීම රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාව සඳහා මනා ප්‍රවේශකත්වයක් සපයනු ලබන අතර, නොගැඹුරු මුහුදු ප්‍රදේශය රිටිපන්න ධීවර කර්මාන්තය සඳහා යොදාගෙන ඇත. මෙම ප්‍රදේශයේ වෙසෙන ජනතාවගෙන් 25% කගේ ප්‍රධාන ආදායම් මාර්ගය ධීවර කර්මාන්තය වන අතර, 28% ක් පමණ සංචාරක කටයුතු සඳහා යොමුවී ඇත. එහෙත්, වර්තමානය වන විට මෙම ප්‍රදේශය ධීවර කර්මාන්තයට මෙන්ම සංචාරක කර්මාන්තයටද බහුලව යොදාගනු ලබන බැවින් වෙරළ කලාපය අවිධිමත් සංවර්ධනයකට යොමු වීම ප්‍රදේශයේ වෙසෙන ජනතාව අතර සමාජමය ගැටළු උද්ගතවීමට හේතු වී ඇත. තවද, මෙම අවිධිමත් සංවර්ධනය වෙරළ තීරය අපවිත්‍රවීමට ප්‍රභල සාධකයක් වී ඇති බැවින් ධීවර හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ කලාපය සැලසුම්ගත සංවර්ධනයක් වෙත යොමු කල යුතුව ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | | | |
| **මැනුම් සැලැස්මේ විස්තර** | **පිඹුරු අංකය** | **මිනින්දෝරුවරයාගේ නම** | **දිනය** | **ඉඩම් ප්‍රමාණය** | | |
| | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

<table>
<tr><td>ව්‍යාපෘති කාලය</td><td>කෙටි කාලීන (වසර 1)</td><td>✓</td><td>මධ්‍ය කාලීන (වසර 1-3)</td><td></td><td>දිගු කාලීන (වසර 3)</td><td></td><td>මුළු ඇස්තමේන්තුගත පිරිවැය</td><td>මි. 60.0</td></tr>
<tr><td>මූල්‍ය ක්‍රමය</td><td colspan="8">වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර අරමුදල්</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)</td><td colspan="8"><br>1. රල මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම.<br>2. ජීවිත ආරක්ෂක නැරඹුම් මැදිරියක් ඉදිකිරීම.<br>3. වෙරළ තීරය හැඩගැසීම කිරීම.<br>4. දෙස් විදෙස් සංචාරකයින් සඳහා අපරව්‍යුහ පහසුකම් සැපයීම.<br>5. රථ වාහන නැවතුම් ඉඩකඩ සැපයීම.</td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="5">ජලය<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය</td><td colspan="3">විදුලිය<br><br>ලංකා විදුලි බල මණ්ඩලය</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත.</td><td></td><td></td><td>සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">සංචාරක කලාපය</td><td colspan="2">කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="9">වර්තමාන තත්ත්වය<br><br>වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය අදියර 4 ක් යටතේ සංවර්ධනය කිරීමට යෝජිත අතර, වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ අදියර 2 ක් සංවර්ධනය කර ඇති අතර, ඉතිරි අදියර 2 සංවර්ධනය කල යුතුව ඇත.</td></tr>
<tr><td colspan="9">පවත්නා තත්ත්වය<br><br>ඡායාරූපය</td></tr>
</table>





**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| මුළු වියදම (අදියර III සහ IV) | 100.0 |

**අදාල වන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>සමුද්‍රීය පරිසර අධිකාරිය |

| | | |
|---|---|---|
| | | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| වෙරළ සංරක්ෂණ හා වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම<br><br>වැලිගම නගර සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පනවා ඇති රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ සංචාරක කලාපයට අයත් රෙගුලාසි.<br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය.<br><br>මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය. |

## ව්‍යාපෘති අංක 04

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | වැලිගම නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | ❖ දුම්රිය පොල ප්‍රතිසංවර්ධන කිරීම.<br>❖ දුම්රිය නිල නිවාස ඉදිකිරීම.<br>❖ බස් නැවතුම් පොල හා වාණිජ සංකීර්ණය ඉදිකිරීම.<br>❖ රථවාහන නැවතුම් ස්ථාන ඉදිකිරීම.<br>❖ දෙස් විදෙස් සංචාරකයින් සඳහා කාමර පහසුකම් සැපයීම.<br>❖ භූ දර්ශන කටයුතු. |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම න.ස.** |
| **මායිම්** | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | දුම්රිය මාර්ගය | බුහාරි මස්ජිඩ් පාර | මුහුදු වෙරළ | අකුරැස්ස පාර හා දුම්රිය පොල පාර |
| **ප්‍රවේශය** | පැරණි ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  නගර මධ්‍ය ප්‍රදේශයේ අකුරැස්ස පාර, බුහාරි මස්ජිඩ් මාවත සහ මුහුදු වෙරළට මායිම්ව ස්ථානගතවී ඇත. පවත්නා භූමි පරිභෝග රටාව අනුව මෙම ප්‍රදේශයේ දෙමහල් වාණිජ ගොඩනැගිලි හා ගබඩා සහ කාර්යාල පිහිටා ඇත. ඊට අමතරව දුම්රිය පොලට ආසන්නව වැලිගම පොලීසිය සහ තැපැල් කාර්යාලය පිහිටා ඇත. අනෙකුත් ප්‍රදේශ පුද්ගලික කඩ කාමර වලින් සමන්විත වේ. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් | |
| | | ✓ | ✓ | | | ✓ | ✓ | |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | | |
| ව්‍යාපෘතියේ අරමුණු | • ඌන භාවිතයේ පවතින වාණිජ ගොඩනැගිලි ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම හා නගර මධ්‍ය ප්‍රදේශය තුල සැලසුම්ගත සංවර්ධනයක් ඇති කරමින් සංචාරක ආකර්ශණයක් සහිත නගරයක් ඇති කිරීම.<br>• සංචාරක හා වාණිජ කටයුතු ප්‍රවර්ධනයට අවස්ථාව සැලසීම.<br>• දෙස් විදෙස් සංචාරකයින්ගේ සියළු පහසුකම් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.<br>• නගරයේ රථ වාහන තදබදය අඩු කිරීම හා විධිමත් ප්‍රවාහන ක්‍රමයක් ඇති කිරීම. | | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | වැලිගම නගර මධ්‍ය ප්‍රදේශයේ පිහිටි ඉහල වාණිජ වටිනාකමක් සහිත භූමි ඌන භාවිතයේ පවතින අතර, එම ඉඩම රජය සතුවේ. මෙම ප්‍රදේශයේ නාගරික හර ප්‍රදේශය වන අතර, මෙහි වැලිගම දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පොල පිහිටා ඇත. දුම්රිය ස්ථානය ඉතා පැරණි බැවින් මගීන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ ගැටළුවක් පවතී.<br>තවද, ඉතා කුඩා භූමි ප්‍රමාණයක බස් නැවතුම්පල ස්ථාන ගතකර ඇති බැවින් ප්‍රධාන මාර්ග දෙපස දුර ගමන් සේවා බස් රථ නවතා තැබීම හේතුවෙන් නගර මධ්‍යයෙහි අධික වාහන තදබදයක් දැකිය හැකිය. නගරයේ පවත්නා කඩ සාප්පු අවිධිමත් සංවර්ධනයකට යොමු වී ඇති බැවින් නගර අලංකරණ සඳහා ගැටළුවක් වී ඇත. එමෙන්ම, නගරය කරා එන ජනතාවගේ රථවාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බැවින්, රථවාහන නැවතුම් ස්ථාන සඳහා සුදුසු ප්‍රදේශ වෙන් කල යුතුය. දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සහිත ආකර්ශනීය නගරයක් ලෙස සංවර්ධන කල යුතුව ඇත. | | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | ✓ | රජයේ | ✓ | වෙනත් | |
| හිමිකම පිළිබඳ විස්තර | දුම්රිය දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, නගර සභාව, සමූපකාර දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා පෞද්ගලික | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මි.1863.0 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

<table>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)</td><td colspan="8"></td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="5">ජලය<br>දැනට ජලය සපයා ඇත.</td><td colspan="3">විදුලිය<br>සපයා ඇත.</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත.</td><td></td><td colspan="2">සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">වාණිජ කලාපය</td><td colspan="2">කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td></tr>
<tr><td colspan="9">වර්තමාන තත්ත්වය (මැනීම සමග විස්තර කරන්න)</td></tr>
<tr><td colspan="9">පවත්නා තත්ත්වය<br>ඡායාරූපය<br> </td></tr>
</table>

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| දුම්රිය පොළ ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 30.0 |
| පොදු රථගාල ඉදිකිරිම. | 6.0 |
| දුම්රිය නිල නිවාස සංකීර්ණය ඉදිකිරිම. | 27.0 |
| වාණිජ සංකීර්ණය ඉදිකිරීම | 800.0 |
| එකතුව | 863.0 |

**අනුමත කරන ආයතන**

| **ක්‍රියාකාරිත්වය** | **අදාල වන ආයතන** | **වගකිව යුතු ආයතන** |
|---|---|---|
| බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>දුම්රිය දෙපාර්තමේන්තුව<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>විදුලිබල මණ්ඩලය<br>ශ්‍රී ලංකා ටෙලිකොම් | මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>නගර සභාව |

| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | **නීති රීති** | **මාර්ගෝපදේශ** |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ වාණිජ කලාපයට අයත් රෙගුලාසි.<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය.<br>මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය.<br>දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශය.<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය.<br>මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය. |

**ව්‍යාපෘති අංක 05 - මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය**

(ගාල්ල මාතර නව ගාලුපාර, පරණ ගාලුපාර, ජය මාවත, බණ්ඩාරනායක පාර, කෝට්ටගොඩ පාර, කුඩලුමුල්ල පාර (නව විකල්ප මාර්ගය), මහ නැවියා පාර, කප්පරතොට පාර, වැලිගම - අකුරැස්ස පාර, බුහාරි මස්ජිඩ් පාර, බොරාල පාර, පලල්ල පාර, බටවල පාර, හෙට්ටිවීදිය පාර, මැද මාවත, අකුරැස්ස - මාතර පාර

## ව්‍යාපෘති අංක 06

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කප්පරතොට සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරිම. |
| **ව්‍යාපෘතිය** | කප්පරතොට නාරා ආයතනය ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරිම. |

### ව්‍යාපෘති ස්ථානය

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම න.ස.** |
| **මායිම්** | **උතුරු** | **නැගෙනහිර** | **දකුණු** | **බටහිර** |
| | පොදු මාර්ගය | මුහුද | මුහුද | සංචාරක හෝටලය (Fisherman Bay) |
| **ප්‍රවේශය** | කප්පරතොට පාර (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.) | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  ඉඩම් පරිහරණ සැලැස්මට අනුව කප්පරතොට ජැටිය ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කටයුතු සහ ධීවර කටයුතු සඳහා යෙදවී ඇත. | | | |


**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් | |
| | | ✓ | ✓ | | | | ✓ | |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | | |
| ව්‍යාපෘතියේ අරමුණු | නාගරික ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම<br>සංචාරකයන්ට විවේක හා විනෝද කටයුතු පහසුකම් සැපයීම | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | වැලිගම නාගරික ප්‍රදේශය තුල තරු පංතියේ හෝටල් ආගන්තුක නිවාස, ලැගුම්හල් ආපනශාලා විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර, වාර්ෂිකව දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් සර්ෆින් ක්‍රීඩාව සහ ආකර්ශනීය වෙරළ තීරය හේතුවෙන් පැමිණෙමින් සිටී. ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන්හට විවේක හා විනෝද කටයුතු සඳහා අවශ්‍යවන ක්‍රියාකාරකම් සහිත ස්ථාන නොමැති කමින් සංචාරකයින් වැලිගම නගරයේ රැඳෙන සංචාරක රාත්‍රීන් ගණන අඩුවීමක් දක්නට ඇත. ඒ අනුව, මෙම ප්‍රදේශය සංචාරකයින් සඳහා විවේක හා විනෝද කටයුතු සඳහා ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | | |
| හිමිකම පිළිබඳ විස්තර | නාරා ආයතනය | | | | | | |
| මැනුම් සැලැස්මේ විස්තර | පිඹුරු අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩම් ප්‍රමාණය | | | |
| | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මි. 1500.0 |
| මූල්‍ය ක්‍රමය | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග) |  | 1. ස්වාභාවික පිහිණුම් තටාකයක් ඉදිකිරීම<br>2. රාත්‍රී උත්සව (Night Beach Show) පැවැත්වීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>3. නැරඹුම් ස්ථාන සංවර්ධනය, මුහුදු කෞතුකාගාරය, මින් මැදුරක් ඉදිකිරීම. | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම.** | **ජලය**<br>ජාතික ජල සම්පාදන දෙපාර්තමේන්තුව | | | | | **විදුලිය**<br>ලංකා විදුලි බල මණ්ඩලය | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| **කලාපය** | සංචාරක කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | |
| **වර්තමාන තත්ත්වය (මැනීම සමග විස්තර කරන්න)** | | | | | | | | |
| **පවත්නා තත්ත්වය** | | | | | | | | |



දර්ශනීය මුහුදු වෙරළට යාබද අක්කර 5 ක පමණ භූමි භාගය මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අයවැය

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| සංචාරක පහසුකම් මධ්‍යස්ථානය | 1500.0 |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| සංචාරක පහසුකම් මධ්‍යස්ථානය | නාරා ආයතනය<br>වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>ධීවර දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ සංචාරක කලාපයට අයත් රෙගුලාසි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි. |

**ව්‍යාපෘති අංක 07**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කාර්යාල සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | කාර්යාල සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | කාර්යාල සංකීර්ණය ඉදිකිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | වැලිගම | **පළාත් පාලන ආයතනය** | වැලිගම නගර සභාව |
| **මායිම්** | **උතුරු** | **නැගෙනහිර** | **දකුණු** | **බටහිර** |
| | පෞද්ගලික ඉඩම් | පෞද්ගලික ඉඩම | පරණ ගාලු පාර | සුමංගල පාර |
| **ප්‍රවේශය** | සුමංගල මාවත | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | ඉඩම් පරිහරණ සැලැස්මට අනුව දැනට මෙම ඉඩමෙහි කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය පවත්වාගෙන යනු ලැබේ. අවට ප්‍රදේශය පාසල්, බැංකු සහ රජයේ කාර්යාල සඳහා වෙන්වී ඇත. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | | | | | | |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | නගරයේ විසිරී පවතින කාර්යාල එක් තැනකට ඒකරාශී කර නගරයේ ජනතාව සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම. |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම නගර සභා සීමාව වර්ග කි.මී. 5.33 කි. නාගරික ප්‍රදේශයට සේවා ලබා ගැනීමට දෙනිපිටිය, ඉමදුව, කනන්කෙ යන නේවාසික ප්‍රදේශ වලින් වැලිගම නාගරය වෙත ජනතාව ඒකරාශී වේ. කාර්යාල තැන තැන විසිරී පැවතීම නිසා සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | අධ්‍යාපන අමාත්‍යාංශය | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 150.0 |
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |  | | | | | | | |

| | | |
|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | ජලය<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | විදුලිය<br>ලංකා විදුලිබල මණ්ඩලය |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ | ඔව් | | නැත. | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පද්ධතිය | | | | | | |

පවත්නා තත්ත්වය

ඡායාරූපය



ව්‍යාපෘති අයවැය

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| කාර්යාල සංකීර්ණය | රු.මි. 150.0 |

අනුමත කරන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| කාර්යාල සංකීර්ණය | වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ මිශ්‍ර නේවාසික කලාපයට අයත් රෙගුලාසි.<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි. |

**ව්‍යාපෘති අංක 08**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | වැලිගම පාරිසරික සංචාරක ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | කප්පරතොට කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය. |
| **ව්‍යාපෘති යෝජනාව** | පාරිසරික සංචාරක ව්‍යාපෘතිය |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම න.ස.** |
| **මායිම්** | **උතුරු** | **නැගෙනහිර** | **දකුණු** | **බටහිර** |
| | දුම්රිය මාර්ගය<br>මයිලගහකොරටුව ඉඩම<br>මහඉරවල්ල ඉඩම<br>එරමුදුගහවත්ත ඉඩම | සංඝානන්ද මාවත මහා මාර්ගය | ගාල්ල - මාතර මහා මාර්ගය | පොල්ගහ කොරටුව ඉඩම |
| **ප්‍රවේශය** | ගාල්ල මාතර මහා මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය සඳහා ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයෙන් ප්‍රවේශය ලබන අතර, ඉඩම් පරිහරණ සැලැස්මට අනුව අවට පිහිටි ඉඩම් නේවාසික භාවිතය සඳහා යෙදවී ඇත. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | ✓ | | ✓ | | | | | ✓ |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | | | ✓ |
| ව්‍යාපෘතියේ අරමුණු | කප්පරතොට කලපුව ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් ඇතිවන පරිදි සංරක්ෂණය කිරීම | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | වැලිගම නගර සහා බල ප්‍රදේශයේ පිහිටි කප්පරතොට කලපුව ආශ්‍රිත ප්‍රදේශය ඉහළ පාරිසරික සංවේදීතාවයකින් යුත් ප්‍රදේශයකි. මේ වන විට කලපුව ආශ්‍රිත ප්‍රදේශය වැලිගම නගර සභාවේ කසල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා යොදාගෙන ඇත. නගරයේ එක් රැස් වන සියළු කැලි කසල මෙම ප්‍රදේශයටම බැහැර කරනු ලබන අතර, කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා මෙම කැලි කසල වලින් කොටසක් යොදා ගන්නා අතර, ඉතිරි කොටස් කලපුවට බැහැර කිරීම හේතුවෙන් මෙම පාරිසරික සංවේදී ප්‍රදේශයට විශාල තර්ජනයක් වී ඇත. එබැවින්, මෙම කලපුව ආශ්‍රිත ප්‍රදේශය මනා ලෙස භූ දර්ශනය කර පාරිසරික සංචාරක ව්‍යාපෘතිය සඳහා යොමු කිරීම අවශ්‍යතාවය වී ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | | |
| හිමිකම පිළිබඳ විස්තර | වැලිගම නගර සභාව | | | | | | |
| මැනුම් සැලැස්මේ විස්තර | පිඹුරු අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩම් ප්‍රමාණය | | | |
| | 7574 | න. විජේවීර මහතා | 2008.10.28 සිට 2008.12.28 | අක්.17 | රූඩ්.0 | පර්. 39.78 | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මි. 300.0 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග) |   1. කලපු ප්‍රදේශයට බැහැර කරන ලද අපද්‍රව්‍ය ඉවත්කර පැරණි කලපුව පැවති | | | | | | | |

<table>
<tr><td></td><td colspan="8">ප්‍රදේශය කලපුව වශයෙන් පවත්වා ගැනීම.<br>2. සංචාරක ආකර්ශනයක් සහිත උද්‍යානයක් ඉදිකිරීම.<br>3. කඩොලාන ශාක ආවරණය වැඩි කිරීම.<br>4. එන්ජින් රහිත විනෝද කටයුතු සඳහා භාවිතා කරන බෝට්ටු සේවාවක් ඇති කිරීම.<br>5. දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආපනශාලා හා සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් රථ වාහන නැවතුම් පහසුකම් ඇති කිරීම.</td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="4">ජලය<br>ජල අවශ්‍යතාවය දැනට ක්‍රියාත්මක වන මහා මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් සැපයීමට යෝජිතය.</td><td colspan="4">විදුලිය<br>විදුලි බල මණ්ඩලය</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td><td></td><td>සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">තෙත් බිම් හා සංරක්ෂිත කලාපය</td><td colspan="2">කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="9">පවත්නා තත්ත්වය<br>ඡායාරූපය<br> </td></tr>
</table>

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය | 300.0 |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| කප්පරතොට කලපුව සංවර්ධනය | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>විදුලි බල මණ්ඩලය<br>ජාතික ජලාපවාහන මණ්ඩලය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ පාරිසරික සංවේදී කලාපයට අයත් රෙගුලාසි.<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති හා රෙගුලාසි.<br>මාර්ග සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි.<br>මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි. |

ව්‍යාපෘති අංක 09

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීම හා හරිත මංතීරු සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘතිය** | කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය හා හරිත මංතීරු සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘති යෝජනාව** | පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික ස්ථාන සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම න.ස.** |
| **ප්‍රවේශය** | පරණ ගාලු පාර | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** | <br>කුෂ්ඨරාජගල පිහිටි ප්‍රදේශය නේවාසික කලාපය තුල පිහිටා ඇති අතර, පැරණි ගාලුපාරෙන් ප්‍රවේශය සපයනු ලබයි. වැලිගම නගර සභාවට අයත් සේනානායක ක්‍රීඩාංගනය ඉදිරිපස මෙම භූමිය පිහිටා ඇත. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | ✓ | | ✓ | | ✓ | | | ✓ |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | | ✓ | සමාජ | | ✓ |
| ව්‍යාපෘතියේ අරමුණු | ඓතිහාසික වැදගත්කමක් ඇති අවලෝකේශ්වර පිළිමය සහ කුෂ්ඨරාජගල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම.<br>ඓතිහාසික ස්ථාන සම්බන්ධකර හරිත මංතීරුවක් ඇති කිරීම. | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | ඓතිහාසික වැදගත්කමක් ඇති කුෂ්ඨරාජගල, අග්‍රබෝධි විහාරය වැනි ස්ථාන වැලිගම සංචාරක කලාපයේ සිට පයින් ගමන් කර නැරඹීමට තරම් ආසන්නයේ පැවතියද දෙස් විදෙස් සංචාරකයින් මෙම ස්ථාන නැරඹීමට යොමු නොවන තත්වයක් ඇත. ඒ අනුව, වැලිගම සංචාරක කලාපයේ සිට මෙම ස්ථාන සඳහා පහසුවෙන් පයින් ගමන් කිරීමේ හැකියාව ඇතිවන පරිදි සෙවන ගස් සඳහා හරිත මංතීරු ඉදිකිරීම තුලින් කුෂ්ඨරාජගල හා අග්‍රබෝධි විහාරය වැලිගම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍යතාවය ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| ව්‍යාපෘති විස්තරය | <br><br>වැලිගම වෙරළ උද්‍යානයේ සිට පැරණි ගාලුපාර ඔස්සේ සේනානායක ක්‍රීඩාපිටිය ඉදිරිපස කොටස දක්වා සෙවන ගස් සහිතව හරිත මංතීරු ඉදිකිරීම. | | | | | |
| හිමිකම පිළිබඳ විස්තර | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>නගර සභාව | | | | | |

## ව්‍යාපෘති විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන | | මධ්‍ය කාලීන | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු. මි. 75.0 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| | සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| කලාපය | නේවාසික කලාපය | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | | |
| පවත්නා තත්ත්වය | | | | | | | | |

ඡායාරූපය



## ව්‍යාපෘති අයවැය

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය | 75.0 |

## අනුමත කරන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය සහ හරිත මංතීරු සංවර්ධනය | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය |

**ව්‍යාපෘති අංක 10**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘතිය** | සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘති යෝජනාව** | සේනානායක ක්‍රීඩාපිටිය පහසුකම් සහිතව සංවර්ධනය කිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම න.ස.** |
| **ප්‍රවේශය** | අග්‍රබෝධි පාර | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | වැලිගම නගර සහා බල ප්‍රදේශයේ පවත්නා සේනානායක ක්‍රීඩාංගනය නේවාසික කලාපය තුල පිහිටා ඇති අතර, පැරණි ගාලුපාර සහ අග්‍රබෝධි මාවතෙන් ප්‍රවේශකත්වය ලබාගනී. කුෂ්ඨරාජගල සහ අග්‍රබෝධී විහාරස්ථානය මෙම ක්‍රීඩාංගනයට යාබදව පිහිටා ඇත. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | | | ✓ | | | | | ✓ |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | | | ✓ |
| ව්‍යාපෘතියේ අරමුණු | විවෘත, විවේක හා විනෝද පහසුකම් සැපයීම | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | වැලිගම නගර සහා බල ප්‍රදේශයේ පවතින පාසල් 9 න් පාසල් 7ක් සඳහා ක්‍රීඩාපිටි පහසුකම් නොමැති අතර, සියළු පාසල්වල ක්‍රීඩා උත්සව සහ අනෙකුත් ක්‍රීඩා උත්සව සඳහා යොදා ගැනීමට ඇති එකම ක්‍රීඩාභූමිය සේනානායක ක්‍රීඩාභූමිය වේ. එහෙත් මෙය ක්‍රීඩාමණ්ඩපයක් සහ රථ වාහන නැවතුම් ස්ථාන සහිතව සංවර්ධනය වී නොමැති බැවින් ක්‍රීඩා කටයුතු සඳහා පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා නැරඹීමට පැමිණෙන පුද්ගලයින් අපහසුතාවන්ට ලක්වන බැවින් සැලසුම්ගත සංවර්ධනයක් සඳහා යොමු කිරීමේ අවශ්‍යතාවය ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| හිමිකම පිළිබඳ විස්තර | වැලිගම නගර සභාව | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මි. 200.0 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| යටිතල පහසුකම් ලබා ගැනීම. | ජලය<br><br>සපයා ඇත. | | | | විදුලිය<br><br>සපයා ඇත. | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| කලාපය | නේවාසික කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**පවත්නා තත්ත්වය**

**ඡායාරූපය**



**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය | 200.0 |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| සේනානායක ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම | වැලිගම නගර සභාව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය |

## 6.7.2 වගකිව යුතු ආයතනික රාමුව

| සැලැස්ම | උප සැලැස්ම හා ක්‍රියාත්මක ව්‍යාපෘති | අදාල ආයතන | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වගකිවයුතු අංශයන් |
|---|---|---|---|
| අපරව්‍යූහ සංවර්ධන සැලැස්ම | **1.** ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>පහත්බිම් සංවර්ධන මණ්ඩලය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | **2.** යෝජිත මළාපවාහන හා අපජලය පිරිපහදු කිරීමේ පද්ධතිය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| | **3.** මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | **4.** සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම | වැලිගම නගර සභාව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම | **1.** වැලිගම නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>දුම්රිය දෙපාර්තමේන්තුව<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>විදුලිබල මණ්ඩලය<br>ශ්‍රී ලංකා ටෙලිකොම් | මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>නගර සභාව |
| | **2.** කාර්යාල සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වැලිගම නගර සභාව |

| සැලැස්ම | උප සැලැස්ම හා ක්‍රියාත්මක ව්‍යාපෘති | අදාල ආයතන | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වගකිවයුතු අංශයන් |
|---|---|---|---|
| **සංචාරක සංවර්ධන සැලැස්ම** | **1.** වැලිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>වැලිගම නගර සභාව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>සමුද්‍රීය පරිසර අධිකාරිය |
| | **2.** කප්පරතොට සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරිම | නාරා ආයතනය<br>වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>ධීවර දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වැලිගම නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| | **3.** වැලිගම පාරිසරික සංචාරක ව්‍යාපෘතිය | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>විදුලි බල මණ්ඩලය<br>ජාතික ජලාපවාහන මණ්ඩලය | වැලිගම නගර සභාව<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | **4.** කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීම හා හරිත මංතීරු සංවර්ධනය කිරිම | වැලිගම නගර සභාව<br>මාර්ග සංවර්ධන අධිකාරිය.<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැලිගම නගර සභාව<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>නාගරික සංවර්ධන අධිකාරිය |

**ඇමුණුම 01**

2017.12.19 දින පැවති පාර්ශවකරුවන්ගේ රැස්වීමට සහභාගී වූ නිලධාරීන්

| පාර්ශවකරුවන් | තනතුර |
|---|---|
| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිගම** | ප්‍රාදේශීය ලේකම් |
| **නගර සභාව - වැලිගම** | ලේකම්, තාක්ෂණ සේවා නිලධාරී, මහජන සෞඛ්‍ය පරික්ෂක, සංවර්ධන නිලධාරී |
| **ප්‍රාදේශීය සභාව - වැලිගම** | ලේකම්, තාක්ෂණ සේවා නිලධාරී, |
| **ප්‍රාදේශීය සභාව - වැලිගම** | සංවර්ධන නිලධාරී |
| **පුරාවිද්‍යා කාර්යාලය - ගාල්ල** | සහකාර අධ්‍යක්ෂ |
| **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය- මාතර** | ඩිපෝ අධිකාරී |
| සුමංගල බාලිකා විද්‍යාලය - වැලිගම | විදුහල්පති |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය ඉංජිනේරු |
| සංචාරක සංවර්ධන අධිකාරිය | සාමාන්‍යාධිකාරී |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ස්ථානභාර නිලධාරී |
| සමුද්‍රීය පරිසර අධිකාරිය | අධ්‍යක්ෂ ජනරාල් |
| **සිද්ධාර්ථ විද්‍යාලය - වැලිගම** | විදුහල්පති |
| **කලාප අධ්‍යාපන කාර්යාලය - වැලිගම** | අධ්‍යක්ෂ (සැලසුම්) |
| **කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය - වැලිගම** | සහකාර අධ්‍යක්ෂ |
| **රුහුණු විශ්ව විද්‍යාලය - මාතර** | ශිෂ්‍ය - භූගෝල විද්‍යා අධ්‍යනාංශය |
| **මගී ප්‍රවාහන අධිකාරිය - දකුණු පළාත් කාර්යාලය** | සහකාර අධ්‍යක්ෂ |
| **මධ්‍යම පරිසර අධිකාරිය - මාතර** | ප්‍රාදේශීය පරිසර නිලධාරී |
| **වාරිමාර්ග දෙපාර්තමේන්තුව- මාතර** | සහකාර අධ්‍යක්ෂ |
| **පොල් වගා කිරීමේ මණ්ඩලය- මාතර** | පොල් වගා කිරීමේ නිලධාරී |
| **විදුලි බල මණ්ඩලය- මාතර** | විදුලි අධිකාරී |
| **විවිධ සේවා සමුපකාර සමිතිය - වැලිගම** | සභාපති |
| **ගොවිජන සේවා කාර්යාලය - මිරිස්ස** | ගොවිජන සංවර්ධන නිලධාරී |
| **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - මාතර** | සහකාර ඉංජිනේරු |
| **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - වැලිගම** | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| **ජාතික ජල සම්පාදන මණ්ඩලය - මාතර** | ස්ථාන භාර නිලධාරී |
| **මාර්ග සංවර්ධන අධිකාරිය - මාතර** | ප්‍රධාන ඉංජිනේරු |
| **අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - මාතර** | අපනයන කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරී |
| **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය** | භූ විද්‍යාඥ |
| **තැපැල් කාර්යාලය - වැලිගම** | තැපැල් ස්ථානාධිපති |
| **නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල** | අධ්‍යක්ෂ (දකුණු පළාත) |
| **නාගරික සංවර්ධන අධිකාරිය - මාතර** | නියෝජ්‍ය අධ්‍යක්ෂ, සැලසුම් නිලධාරී |
| **ධීවර සමිති - වැලිගම** | සභාපති |
| **සර්ෆින් ක්‍රීඩා පුහුණු කරන්නන්ගේ සමිති** | |
| **පැලැන, කඩේවීදිය, පරණ කඩේ, කප්පරතොට ග්‍රාම නිලධාරී කොට්ඨාශ** | ග්‍රාම නිලධාරී |
| **විදාතා මධ්‍යස්ථානය - වැලිගම** | සම්බන්ධීකාරක |
| **සැලසුම් කණ්ඩායම** | නා. සංවර්ධන අධිකාරිය |

**ඇමුණුම් අංක - 02**

**කලාප සදහා වූ මාර්ගෝපදේශ**

අ. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම් වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු පහත උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

ආ. පහත් බිම්/පුරන් කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ 1990 සැප්තැම්බර් මස 29 වන දින නිකුත් කර ඇති සැලසුම් චක්‍රලේඛ අංක. 13 (12.7, 12.8) ට අනුව පහත උපලේඛනයේ සඳහන් අංක. 01, 03, 04, 06 හා 10 දරණ ආයතන වලින් අනුමැතිය ලබා ගත යුතුයි. එසේම විවිධ පනත් මගින් තෙත් බිම් වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථා වලදී පහත උපලේඛනයේ සඳහන් දරණ ආයතන වලින් සහ අනෙකුත් අදාළ ආයතන වලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය.

ඇ. තෙත් බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ සඳහන් අංක. 03 හා 06 දරණ ආයතන වලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

ඈ. පහත උපලේඛනයේ සඳහන් අංක. 01 දරණ ආයතනයට අයත් තෙත් බිමක් සංවර්ධන කාර්යයක් සඳහා ලබා දෙන නිර්දේශ / අනුමැතිය (අවසන් නිරවුල් සහතිකය) එම සැලසුම් කමිටු තීරණය පරිදි වාර්ෂිකව අළුත් කළ යුතුය.

ඉ. වෙරළ කලාපය තුළ ඇති තෙත් බිම් ආශ්‍රිතව ඕනෑම සංවර්ධන කාර්යයක් සිදු කිරීමට පෙර පහත උපලේඛනයේ සඳහන් අංක. 05, 12 දරණ ආයතනයෙන් නිර්දේශ / අනුමැතිය / බලපත්‍ර ලබා ගත යුතුය.

ඊ. පහත උපලේඛනයේ සඳහන් අංක. 01,02 දරණ ආයතන මගින් ප්‍රකාශිත ඇළ මාර්ග / ජලාශ රක්ෂිත බිම් තීරු පවත්වා ගත යුතුය.

උ. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක ජලාශ්‍රිතව හෝ ජල මාර්ග වල සිදු නොකළ යුතුය.නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශක මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම් වලට හා ගංවතුර ඉසිලුම් ධාරිතාවයන්ට බාධා නොවන ලෙස අනුමත ඉදිකිරීම් පහත උපලේඛනයේ සඳහන් අංක. 01 දරණ ආයතනයෙන් හා අංක. 02 සිට 22 දක්වා ඇති අදාළ ආයතනයන් වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ යුතුය.

ඌ. පාරිසරික සංවේදී වටිනාකම සහිත තෙත් බිම් වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් වන ජීවීන් ඉවත් නොකළ යුතුය.

එ. තෙත් බිම් කලාප වල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.

ඒ. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ (අනෙකුත් බලපෑම් සිදුවන) පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් අදාළ ආයතන වල අනුමැතිය ලබාගත යුතුය.

ඔ. මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න,ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකළ යුතුය.යාන්ත්‍රික බෝට්ටු සඳහා අවසර දී එකී ස්ථාන වල ධීවර අම්පන්න සහ ඉන්ධන සදහා පහත උපලේඛනයේ සඳහන් අංක 03,05,06,12,21,22, ආයතන වල අනුමැතිය ලබාගත යුතුය.

ඕ. තෙත්බිම් පිරවීම සඳහා නිර්දේශ වන උපලේඛනයේ අංක 01 හි සඳහන් ආයතනයේ ප්‍රදේශවල තිරසාර වැසි ජල බැස යාමේ ක්‍රම භාවිතා කල යුතුයි. තෙත්බිම් පිරවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමතය ලබා ගත යුතුය.

ක. පැහැදිලිව හඳුනාගත හැකි භූදර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහල අගයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

ඛ. තෙත් බිම් වල අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

ග. සංවර්ධනකරුවන් විසින් සැලසුම් සකස් කිරීම හා නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

ට. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්‍ෂා කල යුතුය.

ඩ. තෙත් බිම් වලට කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.(ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෛද්‍ය, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය)

න. තෙත්බිම් වලට අපජලය බැහැර නොකළ යුතුය. නමුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයට යටත්ව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.

ත. තෙත්බිම්හි ධීවර කටයුතු මිනිස් ශ්‍රමය භාවිතා කරන ඔරු,බෝට්ටු මගින් පමණක් සිදු කල යුතුය.

**තෙත්බිම් කලාපයන් සම්බන්ධයෙන් සංවර්ධන කටයුතු සිදුකිරීමේදී උපලේඛනයේ සඳහන් ආයතනයන්හි බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රයට කොන්දේසි ලෙස ඇතුලත් කල යුතු අතර එකී කොන්දේසි කඩකිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඩුවම් නියම කිරීමට හේතුවනු ඇත.**

**උපලේඛනය**

01. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව,
02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
03. මධ්‍යම පරිසර අධිකාරිය,
04. නාගරික සංවර්ධන අධිකාරිය,
05. වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව,
06. වැලිගම නගර සභාව ,
07. වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව,
08. වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව,
09. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,
10. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
11. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
12. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.
13. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය.
14. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
15. දකුණු පළාත් සභාව
16. ජල සම්පත් මණ්ඩලය
17. ජල ජීවී සංවර්ධන අධිකාරිය
18. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
19. ශ්‍රී ලංකා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
20. මාර්ග සංවර්ධන අධිකාරිය
21. ධීවර දෙපාර්තමේන්තුව
22. නාවික හමුදාව
23. දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම්

**ඇමුණුම 03**

## 01. වැලිගම වෙරළ උද්‍යානය (කප්පරතොට සිට පැලැන දක්වා)



යෝජිත භූ දර්ශන සැකැස්මට අනුව මෙම ප්‍රදේශය වෙරළ උද්‍යානයක් ලෙස සංවර්ධනය කරන අතර වර්තමානයේ පවතින රළ මත ලිස්සා යාමේ ක්‍රීඩා කිරීමට සේම අනෙකුත් වෙරළාශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ක්‍රමානුකූලව සකස් කිරීම ප්‍රධාන අභිප්‍රාය වේ.

වර්තමාන තත්ත්වය







යෝජිත භූදර්ශන රූපසටහන





## 02. කුෂ්ඨරාජගල ආශ්‍රිත ප්‍රදේශය හා හරිත මංතීරු සංවර්ධනය කිරීම



වර්තමාන තත්ත්වය







යෝජිත භූදර්ශන රූපසටහන



## 03. සේනානායක ක්‍රීඩාපිටිය සංවර්ධනය



සේනානායක ක්‍රීඩා පිටිය සහ ඒ අවට ප්‍රදේශය ක්‍රීඩකයින්ට සහ ප්‍රේක්ෂකයින්ට වඩා ඉඩ පහසුකම් සහිතව මෙන්ම වාහන නැවැත්වීමේ ඉඩ පහසුකම්ද, සහිතව නිර්මාණය කිරීම ප්‍රධාන අභිප්‍රාය වේ.

වර්තමාන තත්ත්වය







යෝජිත භූදර්ශන රූපසටහන









**ඇමුණුම 04**

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන

| **අනු අංකය** | **වර්ගය** | **විවෘත භූමියේ නම** | **ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---|---|---|
| 01. | ELP 01 | සේනානායක ක්‍රීඩාංගන | 2.02 |
| 02. | | **ළමා උද්‍යාන** | |
| | EPP 01 | නගර සභා ළමා උද්‍යානය | 0.10 |
| | EPP 02 | වෙරළ ළමා උද්‍යානය | 0.09 |
| 03. | EBP 01 | වෙරළ උද්‍යානය | 1.29 |
| | | | **එකතුව - 3.50** |

**ඇමුණුම 05**

වැලිගම නගර සභා බල ප්‍රදේශයේ 2019 – 2030 වසර සඳහා යෝජිත සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් සැලැස්ම

| අනු අංකය | වර්ගය | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | යෝජිත භාවිතය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|---|
| 01 | **යෝජිත ප්‍රජා උද්‍යානය<br>Proposed Community Park (PCP)** | | | | |
| | PCP 01 | ක්‍රීඩා පිටිය, හිස් ඉඩම | 3.09 | ප්‍රජා උද්‍යානය | පරණකඩේ |
| 02 | **යෝජිත වෙරළ උද්‍යානය<br>Proposed Beach Park (PBP)** | | | | |
| | PBP 01 | වෙරළ | 2.23 | වෙරළ උද්‍යානය | පරණකඩේ, මහවීදිය, වැල්ලව දකුණ |
| | PBP 02 | වෙරළ | 1.08 | වෙරළ උද්‍යානය | පැලැන බටහිර |
| 03 | **යෝජිත රේඛිය උද්‍යාන<br>Proposed Linear Parks (PLiP)** | | | | |
| | PLiP 01 (පොල්අතුමෝදර ගඟ රක්ෂිතය - 60m) | | 12.80 | රේඛිය උද්‍යාන | |
| | PLiP 02 (දිසාවගේ ඇළ රක්ෂිතය - 60m) | | 2.54 | රේඛිය උද්‍යාන | |
| | PLiP 03 (පොල්කඳන් ඇළ රක්ෂිතය - 20m) | | 7.40 | රේඛිය උද්‍යාන | |
| | PLiP 04 (අග්‍රබෝධි ඇළ රක්ෂිතය - 20m) | | 4.30 | රේඛිය උද්‍යාන | |
| | PLiP 04 (යාන්ඕඩය ඇළ රක්ෂිතය - 20m) | | 4.52 | රේඛිය උද්‍යාන | |
| | **එකතුව හෙක්ටයාර් - 37.96** | | | | |